# නූතන සමාජයට
# බෞද්ධ සංකල්ප

## කර්තෘගේ වෙනත් කෘති

1. සුසුමක අසිරිය
2. උතුම් බුද්ධ ශ්‍රාවක චරිත
3. දිවිමග සනසන අමා දහම
4. විකසිත කුසුම්
5. සූරිය පැහැසර
6. රුහුණේ ධර්ම දේශනා
7. දම්රස කතා

# නූතන සමාජයට බෞද්ධ සංකල්ප

විතාරන්දෙණියේ වජිරවංස
ස්වාමීන් වහන්සේ

ප්‍රථම මුද්‍රණය - 2011
දෙවන මුද්‍රණය - 2014

නූතන සමාජයට බෞද්ධ සංකල්ප

© විතාරන්දෙණියේ වජිරවංස හිමි

ISBN 978-955-30-5641-2

පිටුවැසුම චිත්‍රය:
ප්‍රේම් සූරියවැව

ඇතුළත චිත්‍ර:
සරත් නන්දකුමාර

අක්ෂර සංයෝජනය:
නෙල්කා අබේවික්‍රම

Printed and donated for free distribution by
**The Corporate Body of the Buddha Educational Foundation**
11F., 55 Hang Chow South Road Sec 1, Taipei, Taiwan, R.O.C.
Tel: 886-2-23951198 , Fax: 886-2-23913415
Email: overseas@budaedu.org
Website:http://www.budaedu.org

**This book is strictly for free distribution, it is not to be sold.**
**නොමිලයේ බෙදාදීම පිණිසයි.**

# පිදුම

බුදු දහමින් ලොව දකින්නට

වැර දරන

ලාංකීය ජන සමාජයේ

බෞද්ධ - අබෞද්ධ

සැමට

පිළිගැන් වේ.

# නූතන සමාජයට බෞද්ධ සංකල්ප

පෑනක් හා කඩදාසි කොළයක් තිබූ පමණින් නිර්මාණයක් බිහි නොවේ. නෛසර්ගික ප්‍රතිභාවත්, බහුශ්‍රැත භාවයත්, විවේක බුද්ධියත්, නිර්මාණශීලී චින්තනයත්, එක්තැන්වූ විට නිර්මාණයක් බිහි වේ. එලෙස බිහිවන නිර්මාණ පාඨකයා අතර බොහෝ කලක් පවතියි. අද කොතෙක් නිර්මාණ හා ග්‍රන්ථ බිහිවුණත් එහි අන්තර්ගත කරුණු සමාජයට කෙතරම් වැඩදායක වන්නේදැයි සිතා බැලිය යුතු කරුණකි. කාර්යබහුල නූතන සමාජයට අවශ්‍ය වන්නේ පහසුවෙන් වටහා ගත හැකි එදිනෙදා ජීවිතයට වැඩදායී කරුණු අන්තර්ගත කෘතීන් ය. එහෙයින් නූතන නිර්මාණශීලී ග්‍රන්ථ කතුවරුන් එලෙස ග්‍රන්ථ රචනා කළයුතු කාලයකි මේ.

නූතන සමාජයට බෞද්ධ සංකල්ප නමින් මේ කෘතිය නිර්මාණය කරන පූජ්‍ය විතාරන්දෙණියේ වජිරවංස ස්ථවිරයන් පාඨකයන්ට අමුත්තෙකු නොවේ. මීට පෙර පද්‍ය සහ ගද්‍ය කෘති කිහිපයක් දායාද කොට ඇති උන් වහන්සේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ දුෂ්කර පළාත්වල වැඩ වෙසෙමින් ආගමික, සාමාජික, සංස්කෘතික හා ශාසනික වශයෙන් මහඟු සේවයක් ඉටු කරති. දේශනය, ලේඛනය, භාෂණය පිළිබඳ ප්‍රවීණත්වයට පත්ව ඇති වජිරවංස හිමියන් පුවත්පත් හා විද්‍යුත් මාධ්‍ය ඔස්සේ මුළු රටම හඳුනති.

බුදු රජාණන් වහන්සේ දේශනා කොට ඇති ධර්මය නූතන සමාජයට වඩාත් සමීප ලෙස ඉදිරිපත් කිරීමට මේ කෘතියෙන් කර්තෘ හිමියන් ගෙන ඇති උත්සාහය ඉතාමත් ප්‍රශංසනීයය. බුදු දහමේ දක්වෙන ගැඹුරු සංකල්ප පවා ඉතා සරල ලෙස ඉදිරිපත් කිරීමට කතු හිමියන් සමත් වී ඇත. ගිහි සමාජයට

මෙන්ම පැවිදි සමාජයට ද තම දැනුම හා අවබෝධය පුළුල් කර ගැනීමට මෙහි අන්තර්ගත බෞද්ධ සංකල්ප අතිශය වැදගත් ය. බුදු දහම පිළිබඳව අඩු දැනුමක් ඇති අයට තම දැනුම පුළුල් කර ගැනීමට අදාළ මාතෘකා මෙන්ම ධර්මය පිළිබඳව තුලනාත්මක පර්යේෂණ කරන විද්‍යාර්ථීන්ට වැදගත්වන මාතෘකා කිහිපයක් පිළිබඳව ද මෙම කෘතියෙහි කරුණු අන්තර්ගත වේ. ධර්ම සන්නිවේදනය, ධනාත්මක චින්තනය, සෞන්දර්යය, රාජ්‍ය පාලනය, පුද්ගල පෞරුෂත්වය, මිනිස් වගකීම් ආදී සංකල්ප ඒ අතර ප්‍රධාන ය.

බුදු දහම පිළිබඳ පුද්ගල මනස පුබුදු කිරීම සඳහා තෙරුවන් සරණ, නායකත්වය, අනාගත දැක්ම, මනුෂ්‍යත්වය, නිවන, සමාජ පැවැත්ම, කර්මය, පුනර්භවය, කාන්තා නිදහස, යුග ජීවිතය ආදී සංකල්ප නවතාවයකින් ඉදිරිපත් කිරීමට කතු හිමියන් මේ තුළින් සමත් වී ඇත.

බුදු දහම පිළිබඳ දැනුම සොයා යන පාඨකයන්ටත්, ඒ පිළිබඳ පර්යේෂණයෙහි නියුතු විද්‍යාර්ථීන්ටත්, ජීවිතය නුවණැසින් දැකීමට උත්සාහ දරන්නන්ටත් නිසි මඟ පෙන්වීමක් ලබා දෙන අතර මෙම කෘතිය කවර තරාතිරමේ අයට වුවත් කියවා අවබෝධය ලබාගෙන ජීවිතයට ආලෝකයක් උදාකර ගත හැකි වේ.

ඉතා සරල සුගම භාෂා විලාසයකින් මාතෘකා විසිපහක් ඔස්සේ බෞද්ධ සංකල්ප ඉදිරිපත් කර ඇති කතු හිමියන් මේ කෘතියෙන් මිනිස් සන්තානයෙහි බුද්ධිමය ප්‍රබෝධයක් උදාකරනු නිසැක ය. ඒ නිසා වජිරවංස ස්ථවිරයන්ගේ මෙම උත්සාහය ප්‍රශංසනීය වේ.

සියම් මහා නිකායේ
ශ්‍රී රෝහණ පාර්ශ්වයේ මහානායක
රුහුණු විශ්ව විද්‍යාලයේ කුලපති,
සාහිත්‍ය සූරී, රාජකීය පණ්ඩිත,
**අත්තුඩාවේ ශ්‍රී රාහුල මහා නාහිමි**

# ප්‍රස්තාවනාව

ලෝක ආගම් ලෙස සැලකෙන බොහෝ ආගම්වල පුද්ගල ජීවිත සැනසීම සඳහා ඉවහල්වන ආගමික සංකල්ප හඳුන්වා දී ඇත. නමුත් ඇතැම් ආගම්වල පාපකාරී ක්‍රියාවලියක යෙදී සිටින අනුගාමිකයෝ සිටිති. ඇතැම් ආගමික අනුස්මරණ දිනවල කෝටි සංඛ්‍යාත අහිංසක සතුන් ඝාතනය වන අවාසනාවන්ත අවස්ථා දක්නට ඇත. එවැනි ආගම් අදහනවා තබා සිහිගැනවීම ද අහිංසාව අගයන ජන සමාජයකට ශාපයක් නොවේ ද? සත්ත්ව ඝාතන කොට අනුන්ට හිංසාව දක්වා සැනසුම සොයන ලොවක ලේ බිඳුවකුදු නොසොල්වා මිනිසුන්ට අපමණ ශාන්තිය උදාකරදුන් දහමක් ලෙස බුදු දහම අවිවාදයෙන් ම පිළිගැනේ.

වරෙක යුරෝපීය උගතුන් ප්‍රකාශ කළේ බටහිර පෙර දිගින් ලබා දිය යුතු ඉහළම දායාදය නම් බුදුරදුන් දේශිත සිඟාලෝවාද සූත්‍රය පමණක් බවයි. එකම සූත්‍ර දේශනාවක ශ්‍රේෂ්ඨත්වය එබඳුනම් පන්සාලිස් වසක් තිස්සේ දේශිත සුවාසූ දහසක් වූ සදහම් ගඟ බටහිරට ගලා යන්නේ නම් කෙබඳු තරමේ සැනසීමක් ලබනු ඇත් ද?

බුදු දහම ගිහියාට 'කාමභෝගී' යන නම ලබා දී ඇත. ඒ කම් සැප විඳින කෙනෙකු නිසයි. ඕලාරික නොවූ කම්සැප ගිහියෙකුට වින්දනය කිරීමට කිසිදු බාධාවක් නැත. 'සුඛකාමානී භූතානී' යනු 'සකලවිධ සත්වයෝ ම සැප කැමති වූවාහු වෙති'. යනුයි. බුදු දහමේ "සන්තුට්ඨී පරමං ධනං" යනුවෙන් සතුට උතුම් ධනය ලෙස ද හඳුන්වා ඇත.

දැහැමි සමාජයක් නිර්මාණය කිරීම සඳහා බෞද්ධ සංකල්ප වෙසෙසින් ම අවශ්‍ය වෙයි. පුද්ගලයා ජීවිතයේ

නිරන්තර අවශ්‍යතා සපුරා ගැන්ම සඳහා වෙහෙසුන ද ඒ සඳහා නිවැරදි මඟ තෝරා ගැනීමට පුද්ගලයා අපොහොසත් වී ඇත. පුද්ගලයා විසින් සිත පෙරටු කොට කායික හා මානසික අත්දැකීම් තුළින් ලබන සොම්නස් තත්ත්වය සැපයයි. ඒ සැපය සාදන මාර්ගය බුදු දහමේ විවිධ සූත්‍ර ධර්මවලින් හෙළිපෙහෙළි වෙයි.

දීඝ නිකායේ 'සංගීති සූත්‍රය' අනුව පුද්ගලයාට ජීවිතයේ තෘප්තිය ඇති කරවන සාමිස ගණයට අයත් සාමිස ආහාර වර්ග සතරක් ගැන සඳහන් වෙයි. එම ආහාර වර්ග නම්,

1. **කබලීකාහාර**
   (දිවි පැවැත්ම සඳහා ගනු ලබන ආහාර)

2. **ඵස්සාහාර**
   ( පසිඳුරන් පිනවන සුවදායක අරමුණු කෙරෙහි සිත පෙරටු කොට කයින් හා මනසින් බැඳීම)

3. **මනෝ සංචේතනා ආහාර**
   (ජීවිතයේ අනුස්මරණීය අවස්ථා හා රසවත් අත්දැකීම් ආවර්ජනා කිරීම, අනාගතයේ අභිවෘද්ධිය, පෙරදැක්ම ආදියෙන් ආශ්වාද ලැබීම.)

4. **විඤ්ඤාණාහාර**
   (නව තොරතුරු දැන ගැනීමට ද විඩාපත් මනස සුවපත් කිරීමට ද හේතුවන කියවීම, ලිවීම, විනෝදවීම, චාරිකාවෙහි යෙදීම ආදිය මගින් සිතේ නැවුම් බව හා සමබරව බව පවත්වා ගැනීම)

යනුයි.

ඉහත කරුණු සතරින් මුල් කරුණු තුනෙන් දිවි පැවැත්මට ආහාර අවශ්‍ය වන බවත්, කායික හා මානසික සුවය සඳහාත් එය හේතුවන බවත් සතරවෙනි කරුණෙන් මානසික ශක්තිය ද අවශ්‍ය වූ විට පෘථග්ජනයාට සාමිස සුවයක් විඳිය හැකි බවත් පැහැදිලි වෙයි. ලෞකික සැපය ලෙස මෙය හැඳින්වෙයි. නමුත්

එය අනිත්‍යතාවයට හා විපරිනාමයට ගොදුරු වෙයි. සාමිස සැපතෙහි යථාස්වභාවය එය බව පිළිගැනීමට සිදු වෙයි. සාමිස සුවය අතෘප්තිය හා අසහනය උදා කරන අතර ඇතැම්විට එපා වීමක් ද විය හැකිය.

බුදු දහම අවධාරණය කරන යථාර්ථවාදී සැනසීම අලෞකික සුවය හෙවත් නිරාමිස සුවයයි. පෘථග්ජනයා ලබන සාමිස සුවයට වඩා හාත්පසින් ම වෙනස් මෙය අලෞකික සුවය, ධ්‍යාන, විමුක්තිය, නිර්වාණය, නිරෝධය ආදී ලෙසින් අත්විඳිය හැකි ය. මෙය අවේදයිත සුවයකි. දස සංයෝජන සහමුලින් ම දුරුකර ලබන සැපයකි. බුදු, පසේ බුදු, මහරහත් යන උතුමන්ම මෙම සුවය ලබන අතර එහි ස්වභාවය පිළිබඳ උන්වහන්සේලා පළ කර ඇති උදාන වාක්‍ය තුළින් මනාව පැහැදිලි වේ.

බුදු දහම විවිධ සූත්‍ර මගින් හෙළි කරන සැප 03 කි. එනම්,

1. මෙලොව සැප
2. පරලොව සැප
3. නිවන් සැප යනු ඒ සැප තුනයි.

සමස්ත බුදු දහම පුරාම විවිධ ලෙසින් විග්‍රහ කරන්නේ මෙම සැප තුන පිළිබඳවයි. මෙම කෘතියෙන් ද විවිධ සංකල්ප විග්‍රහ වී ඇති බව ඔබට දැකගත හැකි ය. ඒ සියලු බෞද්ධ සංකල්පවල සාරය වන්නේ මෙම සැප තුනයි. විවිධ ආත්මවල උපත ලබමින් මිනිසා විඳින මෙම සැප බුදු දහම කවර ලෙස විග්‍රහ වන්නේ දැයි මූලික සංකල්ප අනුව සසඳා බැලිය හැකිවේ.

සුවය හෙවත් සැපය පිළිබඳ බෞද්ධ සංකල්පය ජීවිතයේ ගැටලු විසඳා ගැනීමට හා සැනසීම පිණිස උපයෝගී කරගත හැකි වෙයි. පුද්ගලයන් මුහුණ දෙන ඇතැම් ගැටලු ඔහුගේ දුර්වලකම් නිසාම ඇතිවන ඒවා ය. තමාගේ අපරීක්ෂාකාරීබව, අදූරදර්ශී බව, අනවධානය එසේ ගැටලු ඇතිවීමට බලපා ඇත. ආර්ථික ගැටලු, මානසික ගැටලු, සමාජගත ගැටලු, ලෙස ඒවා

හැඳින්වෙයි. බුදුරදුන් දේශනා කොට ඇති පරිහානී හේතුවලින් වැළකී, මෙලොව ජීවිතයේ ගැටලු අවම කරගෙන සාරවත් සැනසිලිදායක ජීවිතයක් ගොඩනඟා ගත හැකි ය. පරලොව සුවය සඳහා ද එම සැනසිලි දායක ජීවිතය හේතුවෙයි. බුදුරජාණන් වහන්සේ දේශනා කොට ඇති ධර්මය මෙලොව හා පරලොව සැපය සඳහා පමණක් හේතුවන දහමක් නොවේ. නිර්වාණය සඳහා ද හේතුවන දහමකි.

බුදු දහමට අනුව සෑම පුද්ගලයෙකුම මෙලොව පරලොව සුවය පමණක් නොව නිවන් සුවය සලසා ගැනීමට ද ක්‍රියා කළ යුතු ය. ඒ සඳහා මඟ පෙන්වන බෞද්ධ සංකල්ප රැසක් මෙම කෘතියෙන් විග්‍රහ කොට ඇත. මුලින් ම තෙරුවන් සරණ යාම යනු කුමක්දැයි හඳුන්වා දෙන කතුවරයා සමාජයේ විවිධ තරාතිරමේ පුද්ගලයන් සොයා යන බෞද්ධ හර පද්ධතිය සරල ලෙස ඔවුන්ට විග්‍රහ කර දී ඇත. පුද්ගල පෞරුෂය, සෞන්දර්යය, නිවන, රාජ්‍ය පාලනය, ධනාත්මක චින්තනය, කර්මය, පුනර්භවය, යුගදිවිය ආදී සංකල්ප මගින් නූතන බුද්ධිමත් සමාජයේ පර්යේෂණ පිපාසාව සංසිඳවීමට ගෙන ඇති උත්සාහය අගය කළ යුතු ය. ලෝකයේ වෙනත් ආගම් හා දර්ශනවාද වලට වඩා බුදු දහම අවධාරණය කරන මෙබඳු සුවිශේෂ සංකල්ප ගෙනහැර දක්වීමෙන් කතුහිමියන් බුදු දහමේ විශිෂ්ටත්වය මේ තුළින් උද්දීපනය කොට ඇත. එය බෞද්ධ සමාජයේ ජීවත්වන ඔබ සැමගේ අවධානයට යොමු විය යුතු ය.

රුහුණු විශ්ව විද්‍යාලයේ හිටපු
නියෝජ්‍ය උපකුලපති,
වැලිගම අග්‍රබෝධි රජමහා විහාරාධිපති,
මහාචාර්ය
**මිදිගම සෝරත නාහිමි**

## කතු හිමියන්ගෙන්.......

බුදු දහම පිළිබඳ මුළු ලෝකයාගේ ම අවධානය යොමු වී ඇති මේ යුගයේ බෞද්ධ සංකල්ප සරල ලෙස ඉදිරිපත් කිරීමට ගත් උත්සාහයේ ප්‍රතිඵලයකි මේ. මිනිස් සමාජයේ හටගනු ලබන සෑම ගැටලුවකටම විසඳුමක් බුදු දහමෙන් ඉදිරිපත් කර ඇත. බුදු දහමෙහි සෑම ගැටලුවකට ම විසඳුමක් තිබූ පමණින් මිනිස් සමාජයේ ගැටලු නොවිසඳේ. ඒ සඳහා පුද්ගල බුද්ධිය ද අවශ්‍ය වේ. බෞද්ධ සමාජගත පුද්ගලයාගේ ජීවිතය අර්ථවත් කර ගැනීම සඳහා හේතුවන සංකල්ප මාතෘකා විසි පහක් ඔස්සේ මේ කෘතියෙන් ඉදිරිපත් කර ඇත.

මෙම කෘතිය පිළිබඳ හැඳින්වීමක් කරන සියම් මහා නිකායේ ශ්‍රී රෝහණ පාර්ශවයේ මහා නායක රුහුණු විශ්ව විද්‍යාලයේ කුලපති, රාජකීය පණ්ඩිත සාහිත්‍ය සූරී අත්තුඩාවේ රාහුල මහා නාහිමියන්ටත්, ප්‍රස්ථාවනාවක් සැපයූ වැලිගම අග්‍රබෝධි රජමහා විහාරාධිපති රුහුණු විශ්ව විද්‍යාලයේ හිටපු නියෝජ්‍ය උපකුලපති මහාචාර්ය මිදිගම සෝරත නාහිමියන්ටත්, පසුවදනක් සපයන කොළඹ විශ්ව විද්‍යාලයේ ජන සන්නිවේදන අධ්‍යයන අංශයේ අංශාධිපති, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කමල් වලේබොඩ මහතාටත් මගේ ස්තූතිය හිමිවන අතර මෙම කෘතිය මුද්‍රණයෙන් එළිදැක්වූ මරදාන ගොඩගේ පොත් මැඳුර අධිපති දේශබන්ධු සිරිසුමන ගොඩගේ මහතා ඇතුළු එහි කාර්ය

මණ්ඩලයටත්, මුද්‍රණ සම්බන්ධීකරණයෙන් දායක වුණු පාලිත සේනානායක මහතාටත් මේ සඳහා නන් අයුරින් සහයෝගය ලබාදුන් ඔබ සැමටත් ස්තුති කරමි.

විතාරන්දෙණියේ වජිරවංස හිමි
සිංහගිරි විහාරය,
හම්බන්තොට.
දුරකථනය :- 071-8006470

# පටුන

පිටුව

| | | |
|---|---|---|
| 01. | තෙරුවන් සරණ යාම යනු කුමක් ද? | 17 |
| 02. | බුදු දහම හා ධර්ම සන්නිවේදනය | 25 |
| 03. | බුදු දහම හා ධනාත්මක චින්තනය | 32 |
| 04. | බුදු දහම හා නායකත්ව ගුණාංග | 38 |
| 05. | බුදු දහම හා සෞන්දර්යය | 49 |
| 06. | බුදු දහම හා මානව ප්‍රේමය | 57 |
| 07. | බුදු දහම හා අනාගත දැක්ම | 62 |
| 08. | බුදු දහම හා මනුෂ්‍යත්වය | 71 |
| 09. | බුදු දහම හා දේව සංකල්ප | 76 |
| 10. | බුදු දහම හා නිවන | 83 |
| 11. | බුදු දහම හා සමාජ පැවැත්ම | 88 |
| 12. | බුදු දහම හා රාජ්‍ය පාලනය | 94 |
| 13. | බුදු දහම හා කම්කරු අයිතිය | 102 |
| 14. | බුදු දහම හා අපේ වගකීම් | 108 |
| 15. | බුදු දහම හා ධනය | 114 |
| 16. | බුදු දහම හා පුද්ගල පෞරුෂත්වය | 121 |
| 17. | බුදු දහම හා කාන්තා සමාජය | 127 |
| 18. | බුදු දහම හා යුග ජීවිතය | 135 |
| 19. | බුදු දහම, කර්මය හා පුනර්භවය | 143 |
| 20. | බුදු දහමට අනුව සාර්ථක ජීවිතයකට පියවර | 153 |
| 21. | බුදු දහමේ සැපවත් දිවියකට නිවැරදි සූදානම | 159 |

22. බුදු දහම මිනිස් වගකීම් හා යුතුකම් 166

23. බුදු දහම හා සමාජ සදාචාරය 174

24. බුදු දහම හා බෞද්ධ සමාජයේ හෙට දවස 182

25. බුදු දහම හා ජීවිතාලෝකය 187

# 01

# තෙරුවන් සරණ යාම යනු කුමක් ද?



ලෝකයේ ජීවත්වන පුද්ගලයෝ විවිධ ආගම් අදහති. ආගමික සිරිත් විරිත් අනුගමනය කරති. පුද පූජා පවත්වති. එතුළින් බලාපොරොත්තු වන්නේ මෙලොව සහ පරලොව ජීවිතය සාර්ථක කර ගැනීමයි. ලෝකයේ ආගම් කොටස් 2 කට බෙදා දැක්විය හැකි ය.

1. දේවවාදී (දේව කේන්ද්‍රීය) ආගම්
2. මානවවාදී (මානව කේන්ද්‍රීය) ආගම්

යනුවෙන් එය හැඳින්වේ. දේව කේන්ද්‍රීය ආගම් යනු දෙවියන් කෙරෙහි භක්තිය හා විශ්වාසය ඇතිකර ගනිමින් එම ආගමේ සිරිත් විරිත් අනුගමනය කිරීමයි. දෙවියන් අදහන්නෝ බිය හෙවත් භක්තිය මුල් කරගෙන අදහති. ඔවුන්ගේ අවසාන අරමුණ ස්වර්ගයට හෙවත් දෙව්ලොවට යාමයි.

බුදුරදුන් ලොව පහළවීමට පෙර විසූවෝ ගස්, ගල්, පර්වත, මියගිය පුද්ගලයින් ආදීන් කෙරෙහි බියට පත්වී පුදපූජා පැවැත්වූහ. තමන් ආරක්ෂා කරදෙන ලෙස ඉල්ලා සිටියහ. ඒ අනුව වැඳුම් පිදුම් ක්‍රමයක් ඇතිවිය.

බුදු දහම මානව කේන්ද්‍රීය දහමකි. ශ්‍රද්ධාව හෙවත් තෙරුවන් කෙරෙහි පැහැදීම හෙවත් විශ්වාසයෙන් යුතුව තෙරුවන් සරණ යති. තෙරුවන් යනු.

1. බුද්ධ රත්නය
2. ධම්ම රත්නය
3. සංඝ රත්නය

යන තුනයි. බෞද්ධයෝ සුබ කටයුත්තක් හෝ යමක් ආරම්භ කිරීමට පෙර තෙරුවන් සරණ යති.

1. බුද්ධං සරණං ගච්ඡාමි (බුදුරදුන් සරණ යමි)
2. ධම්මං සරණං ගච්ඡාමි (දහම් සරණ යමි)
3. සංඝං සරණං ගච්ඡාමි (සඟුන් සරණ යමි)

යනුවෙන් කියා තෙරුවන් සරණ යන අතර දෙවනුව ද (දුතියම්පි) තෙවනුව ද (තතියම්පි) ආදී ලෙසින් කියා තෙරුවන් හෙවත් තිසරණ සරණ යති.

තෙරුවන් සරණ ගිය තැනැත්තා ශ්‍රාද්ධ නමින් හැඳින්වෙයි. දෙමව්පියන් ශ්‍රාද්ධයන් වන නිසා දරුවන් තෙරුවන් සරණ යති. එය දෙමව්පියන් අනුකරණය කිරීමකි. එය හොඳ පුරුද්දකි. නමුත් අපි තෙරුවන් සරණ යා යුත්තේ එහි අගය වටහාගෙනයි. තෙරුවන් සරණ යන පුද්ගලයා බුද්ධ, ධම්ම, සංඝ යන ත්‍රිවිධ රත්නය කෙරෙහි මනා වූ විශ්වාසය හෙවත් ශ්‍රද්ධාවෙන් කටයුතු කළ යුතු ය. තෙරුවන් සරණ යන්නාගේ අවසාන අරමුණ දෙව් ලොව යාම හෙවත් ස්වර්ගයටම යාම නොව උතුම් වූ නිවන් සුව අවබෝධ කර ගැනීමයි.

දෙවියන් පිහිට පතන්නෝ අන්ධ විශ්වාසයෙන් යුත්තෝ වෙති. එම ආගම් විවේචනයට හෝ ඒ කෙරෙහි බුද්ධිමත්ව බැලීමට එහි ඉඩක් නැත. එසේ කරන්නේ නම් එය දේව ශාපයට හෙවත් දේව දඬුවමට ලක්වන බව ඉගැන්වේ. තම හැකියා සියල්ලම දෙවියන්ට භාරදී ලොව හා පුද්ගලයා දෙවියන් වහන්සේ මවා ඇති බව ඔවුන් විශ්වාස කරති. නමුත් බෞද්ධ ජනතාවට ඊට වඩා නිදහසක් ඇත. තමන්ට කැමති නම් ධර්මය දෙස විමසා බලා තෙරුවන් සරණ යාමට හැකි ය. අකමැති නම් වෙනත් ආගමක් ඇදහිය හැකි ය. බුදුරදුන් කිසි විටෙකත් බුදු දහම පිළිගන්නා ලෙස මිනිසාට බල කර නැත.

මිනිසා යනු උසස් මනසක් ඇති බුද්ධිමත් සත්ත්වයෙකි. බුදුදහම යනු බුද්ධියේ දහමකි. මිනිස් ජීවිතයේ යහපත් ප්‍රතිඵල නෙළා ගැනීමට බුදු දහමෙන් මිස වෙනත් දහමකින් නොහැකිය.

බුදු සරණ යාම යනු බුදුරජාණන් වහන්සේ කවුරුන්දැයි හඳුනාගෙන උන්වහන්සේ ගියමඟ අපත්

යාමයි. බුදු සිරිත දෙස අප විමසා බැලිය යුතුය. උන්වහන්සේගේ හැසිරීම්, දේශනා පිළිබඳ අවබෝධය ලබා ගෙන නව අරහාදී බුදු ගුණ මෙනෙහි කළ යුතු ය. බුදුරජාණන් වහන්සේ සතු වූ විශේෂ ගුණ 9 ක් ඇත. 'අරහං' ආදී ලෙසින් විස්තර වන එම ගුණ සිහිපත් කිරීමෙන් අපගේ ජීවිතයට ආශිර්වාදයක් ලැබේ. බුදුන් සරණයාම යනු එයයි. උන්වහන්සේ ගේ චරිතය අනුගමනය කිරීමටත් වෛරය, ක්‍රෝධය, ඊර්ෂ්‍යාව ආදී අප සිත තුළ ඇති පව් කෙලෙස් ටිකෙන් ටික හෝ දුරු කර ගැනීමටත් අප උත්සාහවන්ත විය යුතු ය.

බුදුරජාණන් වහන්සේ යනු අපගේ මාර්ගෝපදේශකයා ය. අප යා යුතු නිවැරදි මඟ උන්වහන්සේ පෙන්වා දී ඇත. ඒ මඟ නිවැරදිව හඳුනා ගැනීමෙන් හරි මඟ හෙවත් නිවන් මගෙහි ගමන් කොට නිර්වාණය නම් ප්‍රතිඵලය ලබාගත හැකි ය. ඒ මඟ නිවැරදිව හඳුනා නොගතහොත් හෝ ධර්මය වැරදිව වටහා ගතහොත් වැරදි මාර්ගවල ගමන් කිරීමෙන් සංසාර දුගතියට පත් වේ.

දෙවනුවට අප ධර්ම රත්නය සරණ යයි. බුදුන් දෙසූ නිවැරදි මඟ ධර්මයයි. බුදුරදුන් තම ගුරුවරයා ලෙස සලකන ලද්දේ ධර්මයයි. ධර්මයට අනුව කටයුතු කරන්නන්ට ධර්මය විසින් ම ආරක්ෂාව සලසන බව " ධම්මෝ හවේ රක්ඛති ධම්ම චාරී" යන බුදු වදනින් පැහැදිලි වේ. මෙලොව දියුණුව, පරලොව දියුණුව හා නිවන් සුවය ලබාගැනීමට හැකි වන්නේ ධර්මයට අනුව කටයුතු කිරීමෙනි. ධර්ම රත්නය තුළ සුවිශේෂී ගුණ 6 ක් ඇති බව "ස්වාක්ඛාතෝ භගවතෝ ධම්මෝ........." ආදී ලෙසින් ප්‍රකාශ වන ගාථාවෙන් පැහැදිලි වේ. බුදුරදුන්

පිරිනිවන් පා ඇතත් ධර්මය පවතී. බුදුරදුන් දකින්නට නම් ධර්මය දැකිය යුතු බව "යෝ ධම්මං පස්සති සෝමං පස්සති" යන බුදු වදනින් ප්‍රකට වේ. බෞද්ධයාගේ අවසන් අරමුණ වන නිවනට යන මඟ දක්වා ඇත්තේ ධර්මයෙහි ය. විවිධ පුණ්‍ය ක්‍රියා, දස කුසල්, දස පාරමිතා ආදී ප්‍රතිපදා අනුගමනය කිරීමෙන් චතුරාර්ය සත්‍ය, කර්මය, පුනර්භවය, පටිච්ච සමුප්පාදය ආදී ධර්ම අවබෝධ කර ගැනීමත් තුළින් ඒ නිවන් මඟට පිවිසීමටත් හැකි ය.

තෙවනුව අප සරණ යනුයේ සංඝ රත්නයයි. සංඝ රත්නය යනු බුදුරදුන්ගේ ශ්‍රාවක භික්ෂු සංඝයා ය. සෝවාන්, සකෘදාගාමී, අනාගාමී, අරහත් මාර්ගඵල ලාභී ශ්‍රාවක සංඝරත්නය සරණ යාමෙන් අපගේ ජීවිතයට මහත් සැනසුමක් හා ආශිර්වාදයක් හිමිවේ. ගිහිගෙයින් නික්මී දුක් කම්කටොළුවලින් ඉවත් වී තම විමුක්තිය සලසා ගන්නා අතරම මිනිසා ඇතුළු සත්ත්වයන් ගේ හිතසුව පිණිස අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරනුයේ සංඝරත්නයයි. "
සුපටිපන්නො භගවතො සාවක සංඝො" යනාදී ගාථාවෙන් සංඝරත්නය සතු ගුණ 9 ක් කියවේ. සංඝ රත්නය සරණ යාම යනු එම ගුණ නවය සරණ යාමයි. විමුක්ති මගෙහි ඉදිරියෙන් ගමන් කරනුයේ මහා සංඝ රත්නයයි. අප යන්නේ උන් වහන්සේලා ආදර්ශයට ගෙන ඒ මගෙහි ය. එනිසා උන්වහන්සේලාගේ පැවැත්ම අපට ආදර්ශයකි. මෙලෙස වූ තෙරුවන් නිවැරදිව හඳුනා සරණ යෑමෙන් අප සැමගේ ජීවිත අර්ථවත් වේ.

තෙරුවන් සරණ යන තැනැත්තාට ලැබෙන උසස් ම නාමය උපාසක යන්නයි. බෞද්ධ උපාසක නාමය

මිනිසා ලබන ඉහළම උපාධියකි. තෙරුවන් සරණ යාම මෙන්ම තෙරුවන් ගුණ අනුගමනය කිරීම ද බෞද්ධයා සතු ලක්ෂණයකි. යම් විටෙක පුද්ගලයෙකුට බුද්ධ, ධම්ම, සංඝ යන තෙරුවන් ගැන සැකයක් කලකිරීමක් හෝ අගුණයක් දකී නම් ඒ පුද්ගලයාගේ සරණ එතැනින් ම කිළිටි වේ. ලෞකික ලෝකයේ තෙරුවන් සරණ යන පුද්ගලයන් සතර දෙනෙකු පිළිබඳ බුදු දහමේ ඉගැන්වේ.

1. ආත්ම සංනියර්යාතන සරණාගමනය
2. තත් පරායන සරණාගමනය
3. ශිෂ්‍ය භවෝපගමන සරණාගමනය
4. ප්‍රණිපාතා සරණාගමනය

**ආත්ම සංනියර්යාතන සරණාගමනය** යනු තුන් සිත දිවි හිමියෙන් මාගේ ආත්මය තෙරුවනට පූජා වේවා! යි සිතා තෙරුවන් සරණ යාමයි. **තත්පරායන සරණාගමනය** යනු මෙතැන් සිට තෙරුවන් වෙනුවෙන් කැපවෙමියි ඊට ඇතුළත් වෙමියි අධිෂ්ඨානයෙන් යුතුව තෙරුවන් සරණ යාමයි. **ශිෂ්‍ය භාවෝපගමන සරණාගමනය** යනු මෙතැන් සිට මා තෙරුවන් ගේ ශිෂ්‍යයෙක් වෙමියි සිතා තෙරුවන් සරණ ගොස් ඊට ගෞරව දැක්වීමයි. **ප්‍රණිපාතා සරණාගමනය** යනු මෙතැන් සිට තෙරුවන ට සැමදා ගෞරවයෙන් නමස්කාර කරමියි තෙරුවන් සරණ යාමයි. ප්‍රණිපාතා සරණාගමනයේ තවත් අවස්ථා 4 ක් දැක්වේ. එනම් ඥාති, භය, ආචාර්ය, දක්ඛිණෙය්‍ය යනු යි.

1 **ඥාති** යනු තෙරුවන් තම නෑයන් යැයි සිතා කටයුතු කිරීමයි.
2. **භය** යනු තෙරුවන් මහානුභාව සම්පන්න යැයි සිතා බියවී තෙරුවන් සරණ යාමයි.

3. ආචාර්ය යනු තම ගුරුවරයා බුදුරදුන් යයි සිතා තෙරුවන් සරණ යාමයි.
4. දක්ඛිණෙයය යනු පින් අපේක්ෂාවෙන් තෙරවැන් සරණ යාමයි.

මේ අනුව තෙරුවන් සරණ යා යුතු වන්නේ ඒ කෙරෙහි ඇති කර ගන්නා විශ්වාසය අනුව බව පැහැදිලි ය. අප තෙරුවන කෙරෙහි බිය විය යුතු නැත. අපගේ ආධ්‍යාත්මය ගුණ ධර්ම පැත්තට යොමුවන්නේ ඒ කෙරෙහි විශ්වාසය ඇති වූ තරමටයි. විශ්වාසය හෙවත් ශ්‍රද්ධාව කොටස් දෙකකි.

1. අමූලිකා ශ්‍රද්ධා
2. ආකාරවතී ශ්‍රද්ධා

අමූලිකා ශ්‍රද්ධා යනු මෝහය සමඟ ඇති වන තෙරුවන් කෙරෙහි වූ විශ්වාසයයි. තෙරුවන් ගුණ නිසිලෙස හඳුනා නොගෙන වෙනත් අය තෙරුවන් සරණ යන නිසා මතුපිට ස්වභාවය බලා තෙරුවනට වැඳුම් පිදුම් කිරීමයි. අමූලික ශ්‍රද්ධාවෙන් යුතු තැනැත්තාගේ විශ්වාසය ස්ථිර නොවේ. ඔහු වෙනත් මිථ්‍යා ආගම් කෙරෙහි ද විශ්වාසය තැබිය හැකිය. එනිසා එම ශ්‍රද්ධාව බුදුරදුන් අගය කොට නැත.

ආකාරවතී ශ්‍රද්ධාව යනු බුද්ධිමත්ව තෙරුවන දෙස බලා ඒ කෙරෙහි විශ්වාසය ඇති කර ගැනීමයි. තම ජීවිතයේ එකම සරණ තෙරුවන් බව විශ්වාස කිරීමයි. ඔහුගේ ශ්‍රද්ධාව කිසි විටෙකත් වෙනස් නොවේ. බුදුරදුන් අගය කොට ඇත්තේ මෙම ආකාරවතී ශ්‍රද්ධාවයි.

තෙරුවන් සරණ යන පුද්ගලයාට නිවන් දැකීමට පෙර ලැබෙන ආනිශංස පහක් පිළිබඳ බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වේ. එනම්,

1. උපද්‍රව දුරුවී ආරක්‍ෂාව ලැබීම.
2. මනා රූ සපුවක් ලැබීම හා දෙව්ලොව ඉපදීම.
3. උපාසක තත්වයට පත්වීම.
4. මෛත්‍රී සිත් ඇත්තෙකු වීම.
5. දුගතියේ නොඉපදීම.

බුද්ධ කාලයේ විසූ ඡත්ත මානවක නම් බ්‍රාහ්මණ පුත්‍රයාට බුදුරදුන් විසින් දෙව්ලොව යාමට මඟ හෙළි කළේ තෙරුවන් සරණ යාමට උපදෙස් දීමෙනි. ඒ අනුව "**යෝවද තං පව රෝමණු ජේසු**" යන ගාථාවෙන් බුදු ගුණ ද, "**රාග විරාගම නේජම සෝකං**" යන ගාථාවෙන් දහම් ගුණ ද, "**යත්ථ ච දින්න මහප්පලමාහු**" යන ගාථාවෙන් සඟ ගුණ ද ප්‍රකාශ වන අයුරින් බුදුරදුන් ඉගැන්වූ ගාථා කීමෙන් ඡත්ත මානවක කුමරු දෙව්ලොව උපත ලැබී ය. එමෙන් ම, මට්ටකුණ්ඩලී කුමරු බුදුරදුන්ගේ සරණ යාමෙන් දෙව්ලොව උපත ලැබී ය. එමනිසා මෙලොව පරලොව ජීවිතයේ කායික හා මානසික සුවය සලසා ගැනීමට අපි නුවණින් යුතුව තෙරුවන් සරණ යමු.

# 02

# බුදු දහම සහ ධර්ම සන්නිවේදන ක්‍රම



බුදුරජාණන් වහන්සේ ගේ සත්‍යයේ උතුම් දහමට දෙදහස් පන්සිය පනස් වසරකටත් අධික කාලයක් ගත වී ඇත. සාරාසංඛ්‍යය කල්ප ලක්ෂයක් පුරා දස පෙරුම්

පුරා අවබෝධ කරගත් උතුම් දහම ඉතා ගැඹුරු වූ දහමකි. ලෝසතුන්ගේ මෙලොව පරලොව සුවය මෙන් ම නිවන් සුවය ද සලසා දෙන දහමකි. එම දහම ලෝක සත්ත්වයාට අවබෝධ කරවනු සඳහා උන් වහන්සේ උපයෝගී කරගත් ක්‍රම ශිල්ප විචිත්‍ර ය. විසිතුරු ය. ලෝක සත්වයා වෙත පතල මහා කරුණාවෙන් යුතු උන් වහන්සේ පා ගමනින් හා ඍද්ධියෙන් ගොස් දම් දෙසා සැනසුම උදාකළ සේක. විවිධ වූ චරිත ඇති පුද්ගලයන්ට විවිධ ක්‍රම මගින් දහම් අවබෝධ කිරීමට උන් වහන්සේ සමත් වූහ. බුදුරදුන්ගේ ධර්ම දේශනා ක්‍රමය ආකාර දෙකකි. එනම්,

1. සම්මුති දේශනා
2. පරමත්ථ දේශනා යනුයි.

මිනිස්, දේව, සත්ත්ව, පුද්ගල ආදී ව්‍යවහාරයන් මුල් කරගෙන කරන දේශනා **සම්මුති දේශනා** නමින් ද, ධාතු, ආයතන, ස්කන්ධ වශයෙන් විශ්ලේෂණය කරමින් කරන දේශනා **පරමත්ථ දේශනා** නමින් ද හැඳින්වෙයි.

බුදුරදුන් තමන් හමුවට එන පුද්ගලයන් හා තමන් හමුවට නො එන පුද්ගලයන්ට ධර්ම දේශනා කිරීමේ දී ඔවුන්ගේ මානසික ශක්තීන් නුවණින් පරීක්ෂා කොට පහසුවෙන් අවබෝධ කර ගැනීමට හැකි ලෙසින් විග්‍රහ කළ සේක. පළමුවෙන් ම දාන කථා හෙවත් දන්දීමේ අනුසස් ද දෙවනුව සීල කථා හෙවත් සිල් රැකීමේ ආනිශංස ද තෙවනුව සග්ග කථා හෙවත් පුද්ගලයා කුසල් සිදු කිරීමෙන් දිව්‍ය සැප සම්පත් ලබන ආකාරයත් දේශනා කළහ. පසුව දේශනා කරනුයේ කාම සම්පත්වලින් ලැබෙන විපාකයන් ය. පසුව එම කම්

සැපයෙන් වෙන්වීමෙන් ලැබෙන ආනිශංස පැහැදිලි කරයි. මේ අනුව සරල කරුණෙහි පටන් ගැඹුරු කරුණු අවබෝධය දක්වා අනුපූර්ව කථාව හෙවත් අනුපුබ්බී කථා ශෛලිය අනුගමනය කොට ඇත. සෑම දහම් කරුණක්ම උන් වහන්සේ දේශනා කළේ මෛත්‍රී සිතින් යුතුවයි. දීඝ නිකායේ අට්ඨ කථාවේ දැක්වෙන බ්‍රහ්මජාල සූත්‍ර වර්ණනාව අනුව බුද්ධ දේශනාවේ ආකාර සතරක් විග්‍රහ වෙයි.

1. අත්තජ්ඣාසය දේශනා
2. පරජ්ඣාසය දේශනා
3. පුච්ඡාවසික දේශනා
4. අට්ඨුප්පත්තික දේශනා යනුයි.

අත්තජ්ඣාසය දේශනා යනු අවස්ථාවට සුදුසු අකාරයෙන් බුදුරදුන්ගේ අදහසට අනුව ධර්ම දේශනා කිරීමයි. පරජ්ඣාසය දේශනා යනු අසන්නන්ගේ අදහස් විමසා ඔවුන් කැමති ආකාරයට ධර්මය දේශනා කිරීමයි. ඔවුන් අසන ප්‍රශ්න වලට පිළිතුරු වශයෙන් කරන දේශනය පුච්ඡාවසික දේශනා නම් වෙයි. අට්ඨුප්පත්තික දේශනා යනු එම අවස්ථාවෙහි එළඹෙන හේතුවකට අනුව ධර්මය දෙසීමයි. මෙලෙසින් වූ බුදුරදුන් විසින් කරන දම් දෙසුම් ශ්‍රාවකයාගේ බුද්ධි ප්‍රබෝධය පිණිසම හේතු වූහ.

බුදුරදුන් දම් දෙසූ තවත් ජනප්‍රිය ක්‍රමයක් ලෙස සාකච්ඡා ක්‍රමය හැඳින්විය හැකි ය. ඒකාකාරීත්වයෙන් මිදී ශ්‍රාවකයා සමඟ සාකච්ඡා කිරීමෙන් නිරායාසයෙන් ම ධර්මය අවබෝධ වේ. මහා නිධාන, මහා මංගල, චූල්ලගෝසිංහ ආදී සූත්‍ර ඊට නිදසුන් ලෙස දැක්විය හැකි

ය. ගැඹුරු දහම් කරුණු අවබෝධ කරවීමට මෙම ක්‍රමය අතිශය සාර්ථක විය. එමෙන් ම ශ්‍රාවකයා විසින් විමසන යම් යම් ප්‍රශ්නවලට පිළිතුරු වශයෙන් ද බුදුරදුන් ධර්මය විග්‍රහ කොට ඇත. භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිවවනක් පිරිසගේ ප්‍රශ්නවලට පිළිතුරු සපයමින් බුදුරදුන් ධර්මය දේශනා කළ චතුර්විධ ප්‍රශ්න විචාරණ ක්‍රම සතරක් අංගුත්තර නිකායේ සඳහන් වේ.

1. **ඒකංස ව්‍යාකරණීය** (අසන ප්‍රශ්නයට එක එල්ලේ පිළිතුරු දීම)
2. **විභජ්ජ ව්‍යාකරණීය** (බෙදා වෙන්කොට ප්‍රශ්න විසඳීම)
3. **පටිපුච්ඡා ව්‍යාකරණීය** (ප්‍රශ්න අසා ඔහුගේ පිළිතුරින් ප්‍රශ්න විසඳීම)
4. **ඨපනීය ව්‍යාකරණීය** (අනවශ්‍ය ප්‍රශ්නවලට පිළිතුරු නොදී සිටීම)

යනුවෙන් එය විග්‍රහ කළ හැකි ය.

බුදුරදුන් තම ශ්‍රාවකයාට ධර්මාවබෝධය ඇති කිරීම සඳහා උපමා - උපමේය උපයෝගී කරගත්හ. නන්ද තෙරුන්ට ධර්මය අවබෝධ කිරීමේ දී බුදුරදුන් එම තෙරුන් දිව්‍ය ලෝකයට කැඳවාගෙන යන අතර මඟ දී වැඳිරියක් පෙන්වා දිව්‍ය ලෝකයේ දී ජනපද කල්‍යාණිය වැඳිරියකට උපමා කොට දහම් දෙසීම, තවත් අවස්ථාවක දී සංසාරය ගංගා ජලයටත් ධර්මය පහුරකටත් උපමා කළ සේක. එමෙන්ම ධම්මපදයේ දී සිත නගරයකට ද, ශරීරය මැටි කළයකට ද, ප්‍රඥාව ආයුධයකට ද, කෙලෙස් සිතිවිලි මාරයාට ද උපමා කොට ඇත. ත්‍රිපිටකයේ දක්වෙන අලගද්දූපමා, සාරෝපම, කකචූපම, රථවිනීත, චුල්ලහත්ථිපදෝපම ආදී

සූත්‍රවලින් ද උපමා මගින් බුදුරදුන් ශ්‍රාවකයාට ධර්මාවබෝධ කිරීමට උත්සාහ ගෙන ඇති අයුරු පැහැදිලි වේ.

ශ්‍රාවක පිරිසගේ ධර්මඥාණය වර්ධනය කිරීම සඳහා බුදුරදුන් විවිධ ලෙසින් කළ දේශනා ත්‍රිපිටක සාහිත්‍යයෙන් පැහැදිලි වේ. අම්බට්ඨික රාහුලෝවාද සූත්‍රය අනුව රාහුල තෙරුන් බොරු කීමට ඇබ්බැහිවී සිටි බව සඳහන් වේ. බුදුරදුන් ජල බඳුනක ජලය හිස් කිරීමට රාහුල තෙරුන්ට උපදෙස් දී ලජ්ජාවෙන් තොරව බොරු කියන පුද්ගලයාගේ ගුණ දහම හිස් ජල බඳුනක් බව දේශනා කරයි. තම දරුවා මළ සොවින් කල්ගෙවූ කිසාගෝතමියට සැමට මරණය පොදු බව වටහා දීමට නොමළ ගෙයකින් අබ මිටක් ගෙන ඒමට නියම කිරීම, ගුරුවරයා විසින් ආරාමයෙන් එළවා දැමූ චුල්ලපන්ථක තෙරුන්ට බුදුරදුන් විසින් පිහිට වී යථාර්ථය වටහා දීමට උපදෙස් දීම ආදී අවස්ථා මගින් පැහැදිලි වන්නේ බුදුරදුන් තම ධර්මය ශ්‍රාවකයාට පැහැදිලි කර දීමට දැරූ උත්සාහයයි.

බුදුරදුන් ශ්‍රාවක භික්ෂූන්ට දේශනා කළ ධර්මය එම ශ්‍රාවකයන් ලවා අනෙකුත් භික්ෂූන්ට සහ ගිහි ජනතාවට දේශනා කරවී ය. තමන් වහන්සේ මෙන් ශ්‍රාවක තෙරවරුන් ව්‍යක්ත විශාරද ධර්ම දේශකවරුන් කිරීමට ගත් උත්සාහයක් හා ක්‍රම ශිල්පයක් ලෙස එය හැඳින්විය හැකි ය. බුදුරදුන් දේශනා කළ දම්සක් පැවතුම් සූත්‍රයේ අන්තර්ගත කරුණු සාරිපුත්ත තෙරුන් විසින් සම්මා දිට්ඨි සූත්‍රයෙන් ජනතාවට දේශනා කොට ඇත. එමෙන් ම එහි දැක්වෙන චතුරාර්ය සත්‍යය නැවත සච්ච විභංග සූත්‍රය මගින් ද දේශනා කොට ඇත. තම ශ්‍රාවක භික්ෂූන් හොඳින් ධර්මය දේශනා කරනු දැකීම බුදුරදුන්ට ඉමහත්

සතුට ගෙනදෙන්නක් විය. දිනක් නන්ද තෙරුන්ගේ ධර්ම දේශනයක් අසා සිටි බුදුරදුන් ඊට ප්‍රශංසා කළහ. තම ශ්‍රාවකයන්ගේ දක්‍ෂතා අගය කළ බව ඒ අනුව පැහැදිලි වන අතර අග තනතුරු ප්‍රදානය කරමින් එම තෙරුන්ගේ දක්‍ෂතා අගය කොට ඇති අයුරු ද පැහැදිලි වේ.


බුදුරජාණන් වහන්සේ ශ්‍රාවකයන්ට ධර්මය දේශනා කිරීමේ දී ගද්‍ය හා පද්‍ය භාවිතය උපයෝගී කරගෙන ඇති බව ද පැහැදිලි වෙයි. තම ශ්‍රාවකයාගේ චරිත ස්වභාවය තේරුම් ගන්නා බුදුරදුන් ඔවුන්ට පහසුවෙන් ධර්මය අවබෝධය කිරීම සඳහා මෙම ක්‍රම අනුගමනය කොට ඇති බව පැහැදිලි ය. එක්තරා දෙවියෙකු බුදුරදුන් වෙත පැමිණ නැඟී සිටින දේ අතුරින් ශ්‍රේෂ්ඨ කුමක් ද? ආදී ප්‍රශ්න පද්‍ය භාෂාවෙන් විමසා ඇත්තේ, "**කිංසු උපත්තං සේට්ඨං............**" ආදී ලෙසයි. ඊට පිළිතුරු දෙන බුදුරදුන් "**විජ්ජා උප්පතත්තං සේට්ඨං.......**" නැඟී සිටින දේ අතුරින් විද්‍යාව ශ්‍රේෂ්ඨ වන බව ද ආදී වශයෙන් පිළිතුරු දී ඇත්තේ ද පද්‍ය භාෂාවෙනි. මංගල කරුණු පද්‍යයෙන් විමසූ විට බුදුරදුන් පිළිතුරු දෙන ලද්දේ ද පද්‍යයෙනි. ආලවක සූත්‍රය ද එබඳු ය. එමෙන් ම ධර්ම දේශන පැවැත්වීමේ දී බුදුරදුන් උපයෝගී කරගත් දේශන හා සාකච්ඡා ක්‍රමයේ දී ගද්‍ය භාෂාව ද බොහෝ සෙයින් අනුගමනය කොට ඇති අයුරු විනය හා සූත්‍ර පිටකයේ බොහෝ සූත්‍රවලින් පැහැදිලි වේ.

බුදුරදුන් හමුවට එන සෑම අයෙකු ම බුදුරදුන්ගෙන් ධර්මය අසා පැහැදී සතුටට පත්ව ප්‍රශංසා කොට නැවත නිවෙස් බලා ගියහ. ඇතැම්හු බුදුරදුන් හමුවෙහි පැවිදි වූහ. බුදුරදුන්ගේ ධර්ම දේශනා ඇසුවෝ "**අභික්කන්තංවා**

භෝ ගෝතම අභික්කන්තං ගෝතම, සෙය්‍යථාපි භෝ ගෝතම නික්කුජ්ජිතංවා උක්කුජ්ජෙය්‍ය පටිච්ඡන්නංවා විවරෙය්‍ය මූල්හස්සංවා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරේනවා තේල පජ්ජෝතං ධාරෙය්‍ය........." යනුවෙන් යටිකුරු කළ දෙයක් උඩුකුරු කළාක් මෙන් ද, වැසුණු දෙයක් විවෘත කළාක් මෙන් ද, මං මුළාවූවෙකුට මඟ පෙන්වූ මෙන් ද, අඳුරට පහනක් දැල්වූවාක් මෙන් ද ධර්මය මනා ලෙස වැටහුණු බව ඉමහත් සතුටින් ප්‍රකාශ කරමින් බුදුරදුන්ට ප්‍රශංසා කළහ. මේ තුළින් පැහැදිලි වන්නේ බුදුරජාණන් වහන්සේ ශ්‍රාවකයන්ට ධර්මය දේශනා කිරීමට උපයෝගී කරගත් ක්‍රම ශිල්ප අතිශය සාර්ථක බවයි.

# 03

# බුදු දහම හා ධනාත්මක චින්තනය



ධනාත්මක චින්තනය (Positive Thinking) පිළිබඳ නූතන මනෝ විද්‍යාඥයින් හා අධ්‍යාපනඥයින් විශේෂ අවධානයක් යොමුකර ඇති බව පෙනේ. මීට දෙදහස් පන්සිය පනස් වසරකට පෙර ලොව පහළ වූ බුදුරජාණන් වහන්සේ ද මේ පිළිබඳ ගැඹුරින් අවධානය යොමු කොට

ඇත. බුද්ධ චරිතය, බුද්ධ දේශනා හා ශ්‍රාවක චරිත අධ්‍යනය කරන විට ධනාත්මක චින්තනයේ ඵලය මැනවින් පිළිබිඹු වේ.

බුදු වීමට දස පෙරුම් දම් පිරූ බෝසතුන් ඒ තුළින් ධනාත්මක ආකල්ප අනුව ක්‍රියාකළ සේක. උන් වහන්සේ පිරූ වීර්ය පාරමිතාව සහ අධිෂ්ඨාන පාරමිතාව තුළින් ධනාත්මක චින්තනය කැපී පෙනේ. එමෙන් ම බුදු වූ ආත්මයේ ඉපදුණු විගස ප්‍රකාශ කළ **"අග්ගෝ හමස්මි ලෝකස්ස..."** යනාදී උදාන වාක්‍යය, සත් පියුම් මත ගමන් කිරීම, සතර පෙර නිමිති දැක අධිෂ්ඨානශීලීව ගිහිගෙය අත්හැර පැවිදි වීම, සත්‍ය සොයා යාම, අවුරුදු සයක් දුෂ්කර ක්‍රියා කරමින් කළ උත්සාහය ආදී අවස්ථා විශේෂිත අවස්ථාවන් වේ.

තම අරමුණ ඉටුකර ගැනීමේ දී විවිධ බාධා සහ දුෂ්කරතාවන්ට මුහුණ පෑමට සිදුවෙයි. එම බාධක හා දුෂ්කරතා ජය ගැනීමට තම නොසැලෙන චින්තනය වෙසෙසින් ම වැදගත් වෙයි. බෝ මුල වෙත පැමිණි බෝසතුන් බුදුවීම සඳහා ඇතිකරගත් චතුරංග වීර්යය ධනාත්මක චින්තනයේ සුවිශේෂ අවස්ථාවකි.

1. සිරුරේ සම් ගැලවී විසිර ගියත් බුදු වී මිස නොනැගිටිමි.
2. සිරුරේ නහර ගැලවී විසිර ගියත් බුදුවී මිස නොනැගිටිමි.
3. සිරුරේ ඇට කටු ගැලවී විසිර ගියත් බුදුවී මිස නොනැගිටිමි.
4. සිරුරේ මස් ලේ විසිර ගියත් බුදු වී මිස නොනැගිටිමි.

මෙලෙස ඇති කරගත් අධිෂ්ඨානය නිසා බුද්ධත්වය වැනි උත්තරීතර පදවියක් ලබා ගැනීමට උන්වහන්සේ සමත් වූහ. දිව්‍ය බ්‍රහ්ම මනුෂ්‍යාදීන්ගේ වැඳුම් පිදුම්වලට ලක්වූහ. අධිෂ්ඨානශීලී නොසැලෙන චින්තනයකින් ක්‍රියාකළ නිසා බුදු පදවිය හිමිකර ගැනීමට බෝ සතුන්ට හැකිවූවා සේ ඕනෑම පුද්ගලයෙකු නොසැලෙන සිතකින් ක්‍රියා කරන්නේ නම් ලද නොහැකි ජයග්‍රහණයක් නොමැත.

යම් ක්‍රියාවක් ආරම්භ කිරීමේ දී "මට පුළුවන්, මම ප්‍රතිඵල ලබා ගන්නවා, මම දිනනවා" යනා දී හැඟීමෙන් යුතුව ක්‍රියාකිරීමෙන් සාර්ථක ප්‍රතිඵල ලබාගත හැකියි. එසේ නොවී යම් ක්‍රියාවක් ආරම්භයේ දී එහි ප්‍රතිඵල ගැන සැකයක් ඇති කරගෙන ක්‍රියා කරන්නේ නම් ඉන් සාර්ථක ප්‍රතිඵල නෙලාගත නොහැකි ය. "නැහැ, බැහැ" ආදී සෘණාත්මක ආකල්පයෙන් ක්‍රියා කරන්නාට ජීවිතයේ සාර්ථක ප්‍රතිඵල නෙළා ගැනීමට නො හැකි ය. හැම දෙයක් ම අමාරු, අපහසු, නොහැකි දේ ලෙස සිතීම පරාජිතයාගේ ස්වරූපයයි. එසේ සිතන කිසිවෙකුට සමාජයේ ශ්‍රේෂ්ඨ පුද්ගලයන් විය නොහැකිය. ඇතැමුන් ජීවිතයේ දියුණුව දෛවයට භාර කරයි. "මේ අපි ලබා උපන් හැටි, අපේ කරුමෙ තමයි, ලැබෙන දෙයක් ලැබේවි" මෙසේ සිතා ක්‍රියා කරන්නා සමාජයේ පසු පසට යයි. දියුණුව ලබා සමාජයේ ඉදිරියට යාමට නොහැකි ය. සමාජයේ දියුණුව කරා පිය නගනුයේ අලුත් දේ සිතන, නිර්මාණශීලීව කටයුතු කරන පුද්ගලයන් පමණි.

"නාචින්තයන්තෝ පුරිසෝ විසේස මධිගච්ඡති"

යන බුද්ධ දේශනාව අනුව අලුත් දේ නොසිතන පුද්ගලයා දියුණුවට පත් නොවන බව සඳහන් වේ. අද

කළ යුතු දේ දැන් මහන්සියි, දැන් බැහැ, දැන් සීතලයි, දැන් උෂ්ණයි, දැන් නිදිමතයි කියා පසුවට කල් දැමීම තම පරිහානියට පමණක් බාධාවක් පමණක් නොව පසුතැවීමට පවා හේතු වෙයි. සෑම මිනිසෙකු තුළම නිර්මාණශීලී දක්ෂතා පවතී. ඒවා ඉස්මතු කර ගත හැක්කේ උත්සාහය හා චිත්ත ශක්තිය තුළිනි. සිතේ ඇතිවන අවිදු, පසුබට හැඟීම් නිසා පුද්ගලයෝ බොහෝ පිරිස් පරිහානය කරාම යති.

පුද්ගල අපේක්ෂා සාර්ථක කර ගැනීම සඳහා පුද්ගල චර්යාව හා සිතුවිලි කෙසේ සකස් විය යුතු ද යන්න බුදුරදුන් සූත්‍ර ධර්ම රැසකින් පෙන්වා දී ඇත. කරණීය මෙත්ත සූත්‍රය අනුව තමා පළමුව "අත්ථ කුසල" පුද්ගලයෙකු විය යුතු ය. අත්ථ යනු අරමුණයි. කුසල යනු දක්ෂතාවයයි. තම අරමුණ ඉටුකර ගැනීමට තමා දක්ෂයෙකු වීම මෙහිදී අදහස් කෙරෙයි. අරමුණ සාර්ථක කර ගැනීමේ දී තමා විසින් ඇතිකරගත යුතු දක්ෂතා 15ක් පිළිබඳ කරණීය මෙත්ත සූත්‍රයේ සඳහන් වෙයි. එම කරුණු 15 අතර "**සක්කෝ**" යන පළමු ගුණය සුවිශේෂ වේ. පොත පත කියවීමෙන්, ලිවීමෙන් අසා හෝ බලාසිටීමෙන් නැතහොත් ප්‍රගුණ කොට පුරුදු පුහුණු කර ගන්නා විවිධ දක්ෂතා පුද්ගලයා ඇති කර ගැනීම ඉතා වැදගත් වෙයි. අදක්ෂ පුද්ගලයාට සමාජයේ ඉදිරියට යාමට නොහැකි ය. මෙලොව පරලොව දෙලොවම පරාජිතයකු වෙයි.

කුසල් හෙවත් දක්ෂතා දියුණු කර ගැනීම දෙලොව හිත සුව පිණිසත්, අකුසලය අයහපත පිණිසත් හේතු වෙයි. අතීතයේ හෝ පෙර ආත්මයක පුරුදු පුහුණු කර ගත් කුසල් ඇත්නම් මෙලොව දී හෝ පරලොවදී තම

හිතසුව පිණිසත් අකුසලය අහිත පිණිසත් පැවතීම ලෝක ස්වභාවයකි. එනිසා පුද්ගලයා පරිත්‍යාගය, මෛත්‍රිය, කරුණාව, ප්‍රඥාව යන කුසල සිතුවිලි උපදවාගෙන ඒ අනුව ක්‍රියා කළ යුතු ය. බුදු දහම පුද්ගලයාගේ දියුණුවට මඟ පෙන්වා ඇති දහමකි. ඒ තුළ කිසිඳු බල කිරීමක් නොකරයි. බුදුරදුන් දිනක් බමුණෙකු අමතා "බමුණ, ඔබ කැමතිනම් ඉදිරියට යන්න, අකැමැතිනම් ඉදිරියට නොඑන්න" යනුවෙන් දේශනා කොට ඇත. ඉන් පැහැදිලි වන්නේ සිතා මතා බුද්ධියෙන් තීරණ ගැනීමට බුදු දහම පුද්ගලයාට නිදහස දී ඇති අයුරුයි. බමුණා අමතා බුදුරදුන් එහිදී පැහැදිලි කර දෙන ලද්දේ දියුණුවකරා පිය නැඟීමට නම් පුද්ගල චිත්ත ශක්තිය, බුද්ධිය හා උත්සාහය අවශ්‍යම බවයි. යම් ක්‍රියාවක් කිරීමේ දී,

1. ආරම්භ ධාතු (යමක් ආරම්භ කිරීමට)
2. නික්ඛම ධාතු (ඉදිරියට කරගෙන යාමට)
3. පරක්කම ධාතු (බාධා මැඩගෙන යාමට)
4. ථාම ධාතු (බලවත් වීර්යයෙන් කිරීමට)
5. ඨිති ධාතු (ස්ථාවරව සිටීමට)
6. උපක්ඛම ධාතු (උපක්‍රමශීලී වීමට)

උත්සාහය තිබිය යුතු ය. එසේ නොවුවහොත් ක්‍රියාවක් ඉදිරියට කරගෙන යාමට හෝ සාර්ථක ප්‍රතිඵල නෙළා ගැනීමට නොහැකි ය. තම ශක්තිය හා හැකියාව පිළිබඳ සැකයෙන් තොරව විශ්වාසවන්ත බව ඇතිකර ගත යුතු ය. තම හැකියාව තමා විසින් ම පිළිගෙන ආත්ම විශ්වාසයෙන් ක්‍රියා කිරීමෙන් පමණක්ම සාර්ථක ප්‍රතිඵල නෙළාගත හැකි ය. කුසීත කමින් පසුබැසීමෙන් ක්‍රියා කිරීමේ සෘණ මනෝභාවය දුරු කළ කල්හි තමා පිළිබඳ තමාට විශ්වාසය ගොඩනඟාගත හැකි ය. අලස


මානසික බවින් යුතු පුද්ගලයන්ට සමාජය තුළ දියුණුව සලසා ගත නොහැකි ය.

තමන් යම් ක්‍රියාවක් සාර්ථක ප්‍රතිඵල ලැබීමේ අරමුණින් කරගෙන යන කල්හි ඊට බාධා ඇතිවිය හැකි ය. බාධා ඇති වූ පමණින් උත්සාහය බිඳ දමාගත යුතු නොවේ. විකල්ප ක්‍රම තුළින් තම ජයග්‍රහණයේ දොරටු විවර කරගත යුතු ය. ඇතැමුන් තමන්ට ඇති ශක්තිය හඳුනා ගෙන නැත. වෙනත් අයෙකු දෙන උපදෙස් හෝ පිළිගෙන උනන්දුව ඇතිකර නොගනියි. එබඳු තැනැත්තාට දියුණු විය නොහැකි ය. සෑම ජයග්‍රහණයකට ම මාවතක් ඇත. ඒ මාවත තම බුද්ධියෙන් සොයා ගත යුතු ය. එහෙත් අනුන් දෙන උපදෙස් තමන්ට ගැළපේදැයි සිතා බැලීම ද කළ යුතු ය. උගතුන්, බුද්ධිමතුන්, ලේඛකයන් ඔවුන්ගේ ජීවිත ශ්‍රේෂ්ඨ බවට පත්කර ගෙන ඇත්තේ ස්වකීය ශක්තිය හඳුනාගෙන ක්‍රියා කිරීමෙනි. ඒ බව ඔවුන්ගේ චරිත අධ්‍යනයෙන් පැහැදිලි වෙයි.

එදා බුදුරදුන් ස්වකීය බුද්ධිය යොදවා ක්‍රියා කිරීමෙන් තිලොවටම ශ්‍රේෂ්ඨ නායකයෙකු බවට පත්විය. එම පිළිවෙත අනුගමනය කළ ගිහි - පැවිදි දෙපිරිස ද ලෝකයේ ශ්‍රේෂ්ඨත්වයට පත්ව දෙලොව දියුණුව සලසා ගත්හ. එම නිසා අප ආගමික ඉගැන්වීම මෙන්ම ශ්‍රේෂ්ඨ ලේඛකයන්ගේ ග්‍රන්ථ කියවීම, උගතුන්ගේ අදහස් උදහස් පිළිගෙන ක්‍රියා කිරීම, ඇහුම්කන් දීම, අධ්‍යනය කිරීම, නිරීක්ෂණ හා පරීක්ෂණ කිරීම කළ යුතු ය. එසේ කිරීමෙන් සෘණාත්මක චින්තනයෙන් මිදී ධනාත්මක චින්තනයක් තුළින් සෑම ක්‍රියාවකම ජයග්‍රහණය උදාකර ගතහැකි ය.

# 04

# බුදු දහම හා නායකත්ව ගුණාංග



මෙලොව සිටි ශ්‍රේෂ්ඨ නායකයා බුදුරජාණන් වහන්සේ ය. මනුෂ්‍ය ලෝකයට පමණක් නොව දිව්‍ය හා බ්‍රහ්ම ලෝකයට ද උන්වහන්සේ නායකයාණන් වූ සේක. නායකයා කිසි විටෙක තමන් නායකයා යනුවෙන් නොකියයි. තමන්ගේ යටතේ සෙසු අය සිටිය යුතු බව ද

නොකියයි. සමාජය විසින් හොඳ හැසිරීමක් ඇති පුද්ගලයා තම නායකත්වයට තෝරා ගනියි. සමාජයේ සෙසු අයට වඩා දැනුම, හොඳ හැසිරීම, යහපත් ආකල්ප, විවිධ වූ දක්ෂතා, සෙසු අයට වඩා බුද්ධියෙන් යුතු බව, සුහදත්වය, ඉවසීම ආදී ගුණාංග කැටි වූ පුද්ගලයා නිරායාසයෙන් ම සමාජ නායකයෙකු බවට පත් වේ. බුදුරදුන්ට සියලු හැකියා, දක්ෂතා හා බුද්ධිමත් බව තිබූ අතර තමා කිසිවිටෙකත් නායකයෙකු බව ප්‍රකාශ නොකළ හ. උන් වහන්සේගේ හැසිරීම, ධර්ම දේශනාවෙහි අන්තර්ගත කරුණු තම ජීවිතවලට සමීපබව, පරාර්ථකාමී බව නිසා ජනතාව උන්වහන්සේ සැබෑ නායකයෙකු බව කල්පනා කොට නායකත්වයට පත්කර ගත්හ. එය ඡන්දයකින් වෙනත් අයෙකුගේ පත් කිරීමකින් නොව ආධ්‍යාත්මිකව තෝරා ගැනීමකි.

තම අභිවෘද්ධිය ගැන නොව සෙසු අයගේ අභිවෘද්ධිය වෙනුවෙන් ක්‍රියා කළ යුතු ය. සමාජයේ සෙසු අයගේ අවශ්‍යතා මැනවින් වටහා ගැනීමේ හැකියාවක් මෙන්ම තාර්කික ඥානය ද ඇතිකර ගැනීම ඉතා වැදගත් ය. කිසිවිටෙකත් අනුන්ගේ සිත් රිදෙන අයුරින් කතා කිරීම, හැසිරීම නොකළ යුතු ය. කතා කරන දෙය තුළින් සෙසු අයගේ බුද්ධිය අවදිකළ යුතු ය. සෙසු අයගේ හැසිරීම හා කතාබහ කිරීමට වඩා ආදර්ශමත් වෙනසක් නායකයෙකු තුළ තිබිය යුතු ය. යමෙකු පටු අරමුණු ඉටු කර ගැනීම සඳහා ආයාශයෙන් හොඳ ගුණ පෙන්වා අනුන් රවටා තමන් යටතේ තබා ගැනීම හොඳ ලක්ෂණයක් නොවේ. තමා යම් ගුණාංගයකට අනුව ක්‍රියා කිරීමේ දී අනුන් මුළා කිරීමේ අදහසින් නොව අවංක ලෙසම එම ගුණයට අනුගත

විය යුතු ය. අනුන්ගේ ගැටලුවලට කෙටි කාලීන හා දිගු කාලීන විසඳුම් ඉදිරිපත් කිරීමේ හැකියාව ඉතා වැදගත් වෙයි. නිරතුරුව ධනාත්මක ආකල්ප වලින් යුතුව මනා පෞරුෂයකින් කටයුතු කිරීමට වගබලා ගත යුතු ය. යම් සමාජයක යමෙකු නායකත්වයට පත්වූ පසු එම සමාජය ප්‍රගතියට මිස අගතියට යාමට කිසි විටෙක උපදෙස් නොදිය යුතු ය. යහපත් ගති පැවතුම් නිසාම කැපී පෙනෙන ගුණාංග විහිදීම තුළින් නායකත්වය ඔපවත් වෙයි. සැබෑ නායකත්වයක් තුළ තිබිය යුතු විශේෂ ගුණාංග රැසක් වේ.

## 1. ආධ්‍යාත්මික ගුණය

කවර සමාජයක හෝ ස්ථානයක නායකයා හෝ ප්‍රධානියා බාහිර ස්වරූපයට වඩා අධ්‍යාත්මය තුළ ගුණ ධර්ම ඇත්තෙකු විය යුතු ය. මෛත්‍රිය, කරුණාව, දයාව ආදී ගුණාංග අවංක ලෙසින්ම පැවතීම ඉතා වැදගත් ය. සමාජයේ නාමික වශයෙන් නායකයන් කොතෙකුත් සිටී. ඔවුන්ගේ උපදෙස් පිළිගැනීමට බොහෝ දෙනා අකැමැති ය. ඊට හේතුව නායකයා ගුණධර්ම වලින් යුතු නොවීමයි. ඔහු යුතුකම් මනාව හඳුනා නොගනියි. සිත් රිදෙන ලෙසින් ආමන්ත්‍රණය කරයි. ආවේගශීලී බවින් එසේ කටයුතු කරනුයේ හදවතේ යහපත් සිතිවිලි නොමැති නිසයි. තමන් උතුම් ගුණාංගවල පිහිටිය යුතු අතර තම අනුගාමිකයින්ගේ ද චරිතවලට එය ආදර්ශයක් වන ලෙසින් ක්‍රියා කළ යුතු ය. "අපේ නායකයා ඉතා හොඳ කෙනෙක්" යැයි කියනුයේ හොඳ ගතිගුණ ඇත්නම් පමණි. එසේ නොවී අනුගාමිකයන්ට බලය පෙන්වමින් දුර්ගුණ ඉස්මතු වන ලෙසින් ක්‍රියා කරන්නේ නම් ඔහු නායකත්වයට සුදුසු නොවේ.

## 2. ආදර්ශවත් බව

නායකයා යහපත් ක්‍රියාවල යෙදෙන විට අනුගාමික පිරිස ද එබඳු ක්‍රියාවල නියුතු වෙයි. යහපත් වචන කතා කිරීම, ප්‍රිය මනාපව හැසිරීම් ආදිය සෙසු අයද ආදර්ශයට ගනී. නායකයා දූෂිත ක්‍රියාවල යෙදෙන විට අනුගාමික පිරිස ද එබඳු ක්‍රියාවල යෙදෙයි. සෙසු අයට තමාගේ වරදක් කීමට නොහැකිවන ලෙසින් ක්‍රියා කිරීමට තමා වගබලා ගත යුතු ය. ගව රැලක නායකයා ඇදට යන විට සෙසු ගවයන් ද ඒ ආකාරයෙන් ම ගමන් කරයි. නායකයා නිවැරදි ආකාරයට ගමන් කරන විට අනුගාමික පිරිස ද නිවැරදිව ගමන් කරයි. මෙහිදී අවංක බව වෙසෙසින් ම බලපානු ලබයි. වැද්දා යනු සතුන් මරා දූෂිත අයුරින් ජීවත්වන පුද්ගලයෙකි. ඔහු අනුන්ට විවිධ අකටයුතුකම් හි යෙදෙමින් සෙසු පිරිසට යහපත් උපදේශ ලබා දීම ද හාස්‍යජනකය. එනිසා පළමුව තම සුදුසු යහගුණයන්හි පිහිටා අනුගාමික පිරිසට උපදෙස් ලබාදිය යුතු ය. එවිට නායකත්වය ද අභිමානවත් වෙයි.

## 3. බාහිර පෙනුම

සැබෑ නායකයා ආධ්‍යාත්මික ගුණවලින් තම ජීවිතය අර්ථවත් කරගත් නමුත් බාහිර ස්වරූපය ද ප්‍රියශීලී විය යුතු ය. ඇඳුම් පැලඳුම් පාවහන්, හිස්වැසුම් හා පෞද්ගලික වශයෙන් පරිහරණය කරන දේ චාම් බවින් යුක්ත විය යුතු ය. සිතේ කෙතරම් යහපත් සිතිවිලි පැවතිය ද බාහිර වශයෙන් අපිරිසිදු බවක් ඇත්නම් සෙසු අය ඔහු ප්‍රිය නොකරයි. වර්තමානයේ ඇති ඇඳුම් විලාසිතා, මෝස්තර, රූපලාවන්‍ය ආදී පුහු දෙයින් නොව චාම් ඇඳුමින් පැලඳුමින් යුතුව සංස්කෘතික වශයෙන් සමාජය

පිළිගත් බාහිර ස්වරූපයක් තමා විසින් ම නිර්මාණය කරගත යුතු ය. තැනට සුදුසු බාහිර ස්වරූපයෙන් සැරසිය යුත්තේ සෙසු සමාජය අගයන ආකාරයටයි. එසේ නොවී අනුගාමිකයන්ගේ පිළිකුලට හා විවේචනයට ලක්වන අයුරින් සැරසී සිටීම සුදුසු නොවේ.

## 4. යහපත් චරිතය

තමා සතුව හොඳ චරිතයක් තිබීම සැබෑ නායකයෙකුට ඉතා වැදගත් ය. විවිධ දූෂිත ක්‍රියාවන් සිදුකොට චරිතය කැළැල් කරගත් පුද්ගලයාට සැබෑ නායකයෙකු විය නොහැකි ය. තමා දැනුවත්ව හෝ නොදැනුවත්ව යම් වැරදි සිදුවූ විට එය තම අනුගාමිකයෙකු හෝ පෙන්වා දුන්විට ඔහුට ප්‍රශංසා කොට එම වරද නිවැරදි කරගත යුතු ය. හොඳ චරිතවත් පුද්ගලයාට කොතෙකුත් අභූත අසත්‍ය චෝදනා නැගුවත් සමාජය එය නොපිළිගනී. නායකයා ඉන් පසුබැසීමට ලක් නොවෙයි. දිනක් බුදුරදුන් භික්ෂූන් අමතා ප්‍රකාශ කළේ තම චරිතයේ අඩුලුහුඬුකමක් ඇත්නම් එය පෙන්වා දෙන ලෙසයි. එහිදී භික්ෂූන් ප්‍රකාශ කළේ බුද්ධ චරිතයේ කිසිඳු වැරදි තැනක් දැකිය නොහැකි බවයි. එනිසා තමාගෙන් වැරදි සිදු නොවීමට වගබලා ගත යුතු ය. රෝගී පුද්ගලයෙකුට ප්‍රතිකාර සෙවිය ද චරිතය දූෂිත වූ විට එය කෙසේවත් පිරිසිදු කළ නොහැකි බව සඳහන් වේ. බුදු දහම අගයන ශ්‍රද්ධා - බුද්ධි - විතර්ක ආදී චරිත ලක්ෂණ සෑම නායකයෙකුම අනුගමනය කළ යුතු ය.

## 5. ඉවසීම

නායකයෙකු වීමට ඉවසීම තරම් හේතුවන වෙනත් ගුණාංගයක් නැති තරම් ය. තමන් වෙත අනුන් එල්ල

කරන ගැරහුම්, නින්දා, අපහාස, පහරදීම් ඉවසාගෙන සිටී නම් එයම නායකත්වයේ ප්‍රධාන ලක්ෂණයයි. කිපෙන සුළු පුද්ගලයාට නායකයෙකු විය නොහැකි ය. යම් තැනක ආවේගශීලී කිපෙනසුලු පුද්ගලයෙකු නායකත්වයට පත්වී ඇත්නම් ඔහුට මහත් විපාකයන්ට මුහුණ දීමට සිදුවෙයි. සෑම ගැටලුවක්ම සුහදත්වයෙන්, සාකච්ඡා මාර්ගයෙන් විසඳීමේ හැකියාව තිබිය යුතු ය. කුමන හේතුවක් නිසාවත් කම්පාවට පත් නොවිය යුතු ය. බුදුරදුන්ට මාගන්ධිය බැමිණිය, චිංචිමානවිකාව, දේවදත්ත ආදී පුද්ගලයන් විවිධ ලෙසින් නින්දා අපහාස හා වද වේදනා සිදු කළහ. ඒ සෑම දෙයක්ම ඉවසාගෙන සිටීම නිසා උන් වහන්සේ විශිෂ්ට නායකයෙකු බවට පත්විය. තමන්ට අනුන් කෙතරම් පහර දුන්න ද නින්දා අපහාස කළ ද තමා ඒ කිසිවක් නොඇසුණා මෙන් සිටිය යුතු ය.

## 6. නිහතමානී බව

අනුන්ට වඩා තමන් උසස් යැයි නායකයෙකු කිසි විටෙකත් අහංකාර බවට පත් නොවිය යුතු ය. අවස්ථාවන්ට අනුව ස්ථානෝචිත ප්‍රඥාවෙන් ක්‍රියා කළ යුතු ය. ඇතැම් විට අනුගාමිකයන් තම දරුවන්සේ ද, තවත් විටෙක මිතුරන් සේ ද, තවත් විටෙක නෑයන් සේ ද සිතා ක්‍රියා කළ යුතු ය. තමන් උසස් උගත් නායකයෙකු යැයි ද සෙසු පිරිස තමා යටතේ සිටිය යුතු පහත් පිරිසක් යැයි ද කිසි විටෙකත් නොසිතිය යුතු ය. තමා නායකයෙකු යැයි නිතර ප්‍රකාශ කරමින් සෙසු අය අපහසුතාවට පත් කරන පුද්ගලයා අවමානයට ලක්වෙයි. ගරු කළ යුතු, ප්‍රශංසා කළ යුතු අවස්ථාවල ගරු කිරීමත්, ප්‍රශංසා කිරීමත් අගය කිරීමත් කළ යුතු ය.

## 7. අනුකම්පාව

තම අනුගාමිකයින් තළා පෙලා කටයුතු කිරීම නියම නායකත්වය නොවේ. අනුන්ට විපතක්, රෝගයක්, අසතුටු බවක් ඇතිවූ විට ඔහු සමඟ සුහදව කතාබහ කොට උපකාර කිරීම ශ්‍රේෂ්ඨ ගතියකි. ආර්ථිකමය වශයෙන් උදව් උපකාර කිරීම, සැබෑ නායකත්ව ලක්‍ෂණයකි. අනුගාමිකයෙකු ගේ විපතක දී හදවත කම්පනයට පත් වී උපකාර කිරීම උතුම් මිනිස් ගුණයක් ලෙස ද සඳහන් කළ හැකි ය.

## 8. සමානාත්මතාවය

සියලු දෙනා එක හා සමාන ලෙස සිතා සැළකීම නායකයෙකු සතුවිය යුතු උතුම් ගුණාංගයකි. ජාති, කුල, ආගම්, දුප්පත්, පොහොසත්, කළු සුදු ආදී ලෙසින් වර්ග කොට විවිධ ලෙසින් නොසැලකිය යුතු ය. කිසිඳු භේදයක් නොසිතා සමාන ලෙසින් සලකා කටයුතු කිරීම සමානාත්මතාවයයි. තම අනුගාමිකයන් අසමගි වීම, තම නායකත්වය නොපිළිගැනීම නායකයාට දොස් කීමට පෙළඹීම සිදු වන්නේ එක් එක් ආකාරයට වෙනස්කම් කිරීම නිසා ය. එනිසා කිසිඳු භේදයකින් තොරව සැමට එක හා සමානව සැලකීමට නායකයා වගබලා ගත යුතු ය.

## 9. ඍජු තීරණ ගැනීම

සැම දෙයක් පිළිබඳවම විමසුම් නුවණින් කටයුතු කරන නායකයා අනුගාමිකයන්ගේත්, රටේත්, සමාජයේත් යහපත උදාවන තීරණ ගත යුතු ය. යම් නායකයෙක් අදගත් තීරණයක් හෙට නැවත වෙනස් කරන්නේ නම් ඔහු පිළිබඳ අනුගාමිකයන්ට විශ්වාසනීය බවක් නැති වේ. කවර අභියෝග පැමිණිය ද සමාජයේ යහපත වෙනුවෙන් ගනු ලැබූ තීරණය එහි ප්‍රතිඵල ලැබීම දක්වා ම

එම මතයේ ම සිටිය යුතු ය. සාර්ථක ප්‍රතිඵල හමුවේ බාධක අභියෝග එවිට පරාජය කිරීමට හැකිවනු ඇත.

## 10. නම්‍යශීලී බව හා අන් අදහස් ගරු කිරීම

නම්‍යශීලී බව යනු අනුන්ගේ අදහස් උදහස්වලට ඇහුම්කන් දීමයි. සමාජයට හිතකර අදහස් සෙසු පුද්ගලයන් තුළ තිබේ. ඒ සඳහා තරාතිරම වැදගත් නොවේ. තරාතිරම නොබලා හොඳ අදහස්වලට ඉඩක් ලබාදීම නායකත්ව ලක්‍ෂණයකි. එමෙන් ම එය ක්‍රියාත්මක කිරීම සඳහා ද උත්සුක විය යුතු ය. නායකයෙකුගේ තීරණය අවසන් තීරණය නොවිය යුතු ය. ඊට හේතුව ඊට වඩා හොඳ තීරණ අනුගාමිකයන් තුළ තිබිය හැකි ය. එබඳු අවස්ථාවල දී නායකයාගේ තීරණය වෙනස් කිරීමට සිදුවේ. බුදුරදුන් මුල් කාලයේ දී පැවිදි වීමට කැමති සෑම අයෙකුම පැවිදි කළහ. පසුව සුදොවුන් රජු බුදුරදුන් හමු වී කුඩා ළමුන් පැවිදි කිරීමේ දී දෙමව්පිය අවසරය ද ලබා පැවිදි කරන ලෙස ඉල්ලා සිටියේ ය. බුදුරදුන් එම ඉල්ලීමට නම්‍යශීලී විය. පසුව භික්‍ෂූන්ට ළමුන් පැවිදි කිරීමේ අවසරය දීම, භික්‍ෂුණී සසුන ආරම්භ කිරීම ආදී අවස්ථා දෙස බලන විට බුදුරදුන් නම්‍යශීලී ගුණය අගය කොට ඇති බව පැහැදිලි වේ.

## 11. පරාර්ථකාමී බව

නායකත්වය යනු තමන්ගේ ජීවිතය අනුන්ගේ යහපත උදෙසා කැප කිරීමකි. අනුගාමිකයන් මෙන්ම සමාජයේ දිළිඳු, අසරණ, දුගී මගී යාචකා දී පිරිසට සංග්‍රහ කළ යුතු ය. අනුන්ගේ යහපත පිණිස තම කාලය, ශ්‍රමය, ධනය කැප කිරීමෙන් නායකත්වය ඇගයුමට ලක්වෙයි. අනුන්ගේ ප්‍රශංසා ලැබීමට ද එය හේතු වෙයි.

## 12. ධනාත්මක ආකල්ප

නායකයා උසස් ආකල්පවලින් යුතු අයෙකු විය යුතු ය. අනුගාමිකයන් පිළිබඳ ශුභවාදී ආකල්ප තිබිය යුතු ය. නැහැ, බැහැ, කම්මැලියි, පසුවට කල් තබමු වැනි සෘණාත්මක වචන ඇත්තේ පරාජිත මානසිකත්වයක් තුළයි. පුළුවන්, කරන්නම්, හොඳයි ආදී ධනාත්මක වචන භාවිතය සැබෑ නායකත්වය තුළින් දැකිය හැකි ය. සෑම කරුණක් දෙසම සුබවාදීව බලා යම් කටයුත්තක් සාර්ථකව නිම කිරීමේ හැකියාව තිබිය යුතු යි. ඒ තුළින් ආරම්භ කරන සෑම ක්‍රියාවකින් ම ජයග්‍රහණය ලබාගත හැකි ය.

## 13. සත්‍යවාදී බව

නායකයා සත්‍යවාදී අයෙකු විය යුතු ය. යමක් කියන්නේ ද එය සැබෑ ලෙසින් ම ඉටු කළයුතු අතර තමා කළ දේ පමණක් ප්‍රකාශ කිරීම කළ යුතු ය. එමෙන් ම අනුගාමිකයන් කිසිවිටෙකත් බොරුවෙන් නොරැවටිය යුතු ය. යම් නායකයෙකු අනුන් බොරු කියා රවටන්නේ ද එදින පටන් නායකයා ප්‍රකාශ කරන කිසිඳු වචනයක් විශ්වාස නොකරන තත්ත්වයට පත් වේ. නිරතුරුව සත්‍ය ප්‍රකාශ කිරීම සෙසු අයට ද ආදර්ශයකි. එම නායකයා සත්‍යවාදියෙකු ලෙස සමාජයේ පිළිගැනීමට ලක්වේ. ඔහු පිළිබඳව විශ්වාසවන්ත බවක් ඇතිවන අතර සැමගේ ගෞරවයට ද ලක්වෙයි.

## 14. උත්සාහවන්ත බව

සමාජයක නායකයා නිරතුරුව අධිෂ්ඨානශීලී උත්සාහවන්තයෙකුම විය යුතු ය. ඒ තුළින් ඔහු අත්පත් කර ගන්නා ජයග්‍රහන දැක අනුගාමික පිරිස ද උත්සාහයෙන් ක්‍රියා කිරීමට පෙලඹෙයි. වැඩ අතපසු

කරන, අලස පුද්ගලයාට නායකත්වයේ අභිමානය රැකගත නොහැකි ය. උත්සාහයෙන් තොරව නායකත්වයට ද පත්විය නොහැකි ය. සෑම පුද්ගලයෙකු ම සමාජයේ ශ්‍රේෂ්ඨත්වයට පත් වන්නේ උත්සාහය නිසාම ය.

## 15. ගැටලු විසඳීම

යම් හේතුන් නිසා අනුගාමිකයන් අතර ගැටලු ආරවුල් හටගනු ලබයි. නායකයෙකු වශයෙන් එම ගැටලුවලට හේතු නිවැරදිව හඳුනාගත යුතුය. දෙපාර්ශ්වයට ම අසාධාරණයක් නොවන විසඳුම් ලබාදීමේ හැකියාව නායකයා තුළ තිබිය යුතු ය. තමාගේ හිතවතාට සාධාරණයත් අනෙකාට අසාධාරණ විසඳුමකුත් ලබාදෙන නායකයා ඉක්මනින් ම අවමානයට ලක්වෙයි. විවිධ චෝදනාවන්ට ද ලක්වීමට සිදුවෙයි. එනිසා ගැටලු දෙස බුද්ධිමත්ව බලා සාධාරණ විසඳුම් ලබා දිය යුතු ය.

## 16. පෞරුෂ වර්ධනය


නායකයෙකු සතුව තිබිය යුතු සුවිශේෂම ලක්ෂණයකි, සමබර පෞරුෂ වර්ධනය, දැනුම ආකල්ප, කුලතාවයන්ගෙන් පිරිපුන්ව ක්‍රියා කළ යුතු අතර තම මතය හා හැසිරීම දුටු විට ඕනෑම අයෙකු තමාවෙත අවනත කර ගැනීමේ සුවිශේෂ හැකියාවකින් ද යුක්ත විය යුතු ය. දියුණු කායික හා මානසික වර්ධනයක් මෙන් ම ආකර්ශනීය වාග් මාලාවක් ද තිබීම ඉතා වැදගත් වේ. පවිත්‍ර ආකල්ප වර්ධනයෙන් යුතුව අනුගාමිකයන් ඉදිරියේ සුවිශේෂ හැකියවකින් ද යුක්ත විය යුතු ය. දියුණු කායික හා මානසික වර්ධනයක් මෙන්ම ආකර්ශනීය වාග් මාලාවක් ද තිබීම ඉතා වැදගත් වේ.

පවිත්‍ර ආකල්ප වර්ධනයෙන් යුතුව අනුගාමිකයන් තමන්ට අනුගත කර ගැනීමට හැකියාව මෙහි දී වෙසෙසින් වැදගත් වේ. එවිට නායකයා කවර ස්ථානයක දී වුව ද ගෞරවයට හා අභිමානයට ලක්වෙයි.

බුදු දහම හා බුදු සිරිත හා බැඳුණු ඉහත නායකත්ව ලක්ෂණ අපේ ජීවිතයට ද චරිතායනය කර ගැනීමටත් ඒවා ආදර්ශයට ගෙන ක්‍රියා කිරීමටත් හැකි නම් විශිෂ්ට මානවවාදී නායකයෙකු බිහිවෙයි.

# 05

# බුදු දහම හා සෞන්දර්යය



සෞන්දර්යය යනු සුන්දර බවයි. ගිහි පැවිදි දෙපක්ෂයට ම තම ජීවිතය සුවදායක කර ගැනීම සඳහා සෞන්දර්ය ආශ්වාදය අවශ්‍යය. බුදු දහම ලෝකෝත්තර

මෙන්ම ලෞකික සුවය සඳහා ද මඟ පෙන්වා ඇති දහමකි. සතුට, ප්‍රීතිය වින්දනයකි. එය අකුසලයක් නොවේ. තෘෂ්ණාවෙන් අයිතිකර ගැනීමේ හැඟීමෙන් හෝ ආත්මාර්ථකාමී බවින් තොර සෞන්දර්ය ආශ්වාදය විඳිය යුතු බව බුදු දහමෙහි සඳහන් වෙයි. බුදු දහම අගය කරන සෞන්දර්යය කාමුකත්වයෙන් තොර වින්දනයකි. සොබා දහම ඇසුරින් ලබන වින්දනයකි. කාමයෙන් ලබන වින්දනය තාවකාලික ය. ඉන් පසුව දුක් වේදනා ගෙන දෙයි. ඒ නිසා බුදු දහම පෙන්වාදෙන සොබා දහමේ නිරාමිස සුවය මිනිසාගේ කායික හා මානසික සුවය සලසයි.

සෞන්දර්ය ආශ්වාදය කෙරෙහි බලපවත්නේ පරිසරයේ අසිරිමත් සිදුවීම් ය. පායන හිරු, පියාසර කරන විහඟුන්, ගලායන ගංගා සහ දිය ඇලි, පිපෙන මල්, සැන්දෑ වලාකුළු, බැසයන හිරු, පායන සඳ, රුක්ගොමු, තණ බිම්, සුරතල් සතුන්, මද පවන්, කුරුළු ගී ඒ අතර වේ. මෙයට අමතරව ගීත ගායනා, නැටුම්, නාට්‍ය, උත්සව, චිත්‍ර, ආදිය ද මිනිසාගේ වින්දනය පිණිස හේතුවෙයි. එදිනෙදා ජීවිතයේ කායික හා මානසික පීඩාවන් දුරු කර ගැනීමටත් කායික මානසික සුවයෙන් යුතු ප්‍රීතිමත් ජීවිතයක් ගත කිරීම සඳහාත් සෞන්දර්ය රසවින්දනයෙන් මහඟු අනුබලයක් ලැබෙයි.

බුදුරජාණන් වහන්සේ බොහෝ සූත්‍ර ධර්ම දේශනා කොට ඇත්තේ පැවිදි සමාජය මුල්කර ගෙනය. එනිසා භික්ෂූන් වහන්සේලාට කම් සුවයේ ආදීනව විග්‍රහ කෙරෙන දේශනා බහුලව දේශනා කොට ඇත. නමුත් ගිහි සමාජයට කම් සුවය තහනම් කොට නැත. ඇතැම් උගතුන් බුදුරදුන්

භික්ෂූන් වහන්සේලාට දේශනා කොට ඇති කම් සුවයේ ආදීනව ගැන සඳහන් දේශනා පමණක් ගෙනහැර දක්වමින් සෞන්දර්යය රස වින්දනයට බුදු දහමින් අනුබල දී නැතැයි කියති. එසේ ප්‍රකාශ කරනුයේ බුදු දහමේ සියලු දේශනා අධ්‍යයන නොකිරීම නිසා ය. අධික ආශාවෙන් තොරව ගිහි සමාජයට කම් සුවය විඳීමට බාධාවක් නැත. ඒ තුළින් ආශ්වාද විඳීමට ද තහනමක් නැත. පසුව කම් සැපයේ ආදීනව වටහාගෙන ඉන් මිදෙන මඟ ද බුදු දහමේ සඳහන් වේ.

බුදුරදුන් ඇතැම් අවස්ථාවල ගායනය හා වාදනය ද අගය කොට ඇත. සක්කපඤ්හ සූත්‍රය අනුව දිව්‍ය ලෝකයේ සිටින පංචසික නම් වීණා වාදන ශිල්පියා බුදුරදුන් වෙත පැමිණ වීණාව වාදනය කරමින් තම පෙම්වතිය ගැන ගීතයක් ගායනා කළේ ය. එය ඇසූ බුදුරදුන්,

**"සන්සන්දන්ති වො පංචසික**
**තන්තිස්සරෝ ගීතස්සරේන**
**ගීතස්සරෝ තන්තිස්සරේන"**

"පංචසිකය ඔබගේ වාදනය සමඟ ගායනය ඉතා හොඳින් ගැලපෙයි." යනුවෙන් අගය කොට ඇත. මේ අනුව කලාත්මක ගායනය හා වාදනය ද බුදු දහමින් ඇගයුම් කෙරේ. නමුත් භාව ප්‍රකෝප කරවන රාගය වඩවන වේග රිද්ම ගීත හා සංගීතය ද වේග රිද්ම නැටුම් හා රැඟුම් ද බුදු දහමින් අගය නොකරයි. නූතනයේ දක්නට ලැබෙන පොප් සංගීතය, රැප් කිරීම ආදිය බුදු දහමින් ඇගයුම් නොකෙරේ. එවැනි නැටුම් ගැයුම් හා

වැයුම් වලින් සිදු වන්නේ කායික හා මානසික අසහනය, ආතතිය වර්ධනය වී පුද්ගලයා රෝගියෙකු වීමයි.

බුදුරදුන් නිරතුරුව සොබා දහම සහ ඊට ඇලුම් කරන භික්ෂුව අගය කොට ඇත. ගෝසිංගසාල සූත්‍රය අනුව ගෝසිංගසාල වනය යනු අතිශය චමත්කාරජනක වනයකි. පෑළ දිගින් රන්වන් හිරු බැසයත්ම රිදී රැස් විහිදුවමින් පුන්සඳ මඬල අහසේ පායා එයි. මුළු වනයම සඳරැස් දහරින් නැහැවී ඇත. මල් බඳුන් සේ සල් රුක්හි සුවඳ සල්මල් පිපී සුවඳ හමයි. වනයේ වැලිතලා මත මල්පෙති විසිරී සුවඳ විහිදුවයි. වරින්වර හමන මඳ පවන ගතට ගෙන එන්නේ සිසිලසකි. මේ සුන්දරත්වය දුටු සියොතුන් භාවනා කරන්නාක් මෙන් නිහඬව වනයේ අසිරිය විඳ ගනීයි. මෙවන් වූ සුන්දර සාල වනයට සැරියුත්, ආනන්ද, අනුරුද්ධ, රේවත, උපාලි යන තෙරවරු වැඩම කළහ. ගෝසිංගසාල වනය මෙවන් සුන්දරත්වයට පත්වී ඇත්තේ කෙසේදැයි එම තෙරවරු සාකච්ඡා කළහ. ආනන්ද තෙරුන් බහුශ්‍රැත භික්ෂුවක් නිසා මේ වනය සුන්දර වී ඇති බව ප්‍රකාශ කළේ ය. දිවැස් ඇති භික්ෂුවක් නිසා වනය සුන්දර වී ඇති බව අනුරුද්ධ හිමියන්ගේ අදහස විය. මෙම සියලු හිමිවරුන්ගේ අදහස් වලට සවන් දුන් බුදුරදුන් දේශනා කළේ "යම් භික්ෂුවක් මෙම වනයට පැමිණ බිම වාඩි වී කය ඍජුව තබා ගෙන කෙලෙසුන්ගෙන් මිදීමේ අධිෂ්ඨානයෙන් භාවනා කරන්නේ නම් එම භික්ෂුව නිසා වනය සුන්දර වන බවයි." මේ අනුව පැහැදිලි වන්නේ කෙලෙස් දුරු කිරීමට උත්සාහ දරන භික්ෂුව සිටින පරිසරය සුන්දර වන බවයි.

බුදු සිරිත තුළින් සොබා දහමේ අපූර්වත්වය මැනවින් පැහැදිලි වෙයි. බෝසතුන් මෙලොව ජනිත වූයේ මනහර සුවඳවත් සල්මලින් පිරි ලුම්බිණි උයනේ දී ය. බුදු බවට පත්වූයේ චමත්කාර පරිසරයක පිහිටි බෝ රුක් සෙවණේ ය. පිරිනිවන් පාන ලද්දේ සුවඳ සල් මලින් ගැවසුණු උපවත්තන සල් උයනේ දී ය. බෝසතුන් ආර්ය පර්යේසනය සඳහා යොදා ගෙන ඇති භූමි භාගය අතිශය මනරම් බව මජ්ඣිම නිකායේ අරිය පරියේසන සූත්‍රයෙහි සඳහන් වෙයි.

**"රමණීයො ඒත භූමිභාගො, පාසාදිකො'ච වනසන්ඩො**

**නදී ච සන්දති, සේතකා සුපතිට්ඨා රමණීයා "**

(මෙම ස්ථානය ඉතා රමණීයය. සිත් ප්‍රබෝධවත් කරවන පිපුණු කුසුමින් හා විහඟුන්ගේ සුමිහිරි ගීත නාදයෙන් යුතු වන ලැහැබකි. සුපිරිසිදු ජලධාරාවකින් යුත් ගංගාවක් ද ඇත. ගඟ දෙපස සුදු වැලිතලාවන් ය......) ආදී ලෙසින් බෝසතුන් එහි සුන්දරත්වය වර්ණණා කොට ඇත.

පරිසරයෙන් ආශ්වාදය ලැබූ බුදුරදුන් ශ්‍රාවක තෙරුන් ද සමඟ නිතර වැඩ සිටියේ ගිමන් හැරියේ සහ සැතපුණේ එළිමහනෙහි රුක් මුල්වලය. බුදුරදුන්ගේ වාසස්ථාන වූයේ රුක් මුල්, වන සෙනසුන්, පාළු සොහොන් බිම් ආදී ස්ථානයි. උන් වහන්සේ භික්ෂූන්ට සිවුරු සකස් කර ගන්නා ලෙස අනුදන වදාළේ මගධ කෙත් යායේ ස්වරූපය අනුවයි. සිවුර පාට කර ගැනීම සඳහා අනුදන වදාළේ ගස්වල මුල්, පොතු, කඳ, මල් තම්බා ලබාගත් ශාක සාරවලිනි. බුදුරදුන් වැඩම කළ ස්ථානවල දී දුටු චමත්කාරය තම මුවින් ම ප්‍රකාශ කොට ඇත.

"රමණීයං ආනන්ද වේසාලිං
රමණීයං උදේන චේතියං
රමණීයං ගෝතම්භ චේතියං
රමණීයං චපාල චේතියං"

යනාදී ලෙස ආනන්ද, විශාලා මහනුවර රමණීයයි, උදේන චෛත්‍යය රමණීයයි යනුවෙන් එය සඳහන් වෙයි. බුද්ධ කාලයේ විසූ උග්ගසේන නම් නාට්‍යකරුවාගේ නාට්‍ය සන්දර්ශන ද බුදුරදුන් නරඹා එහි අඩු ලුහුඬුකම් පෙන්වා දෙමින් ප්‍රශංසා කොට ඇත.

බුදුරදුන්ගේ ශ්‍රාවක තෙරවරුන්ගේ සහ ශ්‍රාවිකාවන්ගේ උදාන වාක්‍ය තුළින් ද සොබා දහමේ චමත්කාරය මැනවින් පිළිබිඹු වෙයි.

රමණීයානී අරඤ්ඤානී
යත්ථ න රමණී ජනෝ
වීතරාගා රමෙස්සන්ති
නතේකාම ගවේසිනෝ

යන ගාථා ධර්මයට අනුව සාමාන්‍ය ජනයා සිත් නොගන්නා වනය වීතරාගී රහතුන් සිත් අලවා වාසය කරන්නේ උන් වහන්සේලා කම් සැප නොසොයන නිසා බව පැහැදිලි වේ. එමෙන් ම බුද්ධ ශ්‍රාවක රහතන් වහන්සේලාගේ අරමුණ ගිහි සමාජයේ අරමුණ නොවන හෙයින් කාමයෙන් තොරව නිරාමිස සුවයක් විඳීම බව ද පැහැදිලි වේ.

ගමේවා යදිවාරඤ්ඤේ
නිම්නේවා යදිවා ථලේ
යත්ථ අරහන්තෝ තිට්ඨන්ති
තං භූමිං රමණෙය්‍යකං

සංයුක්ත නිකායේ රාමනෙය්‍යක සූත්‍රයේ සඳහන් ඉහත ගාථා ධර්මයෙන් විග්‍රහ වන්නේ ගමක, ආරණ්‍යයක, නිම්නයක හෝ තැනිතලාවක රහතන් වහන්සේ වැඩ සිටීනම් එම භූමි භාගය රමණීය වන බවයි.

බුද්ධ කාලයේ වැඩසිටි සච්චක තෙරුන් අජකරණී නම් ගඟ අසබඩ වැඩ සිටිමින් අවට පරිසරයේ සුන්දරත්වය වර්ණනා කොට ඇත්තේ

"තැති ගනී දක වැහි වලාවන්
විදාගෙන සිය සුදු පියාපත්
කොකුන් පියඹන නවාතැන් වෙත
නදිය අජකරණී
වේය මට හරි රමණී" යනුවෙනි.

කාළුදායි මහරහතන් වහන්සේ බුදු රජාණන් වහන්සේට තම මව්බිමට වැඩම කරන ලෙස ආරාධනා කරමින් කිඹුල්වත් පුරයේ මඟ දෙපසෙහි ඇති සොබා දහමේ අසිරිය ගාථා 60කින් වර්ණා කොට ඇත. එහි දක්නට ඇති,

දුමානි ඵුල්ලානි මනෝරමානී
සමන්තතෝ සබ්බ දිසා පවන්ති
පත්තං පහාය ඵලමාසසානං
කාලෝ මහාවීර භගීරතානං

යන ගාථා ධර්මයෙන් පැහැදිලි වන්නේ ගස්වල තිබූ පරණ කොළ හැලී අලුත් කොළ ලියලා ඇත. එම ගස්වල දලු ගිනිසිළු මෙන් බබළයි. මහා වීරයාණෙනි, දැන් ගමට වැඩම කිරීමට කාලයයි යනුවෙනි. පරිසරයේ තිබූ ගස්වල චමත්කාර බව මේ වර්ණාවෙන් මනාව ඉස්මතු වෙයි.

වනවච්ඡ තෙරුන් ද නිතර වනයෙහි වාසය කරමින් එහි අසිරිය විඳි රහත් තෙරනමකි. උන් වහන්සේ වනයේ අසිරිය වර්ණනාකොට ඇත්තේ,


**පෑදී දිය රැදී ඇති**
**පුළුල් ගල් තලා ඇති**
**වඳුරු මුව පිරී ඇති**
**දිය සෙවෙල් බැඳි ඇති**
**ඒ මහා පර්වතයෝ**
**මාගේ සිත් ගනිත්**

යනුවෙන් අසන්නා තුළ ද චිත්ත රූප මැවෙන පරිද්දෙනි. කාමයෙන් තොරව එසේ රහතුන් නිරාමිස සුවය විඳිනු ලැබුවේ ලොව්තුරු සුවය උදාකර ගැනීමේ පවිත්‍ර චේතනාවෙනි.

මෙලෙස බුදු දහම නිරතුරුව සොබා දහම තුළින් මැවෙන සුන්දරත්වය අගය කොට ඇති දහමකි. නූතනයේ එය බෞද්ධ උත්සව, පෙරහැර, චිත්‍ර, මූර්ති, කැටයම්, වන්දනා හා නැටුම් ගැයුම් වැයුම් තුළින් අත් විඳිනු ලබයි. බුදු දහමට අනුව ඇලීමෙන් හා ගැටීමෙන් තොරව සොබා දහමේ අසිරිය සුන්දර ලෙස අපිත් විඳ ගනිමු.

# 06

# බුදු දහම හා මානව ප්‍රේමය



බුදු දහම මානව කේන්ද්‍රීය වූ මානව හිතවාදී දහමකි. මිනිසාගේ ස්වාමීත්වය මිනිසා වෙතම හිමිකර දී ඇත. බෞද්ධයාගේ අවසන් පැතුම නිවන වන අතර

නිර්වාණයට පත්වන තුරු සතුටින් සැනසුමින් ජීවත් වීමට මඟ පෙන්වා ඇත. බුදුරදුන් සියලු සත්වයා වෙතම කරුණාව, මෛත්‍රිය පතුරවා ඇත. එම නිසා සෑම බෞද්ධයෙකු ම තම අවට පරිසරයටත් තමා අවට සිටින මිනිසා ඇතුළු ලොකු කුඩා සත්වයා වෙතම මෛත්‍රිය කරුණාව දක්විය යුතු ය. බෝසතුන් තම අතට පත් සුවය අතහැර දීපංකර බුදුරදුන්ගේ පටන් විවරණ ලැබ සාරාසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් පාරමී දම් පුරන ලද්දේ මානව ප්‍රේමය නිසාම ය. බුද්ධත්වයට පත් වී සියලු සත්ත්වයා වෙතම ආදරය කරුණාව මෛත්‍රිය දැක්වූ සේක.

වත්මන් ලෝකයේ රටවල විවිධ ආගම් ප්‍රචලිතව ඇත. බුදු දහම ආදී සෑම දහමක් තුළින් ම මානව දයාව විග්‍රහ වෙයි. ඒ අතරින් බුදු දහම සුවිශේෂය. මිනිසා ඇතුළු සෑම සත්වයෙකුම සතුටින් සැනසුමින් නිදහස්ව නිවහල්ව ජීවත් වීමට කැමැති ය. බුදුරදුන්ගේ උපදේශය නිරතුරුව ම තමන් උපමාකොටගෙන අනුන්ට හිංසා පීඩා නොකළ යුතු බවයි. තමා අනුන්ගෙන් බැණුම් ඇසීම, දඬුවම් ලැබීම, නින්දා අපහාස ලැබීම ආදියට අකැමැති ය. සෙසු සත්වයා ද එබඳු බව බුදු දහමේ ඉගැන්වේ. බුදු දහම පෙන්වා දෙන මෛත්‍රී භාවනාව අනුව පළමුව තමාට මෛත්‍රී කළ යුතු ය. පසුව දෙමව්පිය, ගුරුවර, සොයුරු, මිතුරු, සතුරු ආදී සැමට මෛත්‍රී කළ යුතු බව සඳහන් වේ. මිනිසා උසස් මනසක් ඇති සත්වයෙකි. ඒ නිසා අනුන්ට හිංසාවක් පීඩාවක් නොවන ලෙස ජීවත් වීමට වගබලා ගත යුතු ය.

මානව දයාව පළමුවෙන් ඇතිකර ගත යුත්තේ මිනිසාගේ සිත තුළ ය. ජාති, ආගම්, පක්‍ෂ භේදයක් මානව හිතවාදියෙකුට ඇතිවිය නොහැකි ය. විවාහ දිවියට

පත් යුවළක් ඔවුනොවුන් ගේ ආදරය සෙනෙහස විඳ ගැනීමෙන් පසු දරුවෙකු පිළිබඳ සිහින මවයි. කුසේ දරුවෙකු පිළිසිඳගත් පසු මවත් පියාත් කුසෙහි සිටින දරුවා බිහිවන තුරු නොඉවසිල්ලෙන් බලා සිටියි. දරුවා මෙලොවට බිහි වූ පසු දෙමව්පියෝ ඉමහත් දරු සෙනෙහසින් ඇති දැඩි කරති. රැකබලා ගනිති. දරුවා තුළ ද ක්‍රමයෙන් මව සහ පියා කෙරෙහි ඉමහත් සෙනෙහසක් ඇතිවෙයි. ඒ අනුව මව්පිය දූ දරු සෙනෙහස වර්ධනය වෙයි. සෙසු පවුලේ සහෝදර සෙනෙහස හා වැඩිහිටි නෑ හිතවතුන්ගේ සෙනෙහස ද වර්ධනය වෙයි. පසුව පාසලට පිය මනියි. එහිදී ශිෂ්‍යයෙකු බවට පත්වෙයි. ගුරුවරයා ශිෂ්‍යාටත් ශිෂ්‍යයා ගුරුවරයාටත් දක්වන සෙනෙහස ගුරුසිසු සබඳතාවය සඳහා ද මනාව ඉවහල් වෙයි. පාසලේ දී හිතු මිතුරන් සමඟ සබඳතා වර්ධනය කර ගනියි. අධ්‍යාපනය ලබා සමාජයට පිවිසෙන පුද්ගලයා සමාජය සමඟ ද සබඳතා ගොඩනඟා ගනියි. මෙලොව ජීවත්වන කවර අයෙකුටවත් මේ අනුව තනිවම ජීවත්විය නොහැකි ය. එම නිසා සමාජයේ සෙසු පුද්ගලයන් සමඟ සමීප සබඳතා ගොඩ නඟාගත යුතු ය. රැකියා ස්ථානයේ දී ස්වාමි සේවක සබඳතාවද නිවසේ දී ස්වාමි භාර්යා සබඳතාවය ද මනාව පැවැත්වීමෙන් සුහදත්වය ගොඩ නැගෙයි. තවද වයසට පත් තම දෙමව්පියන් කවා පොවා නහවා අවශ්‍ය පහසුකම් සැපයීම ද මෙලොව මිනිසා සතු වූ යුතුකමක් මෙන් ම මාහැඟි මානව දයාවකි.

සමාජයක ජීවත්වන විට විවිධ කරදර බාධක අවහිරතාවන්ට මුහුණ පෑමට පුද්ගලයාට සිදු වෙයි. එහිදී ඔහුට උදව් උපකාර කොට සනසාලීම මිනිසා සතු උසස්

මානව ගුණාංගයකි. ලංකාවේ මෙන්ම ලෝකයේ විවිධ රටවලට සුනාමි විපත්, ජල ගැලීම්, ගිනිකඳු පිපිරීම්, බෝම්බ පිපිරීම් ආදී විපත් සිදුවෙයි. ජීවිත හානි, දේපළ හානි සිදු වෙයි. ජනතාව අනාථ අසරණ වෙයි. ඔවුන්ට පිහිට වීම උතුම් බෝසත් ගුණයකි. උදාර වූ මානව දයාවකි. තුවක්කු, බෝම්බ ආදී අවි ආයුධ ගැනීමට පුද්ගලයා සැහැසි වන්නේ මානව දයාව නොමැති වූ විටයි. විවිධ ගැටුම් ආරවුල්, මිනී මැරුම්, ජීවිත හානි, දේපළ හානි අද කොතෙකුත් සිදුවෙයි. ඊට හේතුව පුද්ගලයා තුළ චිත්ත සංවරයක් නොමැති කමයි. එනිසා අප කරුණාව, මෛත්‍රිය ආදී ගුණාංගවලින් යුතුව ක්‍රියා කිරීමට වගබලා ගත යුතු ය.

සමාජයේ අන්‍යෝන්‍ය සුහදත්වය ඇති වන්නේ පුද්ගල සිතේ පහළ වන ප්‍රේමාන්විත වූ පවිත්‍ර සිතිවිලි නිසයි. යෞවන වයසේ තරුණ තරුණියන් තුළ ඇතිවන රාගික හැඟීම් සහිත ප්‍රේමය සැබෑ ප්‍රේමය නොවේ. දයානුකම්පාවෙන් යුතු තැනැත්තා සියලු දෙනා සමඟ හිතවත්ව ක්‍රියා කිරීමට කැමති වෙයි. අනුන්ගෙන් සම්පත් ලබා ගැනීමේ ලෝභී චේතනාවෙන් මිත්‍ර වීම සැබෑ මිත්‍රත්වය නොවේ. දීම සහ ගැනීම යන දෙකම මානව ප්‍රේමයේ ලක්ෂණ වන අතර අන්‍යයන්ට උපකාර කිරීම, ධනයෙන් හා ශ්‍රමයෙන් සහාය දැක්වීම තුළින් සමාජ එකමුතුකම ද වර්ධනය වේ.

බුදුරජාණන් වහන්සේ මානව ප්‍රේමය උදාකර ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් රැසක් සූත්‍ර ධර්ම මගින් ඉදිරිපත් කොට වදාළහ. සිඟාලෝවාද, මංගල, ව්‍යග්ගපජ්ජ, කාලාම ආදී සූත්‍ර ධර්ම මගින් එය විග්‍රහ වෙයි. ධර්මයට අනුව දිවිමඟ අර්ථවත් කර ගන්නා පුද්ගලයා නිරතුරුව

සමාජයේ සෙසු අයට විවිධ උදව් උපකාර කරමින් අනුන්ට වැඩදායී අයුරින් ජීවත්වෙයි. සමාජයෙන් විවිධ බාධා පැමිණි ය ද නොසැලෙමින් ක්‍රියා කිරීමේ හැකියාව ඔහු සතුවෙයි. ධනයට, බලයට, මුදලට ගැති නොවී පටු අරමුණුවලින් තොරව අනුන් වෙනුවෙන් සේවය කිරීම තම මෙලොව පරලොව සුවය සලසා ගැනීමට ද හේතු වෙයි. බෝසතුන් පාරමිතා පූරණ සමයේ ඇස්, හිස්, මස්, ලේ, නහර ආදී ශරීර අවයව පවා දන්දෙමින් අනුන්ගේ සුවය වෙනුවෙන් කටයුතු කළ සේක. බුද්ධත්වයට පත්වූ පසුව ද පන්සාලිස් වසක් පුරා ලෝකවාසීන්ට විවිධ උදව් උපකාර කළ සේක. දෙලොව සැනසුමට මඟ හෙළිකළ සේක. මිනිස් ලොව උපන් මිනිසුන් වශයෙන් අප ද යා යුතු වන්නේ බෝසතුන් ගිය ඒ උතුම් මගෙහි ය. මිනිසුන් වශයෙන් අප මිනිස් සමාජයට ආදරය කළ යුතු ය. සෙසු තිරිසන් සත්වයාට ආදරය කරුණාව දැක්විය යුතු ය. පරිසරය ආරක්‍ෂා කරගත යුතුය. කිසිඳු සම්පතක් විනාශ වීමට ඉඩ නොදී ඒවා රැක ගැනීම මිනිසා සතු යුතුකම හා වගකීම වේ. උතුම් මනුෂ්‍යත්වය යනු ද එයයි. තමාගේ සැපත ගැන පමණක් සිතන අනුන්ගේ වේදනාව ගැන නොසිතන මිනිසා සැබෑ මිනිසෙක් නොවේ. අපගේ මිනිස් දිවිය උතුම් මිනිස් දිවියක් බවට පත්කර ගැනීම සඳහා පවිත්‍ර සිතිවිලිවලින් යුතුව ක්‍රියා කළ යුතු ය. එවිට සුහදත්වය ඇති වෙයි. මානව දයාවෙන් යුතුව සතුටින් ජීවත් වීමට හැකිවන්නේ ද එසේ ක්‍රියා කිරීම තුළිනි.

# 07

# බුදු දහම හා අනාගත දැක්ම



වත්මන් ලෝවැසි ජනතාව බුදුරජාණන් වහන්සේගේ ධර්මය පිළිබඳ වැඩි වැඩියෙන් අවධානය යොමු කරනු ලබති. එදා බුදුරදුන් දේශනා කළ ධර්ම කරුණුවල

සත්‍යතාව අද මැනවින් තහවුරු වෙමින් පවතී. බුදු දහම හමුවේ නවීන විද්‍යාත්මක සොයා ගැනීම් ද සෘණ මට්ටමක පවතී. බුදු දහමේ අගය ලෝ වාසීහු වටහා ගනිමින් සිටිති. බුදුරදුන් එදා දේශනා කළ ධර්මය අද අපගේ දෑස් හමුවේ මිහිපිට සත්‍යයක් බවට පත්වී ඇත. කෝසල සංයුත්තයේ සඳහන් කරුණු කෙරෙහි අප වැඩි අවධානය යොමු කළ යුතු ය.

දිනක් කොසොල් මහ රජු රෑ නින්දේ දී අරුම පුදුම වූ සිහින දහසයක් දැක අතිශය බියට පත්විය. එය පුරෝහිත බමුණාට දැන්වූ කල්හි ඔහු ප්‍රකාශ කළේ රටට මහත් විපත් පැමිණීමේ පෙර නිමිති බවත් ඉන් මිදීම සඳහා "සර්ව චතුෂ්ක" නම් යාගය කළ යුතු බවත් ය. කොසොල් රජුගේ අග මෙහෙසිය බුදු දහම පිළිබඳ අවබෝධය ඇති ඥානාන්විත කාන්තාවක් වූ අතර ඇය ප්‍රකාශ කළේ සතුන් මරා යාග කිරීමෙන් රටට යහපතක් සිදු නොවන බවත් රජු දුටු සිහින දහසයෙහි සැබෑ අරුත් බුදුරජාණන් වහන්සේගෙන් විමසා දැනගත යුතු බවත් ය. තම අගමෙහෙසිය වූ මල්ලිකා දේවියගේ උපදෙස් පරිදි බුදුරදුන් හමුවට ගිය රජු තමා දුටු සිහින දහසය පිළිවෙළින් පැවසී ය. එක් එක් සිහිනයේ ප්‍රතිඵල බුදුරදුන් ද රජුට විස්තර කර දුන් සේක.

රජු දුටු සිහින අනාගත සමාජය පිළිබඳ දැක්වෙන කැඩපතක් බඳු බවත් අනාගත ලෝකයේ සදාචාර හා පුද්ගල පරිහානිය සිදුවන්නේ කෙසේද යන්නත් පිළිබඳ බුදුරදුන් මෙහිදී සවිස්තරව ම දේශනා කොට ඇත

**පළමු සිහිනය**

"බුදුරදුනි, අංජන වර්ණ වූ කළු ගොනුන් සතර දෙනෙක් සතර දිශාවකින් යුද්ධ කිරීමට රජ මිදුලට

පැමිණෙයි. එය බැලීමට මිනිසුන් රැස්වූ කල්හි යුද්ධ කරන ආකාරයක් දක්වා ගර්ජනා කොට නැවත පළා ගියේය." එම සිහිනයෙහි ප්‍රතිඵල විග්‍රහ කරන බුදුරදහු "රජතුමනි, එම සිහිනයේ විපාක අනාගතයේ මේ ලෝකයේ දැකගත හැකි වෙයි. අනාගතයේ ලෝකයේ අදමිටු රජවරු සහ අදමිටු මිනිස්සු උපදිති. ඔවුන් කරන අකුසල් හේතුවෙන් වැසි නොවසී. වලාකුළු නැතිවෙයි. ගොයම් සහිත කුඹුරු වැනසී යයි. වලාකුළු ගර්ජනා කොට වැසි වසින ආකාරයක් දක්වා නැවත පාවී යයි. එය ඔබ දුටු සිහිනයේ යුධ කිරීමට පැමිණ ගර්ජනා කොට ගිය ගොනුන් වැනි ය" යි වදාළ හ.

## දෙවන සිහිනය

"බුදුරදුනි, පොළොවෙහි හටගත් වියතක්වත් උස් නොවූ කුඩා ගස්වල මල් පිපී ඵල හටගෙන තිබෙනු දුටුවෙමි." එම සිහිනයට පිළිතුරු දුන් බුදුන් වහන්සේ " රජතුමනි, අනාගතයේ මිනිසුන්ගේ ආයුෂ පිරිහේ. කුඩා වයසේ දී ම අධික රාගයෙන් යුතු කුඩා ගැහැනු ළමයි පුරුෂයන් අතරට ගොස් ඍතුමත්ව ගර්භනීව දූ දරුවන් බිහි කරති. එම සිහිනයේ ප්‍රතිඵලය අනාගත ලොවේ දක්නට හැකි ය." යි වදාළහ.

## තෙවන සිහිනය

"බුදුරදුනි, එදින උපන් වසු පැටවුන්ගෙන් මහ දෙනුන් කිරිබොනු දිටිමි. එම සිහිනයෙන් අනාගතයේ සිදුවන විපාකය පැහැදිලි කරන බුදුරදහු, "මහරජතුමනි, අනාගතයේ දූ දරුවෝ මව්පියන් කෙරෙහි හෝ නැදිමයිලන් කෙරෙහි හෝ ලජ්ජාවෙන් තොරව ඔවුන්ට හිතුමතේට විවාහ වෙති. දෙමව්පියන්ට හොඳින් නොසලකති. කෑම බීම ඇඳුම් පැලඳුම් නිසි ලෙස

නොදෙති. එනිසා තම දූ දරුවන්ට සලකමින් යටත්ව දෙමව්පියන්ට ජීවත් වීමට සිදුවේ. දෙමව්පියන්ට අසරණ ලෙස ජීවත් වීමට සිදුවෙයි" යි වදාළහ.

## සිව්වන සිහිනය

"බුදුරදුනි, නාම්බ ගොනුන් මුලට ද මහ ගොනුන් අගට ද යොදා ගැල්වලින් බඩු ගෙනයාමට සූදානම් වෙද්දී මුලට යොදන ලද නාම්බ ගොනුන්ට එහි බර උසුලා ගැනීමට නොහැකිව වියගස කරින් බිමට වැටිණි. එනිසා භාණ්ඩ නියමිත ස්ථානයට ගෙනයාමට නොහැකිවනු දුටුවෙමි." එහි අනාගත විපාක පෙන්වන බුදුරදුන් "මහරජතුමනි, අනාගතේ අධර්මිෂ්ඨ රජවරු නුවණැති වැඩිහිටියන්ට තනතුරු භාර නොදෙති. අදක්ෂ තරුණයින්ට වැඩ භාර දීම නිසා ඔවුන්ට එය කරගත නොහැකි වෙයි." යනුවෙන් වදාරමින් අනාගතයේ දී මෙහි විපාක දකගත හැකි බව උන්වහන්සේ රජුට පැහැදිලි කර දුන්හ.

## පස්වන සිහිනය

"බුදුරදුනි, ඉස්සරහින් මෙන් ම පස්සෙන් ද මුඛ (කට) ඇති අශ්වයන් එම මුව දෙකින් ම අනුභව කරනු දුටුවෙමි". එහි විපාක දේශනා කළ උන් වහන්සේ "රජතුමනි, අනාගතයේ රජකම් කරන රජදරුවෝ වැරදි කරුවන්ට දඬුවම් නියම නොකොට දෙපැත්තෙන්ම අල්ලස් ගෙන දූෂ්‍ය පාලනයක් ගෙන යති" යනුවෙන් පිළිතුරු දුන්සේක.

## හයවෙනි සිහිනය

"බුදුරදුනි, මිනිසුන් පිරිසක් විසින් ලක්ෂයක් පමණ වටිනා රන් තලියක් ගෙන මහලු සිවලෙකු ලවා ඊට මුත්‍ර කරවනු දුටුවෙමි." එහි විපාක පැහැදිලි කරන බුදුරජාණන්

වහන්සේ "මහරජතුමනි, අනාගතයේ ජාති සම්පන්න කුලවතුන්ට අඳමිටු රජවරු කිසිඳු සම්පතක් හෝ තනතුරක් නොදෙති. කුල හීනයන්ටම දෙති. එවිට ජාති සම්පන්න කුලවත් මිනිසුන්ට ජීවත් වීමට ක්‍රමයක් නොමැති වේ. එනිසා ඔවුන්ගේ දූ දරුවන් කුල හීනයන්ට ම ආවාහ විවාහ කරදී ජීවත් වෙති. කුලයෙන් උසස් අය හා කුල හීනයන්ගේ එකට විසීම සිවලා රන්තලියකට මුත්‍රා කිරීම හා සමාන බව වදාළහ.

## සත්වෙනි සිහිනය

"බුදුරදුනි, එක් පුරුෂයෙක් ලණු අඹර අඹරා පාමුලින් තබන විට ඔහු හිඳගෙන සිටි පුටුවේ යට වූ බඩගිනි හිවල් ධේනුවක් ඔහුට නොදැනෙන සේ ලණුව සපාකනු දුටුවෙමි." එයට පිළිතුරු ලෙස අනාගත විපාකය විග්‍රහ කරන බුදුරදුන් "රජතුමනි, අනාගතයේ කාන්තාවන් පුරුෂයන් කෙරෙහි ලොල් වෙති. දුරාචාරයට යොමුවෙති. පුරුෂයන් සොයා වීථිවල ඇවිදිති. තම සැමියා උපයන වස්තුව ද සොර සැමියන්ටම දී අසද්ධර්මයෙහි හැසිරෙති. එය අඹරන ලණු සිවල් ධේනුව කා විනාශ කරන්නක් බඳු ය"යි වදාළේ ය.

## අටවෙනි සිහිනය

"බුදුරදුනි, මාලිගාවේ දොරකඩ පිරුණු කළයකුත් අවට බොහෝ හිස් කළත් තිබේ. සතර දිශාවෙන් පැමිණි සතර කුලයේ ජනතාවට හිස් කළ දෙස නොබලා පිරුණු කළ ම පුරවනු දුටුවෙමි." එම සිහිනයේ විපාකය පෙන්වාදුන් බුදුරදහු "මහරජතුමනි, අනාගතයේ සමාජය අධර්මිෂ්ඨ වෙයි. රජවරුද දුප්පත් වෙති. ඒ අතර ධනයෙන් ආඪ්‍ය රජෙක් ද වේ. එම රජු දිළිඳු ගම්වැසි ජනතාව ලවා කුඹුරු ආදිය කරවා තම භාණ්ඩාගාරය පුරවා ගනියි.

දිළිඳු ජනතාව තම වැඩ අතපසු කර ගනිමින් රජුට සේවය කිරීම නිසා තව තවත් දිළිඳු බවට ම පත්වෙති" යි වදාළහ.

## නවවෙනි සිහිනය

"බුදුරදුනි, පස් පියුමෙන් යුතු විලකින් සතර දිගින් පැමිණි සත්වයෝ ජලය බොති. සතුන් ජලය බොන තැන්වල පමණක් ජලය පිරිසිදු අතර පොකුණේ ගැඹුරු වූ මැද ප්‍රදේශයේ ජලය බොර වී තිබෙනු දුටුවෙමි." එම සිහිනයේ අනාගත විපාක බුදුරදුන් රජුට මෙසේ පැහැදිලි කළහ. "රජතුමනි, අනාගතේ ලොව රජවරු රාගයෙන්, ද්වේශයෙන්, මෝහයෙන් හා බියෙන් අගතිගාමී වෙති. සම්පත්වලට ම ලොල් වෙති. ජනතාව පීඩාවට පත් කරමින් රට පාලනය කෙරෙති එය ඉවසා ගැනීමට නොහැකි රටේ මධ්‍ය ප්‍රදේශයේ ජනතාව තම ගම්බිම් අත්හැර යති."

## දහවෙනි සිහිනය

"බුදුරදුනි, එකම සැළියක පිසින ලද බත්වලින් කොටසක් ඉතා අමු ය. කොටසක් බෙරි ය. තවත් කොටසක් හොඳින් තැම්බී ඇත. මෙලෙස එක සැළියේ පිසූ බතෙහි ආකාර තුනක් ම තිබෙනු දුටුවෙමි." එම සිහිනයෙන් වන විපාකය දක්වමින් "රජතුමනි, අනාගතයේ රජවරු අදමිටු වෙති. ගෘහපතියන් ඇතුළු සියලු ජනයෝ ද එනිසා අදමිටු වෙති. අධිගෘහිත දෙවිවරු ද අදමිටු වෙති. සැඩ සුළං හමයි. දෙවි දේවතාවෝ කෝපයට පත්වෙති. කලට වැසි නොවසී. ඇතැම් ප්‍රදේශවලට පමණක් වැසි වසී. ඒ නිසා එක් ප්‍රදේශයක ගොයම් මැරෙයි. තවත් ප්‍රදේශවල ගොයම් කොටසක් පමණක් මඳ වශයෙන් පැසේ. තවත් ප්‍රදේශයක හොඳින්

පැසේ. එකම සැළියේ බත් තුන් ආකාර වූවා සේ එකම රටෙහි ගොයම් ඵලදාව ද තුන් ආකරයක් ගනී." යනුවෙන් වදාළහ.

## එකොළොස් වෙනි සිහිනය

"බුදුරදුනි, ලක්‍ෂයක් පමණ වටින සඳුන් හරයක් කුණු මෝරු ගණනට විකුණනු දුටුවෙමි." එහි විපාකය බුදුරදුන් මෙසේ විස්තර කළ සේක. "මහරජතුමනි, මාගේ සසුන අනාගතයේ පිරිහීමට පත්වන සමයේ භික්‍ෂූහු සිව්පසයට ලොල් වෙති. ඔවුන් මාගේ උතුම් ධර්මය සිව්පසය ලබා ගැනීමේ අපේක්‍ෂාවෙන් දේශනා කරති. එම සිහිනයේ ප්‍රතිඵලය එයයි."

## දොළොස්වෙනි සිහිනය

"බුදුරදුනි, වියළි හිස් ලබු කබල් දියෙහි ගිලෙනු දුටුවෙමි." එම සිහිනයේ අනාගත විපාකය පැහැදිලි කරන බුදු රජාණන් වහන්සේ "මහරජතුමනි, අනාගතයේ රජවරු ජාතිසම්පන්න කුලවතුන්ට යස ඉසුරු නොදෙති. කුල හීනයන්ට ම දෙති. එනිසා කුල හීනයෝ ඉසුරුමත් වන අතර කුලවත් පුත්‍රයෝ දිළිඳු වෙති. අමාත්‍ය මණ්ඩලයට ද කුල හීනයන් ම පත්කර ගනී. යහපත් පුද්ගලයන්ගේ අවවාද ඔවුන් පිළිනොගනී. එම සිහිනයේ විපාකය එලෙස අනාගතයේ සිදුවන්නේ ය." යනුවෙන් විස්තර කළ සේක.

## දහතුන්වෙනි සිහිනය

"බුදුරදුනි, විශාල ගල්, නැව් වැනි විශාල ගෙවල් ජලයේ පාවෙනු දුටුවෙමි." එහි විපාකය බුදු පියාණන් මෙසේ පැහැදිලි කළහ. "මහරජතුමනි, අනාගතයේ දක්‍ෂ බුද්ධිමතුන් හා සිල්වත් භික්‍ෂූන්ගේ බස් නිශ්චලව නොපිහිටයි. නොපිළිගනී. දුසිල්වතුන්ගේ බස් පිළිගනී.

දුසිල්වතුන්ගේ අදහස් අනුව ක්‍රියාකිරීම නිසා සමාජය පරිහානියට ම පත් වෙයි."

## දහ හතරවෙනි සිහිනය

"බුදුරදුනි, කුඩා මැඩියන් විසින් මහත් වූ දිග සර්පයන් පසුපස වේගයෙන් එළවාගෙන ගොස් අල්ලාගෙන නෙළුම් දඬු කඩන්නාක්මෙන් කඩ කඩා මුරු මුරු යන හඬින් කා දමනු දුටුවෙමි." එම සිහිනයේ විපාක ගෙනහැර පාමින් "මහරජතුමනි, අනාගතයේ මේ ලොවේ මිනිසුන් අධික රාගයෙන් යුතුවීම නිසා භාර්යාවන්ට යටත් වෙති. සැමියන් සතු රන් රිදී වතු පිටි හරකබාන ආදී සම්පත් භාර්යාව සතු වේ. භාර්යාවෝ තම සැමියන් යටත් කරගෙන ජීවත් වෙති." යනුවෙන් අනාගතයේ එම සිහිනයේ විපාක දැකබලා ගත හැකි බව බුදු රජාණන් වහන්සේ දේශනා කළ සේක.

## පහළොස්වෙනි සිහිනය

"බුදුරදුනි, අදුහැමි, ගම් පහරන කපුටන් ස්වර්ණ හංසයන් පිරිවරාගෙන සිටිනු දුටුවෙමි." එම සිහිනය විග්‍රහ කරන බුදුරදුන් "මහරජතුනි, අනාගත රජ දරුවෝ ශිල්ප ශාස්ත්‍රවල මෙන්ම යුද්ධ කිරීමෙහි ද අදක්‍ෂ වෙති. එනිසා කරනැවැමියන් ආදී පහත් කුලිකයන් ඒ සඳහා පත්කර ගෙන ඉහළ තනතුරු දෙති. කුලවත් ජනතාව අසරණ වෙයි. ඔවුන්ට කුල හීනයන්ට සේවය කරමින් කපුටන් වැනි පහත් කුලිකයන්ට ගරු බුහුමන් කිරීමට සිදුවෙයි." යනුවෙන් විස්තර කර ඇත.

## දහසයවෙනි සිහිනය


"බුදුරදුනි, දිවියන් පසුපස එළුවන් එළවාගෙන ගොස් අල්ලාගෙන බෙල්ල කඩා මුරු මුරු ගා අනුභව කරන

අතර සෙසු දිවියෝ එළුවන් දැක බිය වී පලායනු දුටුවෙමි." එම සිහිනයේ අනාගත විපාකයන් විග්‍රහ කරන බුදුරදුන් "මහරජ, අනාගතයේ රජවරුන් අදම්ටු වූ කල්හි කුලහීනයෝ රජුට සමීප වෙති. ධනවත් වෙති. රජුට විවිධ මුසාබස් කියා වැරදි උපදෙස් දී කුලවතුන් තලාපෙලා දමති. විනිශ්චය ශාලාවේදී ඔවුන් පිට වැරදි පටවා බිය ගන්වා දඬුවම් දී ඔවුන් සතු වස්තුව කුල හීනයන් සතු කර ගනී. එහිදී කුලවත් ජනතාව බියෙන් තම වස්තුව ඔවුන්ට ගැනීමට ඉඩ හැර සියලු දේ අත්හැර පලා යති" යි ගෙනහැර දැක්වී ය.

ඉහත සඳහන් වූ කොසොල් රජු දුටු සිහින දහසය සහ බුදුරදුන් කළ විග්‍රහය සර්ව කාලීන ය. අනාගතයේ ලොවට සිදුවන විපත් එදා බුදුරදුන් නුවණින් දුටු අතර, ධාර්මික රජවරු එය සිහිනයෙන් දැක ඇත. මීට දෙදහස් පන්සිය පනස් වසරකට පෙර බුදුරදුන් කර ඇති මෙම සිහින විග්‍රහය වත්මන් මෙන්ම අනාගත ලෝකයේ සිදුවන සමාජ හා සදාචාර පරිහානිය මැනවින් විග්‍රහ වෙයි. මේ පිළිබඳ වගකිය යුතු නායකයින්ගේ සහ සියලු ජනතාවගේ අවධානය යොමු විය යුතු අතර සදාචාර පරිහානියෙන් සමාජය වළක්වා ගැනීමට හැකි ක්‍රියා මාර්ග අනුගමනය කළ යුතු ය.

# 08

# බුදු දහම හා මනුෂ්‍යත්වය



සසර මගෙහි විශිෂ්ටතම ඵලය මනුෂ්‍ය ආත්මභාවයක් ලබා උපත ලැබීමයි. මිනිසා යනු උසස් මනසකින් යුතු සත්ත්වයෙකි. මිනිසුන් වූ අප මනුෂ්‍යත්වයේ උපරිම ඵල

නෙළාගත යුතු ය. ඒ නිසා මිනිසා යනු කවර ආකාරයේ නිර්මාණයක් දැයි අප සොයා බැලිය යුතු ය.

බුදු දහමට අනුව ශරීරය යනු පංචස්කන්ධයකි. එනම් රූප, වේදනා, සංඥා, සංඛාර, විඥ්ඥාණ යන ස්කන්ධ පහයි. සාමාන්‍ය වශයෙන් අප ශරීරය යනුවෙන් හඳුන් වන්නේ ඇස, කන, නාසය, දිව, ශරීරය යන ඉන්ද්‍රිය පහටයි. පංචස්කන්ධයෙන් වඩා ප්‍රබල වන්නේ විඥ්ඥාණයයි. ඊට හේතුව පුද්ගලයා කරනු ලබන කුසල් අකුසල් විඥ්ඥාණය නම් ඇසට නොපෙනෙන වස්තුවට එකතු වීමයි. මෙලොව ජීවිත පැවැත්මට හා පරලොව උපත සඳහා ද විඥ්ඥාණයේ ක්‍රියාකාරීත්වය බෙහෙවින් බලපායි.

පසිඳුරන්ට අරමුණුවන රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන අරමුණු අනුව සිතිවිලි පහළ වෙයි. නමුත් පංච ඉන්ද්‍රියන් හා ඒ අරමුණු ස්ථිර නොවේ. මියයාමත් සමඟ විනාශයට පත්වෙයි. එහෙත් සිතිවිලි නිසා විඥ්ඥාණය ශක්තිමත් වෙයි. පංචස්කන්ධය අතුරින් අපට පෙනෙනුයේ රූපය පමණි. එම රූපය විනාශ වෙයි. වේදනාවද අස්ථිරය. සංඥා, සංඛාරයන්ගේ ස්වභාවය එබඳුමය. නමුත් විඥ්ඥාණය ප්‍රබල ය. පුද්ගලයාගේ මරණය හෙවත් ශරීරය විනාශ වූ පසු විඥ්ඥාණය ඉතිරි වෙයි. කුසල්, අකුසල්, පව්, පින්වලින් යුතු විඥ්ඥාණය නැවත භවයක උපදියි. මෙලොව උපන් මිනිසුන්වන අපගේ ශරීරයට වඩා විඥ්ඥාණය ප්‍රබල බව ඒ අනුව වටහාගත හැකි ය. එම නිසා මනුෂ්‍ය ජීවිතයේ උපරිම ඵල නෙළා ගැනීමට නම් කුසල් රැස් කළ යුතු ය. බුදුරදුන් පිරිනිවන්පාන මොහොතේ භික්ෂූන් අමතා,

"හන්දදානි භික්ඛවේ ආමන්තයාමි වො
වයධම්මා සංඛාරා අප්පමාදේන සම්පාදේථ"

යනුවෙන් වදාළ සේක. එහි අර්ථය "මහණෙනි, මම ඔබ වහන්සේලා අමතමි. සියලු සංස්කාරයෝ නැසෙන සුළු ය. අප්‍රමාදව කුසල් රැස් කරගන්න" යනුයි.

මේ අනුව පැහැදිලි වන්නේ ජීවිතයේ උසස් ප්‍රතිඵල නෙලා ගැනීමට කුසල් රැස්කර ගත යුතු බවයි. භෞතික ශරීරයෙන් පමණක් සැබෑ මිනිසෙකු නොවේ. මිනිස් ගුණධර්ම මනාව ප්‍රගුණ කළ යුතු ය. අකුසල් කර ගැනීමෙන් මනුෂ්‍යත්වය විනාශ වන අතර කුසල් රැස්කර ගැනීමෙන් උතුම් මිනිසෙකු බවට පත් වේ.

මිනිසා තුළ විවිධ ආශාවන් තිබේ. ඒ ආශාවන් පසුපස හඹා යාම මනුෂ්‍යත්වයට හානියකි. නමුත් සැප ලැබීමේ දී පින් රැස්කර ගත යුතු ය. මෙලොව දී යාන වාහන, මිල මුදල්, වතු පිටි, භවබෝග සම්පත්වලින් යුතුව අඹු දරුවන් සමඟ ජීවත් වීමට සෑම අයෙකුම කැමති ය. කාමභෝගී ජීවිතයක් ගත කිරීමට පෘථග්ජන පුද්ගලයා කැමති ය. තමුන් කෙරෙහි අධික ආශාව ඇති කර ගැනීමෙන් පාප කර්ම සිදුවෙයි. ආශාව පාපයට හේතුවන අතර ඒ තුළින් පුද්ගලයා මුලාවට පත්වෙයි. එනිසා බුදුරදුන් දෙසූ ධර්මය මැනවින් වටහාගෙන මෙලොව ජීවත් වීමට පමණක් අවශ්‍ය උපකරණ සපයාගෙන ඒ අනුව ජීවත් විය යුතු ය. ලෝභයෙන්, මසුරුකමන් ධනය රැස් කිරීම සසර දුකට හේතු වේ. මිනිසෙකු ශ්‍රේෂ්ඨ වන්නේ බාහිර අලංකාරයෙන් නොවේ. අධ්‍යාත්මික වශයෙන් රැස් කරගනු ලබන කුසල් අනුවයි.

කුසල් රැස් කර ගන්නේ කෙසේ ද? දස පාරමිතා ගුණධර්ම අනුගමනය කිරීම, ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියා, දස පුණ්‍ය ක්‍රියා, දස මහා කුසල් ආදිය සිදු කළ යුතු ය. එහිදී තමාට බොහෝ දේ කැප කිරීමට සිදුවෙයි. ලෝභයෙන්

මසුරුකමින් තොරව තම වස්තුව කැප කිරීමට සිදුවෙයි. එමෙන් ම තම කාලය, ශ්‍රමය පමණක් නොව ශරීර අවයව පවා කැප කිරීමට සිදුවෙයි. බෝ සතුන් සම්බුද්ධත්වය වැනි උත්තරීතර පදවියකට පත් වූයේ එබඳු කැප කිරීම් කළ නිසා ය. තම මනුෂ්‍ය ජීවිතයෙන් උසස්ම ප්‍රතිඵල ලබා සිටින පිරිස නම් බුදු - පසේ බුදු - මහරහත් යන උතුමන් ය. උන් වහන්සේලා ගේ ජීවිත ආදර්ශයට ගෙන ක්‍රියා කිරීම ජීවිතයේ උසස් ප්‍රතිඵල ලබා ගැනීමට හේතු වේ.

"නාචින්තයන්තෝ පුරිසෝ විසේස මධිගච්ඡති"

යන බුද්ධ දේශනාව අනුව අලුත් දේ නොසිතන පුද්ගලයා දියුණුවට පත් නොවන බව සඳහන් වේ. එම නිසා යහපත් චින්තනයෙන් යුතුව ක්‍රියා කිරීමෙන් පුද්ගලයාට දියුණුව සැලසේ. බුදු දහම නිදහස් චින්තනය අගය කොට ඇති දහමක් නිසා ස්වකීය බුද්ධියෙන් සිතාමතා විමසා තීරණවලට එළඹිය හැකි ය. වැරදි දේ නොපිළිගැනීමත් හරි දෙය පිළිගැනීමත් බුද්ධිමත් පුද්ගලයාගේ ලක්ෂණය වේ.

උසස් මිනිසෙකු වීමට වෙසෙසින්ම බල පවත්නේ සිතයි. සිත සෙලෙවෙන හා නිතර වෙනස්වන ස්වභාවයෙන් යුතු ය. එනිසා බුදුරදුන් අනුදත් භාවනා ක්‍රම අනුගමනය කළ යුතු ය. පවිටු සිතිවිලි ඈත් කර ගැනීමට තම චරිතයට සුදුසු භාවනා ක්‍රමයක් තෝරාගත යුතු ය. සම සතළිස් කර්මස්ථාන අතරින් සුදුසු කර්මස්ථානයකට අනුව භාවනා කිරීමෙන් සිත පවිත්‍ර කර ගැනීමටත් දියුණු සිතක් ඇතිකර ගැනීමටත් හේතු වේ. නොසැලෙන සිතක් ඇති විට බුදුරදුන් දෙසූ විමුක්ති මඟෙහි ගමන් කිරීමට නැඹුරු වෙයි. ලොව පිළිබඳ යහපත්

දැකීමෙන් යුතුව අවිද්‍යාවෙන් මිදී ධර්ම ඥානය ලබා ගනී. ධර්ම ඥානය ලබා ගැනීමේ දී භාවනා කිරීම මෙන්ම දහම් ඇසීම, දහම් පොතපත කියවීම අතිශය වැදගත් වේ. තම වැරදි හැඟීම් ඉවතලා නිවැරදි මඟ තෝරා ගැනීමට දහම් ඇසීම හා දහම් පොතපත කියවීම ඉතා වැදගත් වේ. ලෝකයේ හා පුද්ගලයා යනු කවු ද? ඒ අනුව තමා කටයුතු කළ යුත්තේ කෙසේ ද? යන්න වටහාගත් පසු මිනිසා විමුක්ති මඟට යොමු වේ. රාගය, ද්වේශය, මෝහය, ඊර්ෂ්‍යාව, මානය ආදී පවිටු සිතිවිලි වලින් ඉවත් වී තම සිත පිරිසිදු කර ගන්නා දහම් මඟට යොමු වන්නේ සම්බුදු දහම නිවැරදිව අවබෝධ වූ විටයි.

ධර්මාවබෝධයෙන් යුතු පුද්ගලයාට ලෞකික වශයෙන් ජීවිතය සාර්ථක කර ගැනීමටත් ලෝකෝත්තර දියුණුව සලසා ගැනීමටත් හැකියාව ලැබේ. ලෞකික චිත්ත දියුණුව මගින් භාවනාවේ අනුසස් ලෙස පංචාභිඥා අෂ්ඨ සමාපත්ති ඥාන ලබා ගැනීමට හැකිවෙයි. ඒ තුළින් අසිරිමත් ප්‍රාතිහාර්යය පෑමට ද හැකියාව ලැබෙයි. ලෝකෝත්තර චිත්ත දියුණුව ඊට වඩා ගැඹුරු ප්‍රතිපදාවකි. මනසේ ඇති දස සංයෝජන නම් කෙළෙස් දුරු කර ක්‍රමයෙන් සෝවාන් - සකෘදාගාමී - අනාගාමී - අරහත් යන සතර මාර්ගඵල ලැබීමට ලෝකෝත්තර චිත්ත දියුණුව හේතුවෙයි. මිනිසුන් වශයෙන් අප උත්සාහ කළ යුත්තේ අධ්‍යාත්මික ප්‍රගතිය සැලසෙන එවන් තත්ත්වයන්ට අපගේ සිත යොමු කරවීමයි. එය ක්ෂණිකින් කළ හැකි ක්‍රියාවක් නොවේ. එනිසා, ලෞකික සැප ලබා එහි ආදීනව වටහාගෙන ලෝකෝත්තර මාර්ග ඵලයන්ට ක්‍රම ක්‍රමයෙන් යොමු විය යුතුය. එවිට අපගේ මිනිස් දිවියේ උසස් ප්‍රතිඵල ලබා ගැනීමට හැකිවෙනු ඇත.

# 09

# බුදු දහම හා දේව සංකල්පය



බුදු දහම හා දේව සංකල්පය පිළිබඳ නූතන යුගයේ විවිධ ලෙස වාද විවාද පවතී. ලෝකයේ ඇති සියලු ආගම් කොටස් දෙකකට බෙදා දක්වෙයි. එනම් මානවවාදී (මානවකේන්ද්‍රීය) ආගම් සහ දේවවාදී (දේවකේන්ද්‍රීය)

ආගම් යනුවෙනි. මිනිසාගේ චින්තන නිදහසට හා මිනිසාගේ ස්වාමිත්වය මිනිසාට හිමි කර දී ඇති ආගම වන්නේ බුදු දහමයි. මිනිසා ඇතුළු සියලු සත්ත්වයාත් ලෝකයත් මෙහෙයවන බලවේගය දෙවියන් බවත් එම දෙවියන් සර්වබලධාරී දෙවිකෙනෙකු බවත් විශ්වාස කරමින් අදහන ආගම් දේවවාදී ආගම් වේ. බුදු දහම හැරුණු විට ලොව ඇති හින්දු, ඉස්ලාම්, ක්‍රිස්තියානි ආදී සියලු ආගම් දෙවියන් විසින් ලොව මවා ඇති බව පිළිගනිමින් අදහන ආගම් ය.

බුදුරජාණන් වහන්සේ ද සූත්‍ර දේශනා මගින් දෙවියන් පිළිබඳව අදහස් ඉදිරිපත් කොට ඇත. බුදු දහමෙහි දෙවිවරු කොටස් තුනක් ලෙස විග්‍රහ කොට ඇත. එනම්,

1. සම්මුති දේව
2. විශුද්ධි දේව
3. ඕපපාතික දේව යනුයි.

සම්මුති දේව යනු සමාජයක වෙසෙන රජවරු සිටුවරු මැති ඇමතිවරු ආදී ප්‍රභූ පිරිස් ය. විශුද්ධි දේව යනු බුදු පසේබුදු මහරහත් යන කෙලෙස් දුරුකළ උතුමන් ය. සංසාරයේ පින් කිරීමෙන් දිව්‍ය ලෝකවල පහළ වන දෙවිවරු ඕපපාතික දේව නම් වේ.

මෙම දේව කොටස් ත්‍රිත්වය අතරින් ඕපපාතික දේව සංකල්පය පිළිබඳ මෙහිදී විග්‍රහ වෙයි. බුදුරදුන් ලොව පහළ වීමට පෙර පටන් ම ලෝ වැසියා තුළ දේව විශ්වාසය පැවතිණි. ගස්, ගල්, පර්වත ආදී ස්වභාවික වස්තු දේවත්වයෙන් සලකා වැඳුම් පිදුම් කළ බව සඳහන් වෙයි. එමෙන් ම යක්ෂ, නාග, මළවුන් ආදී ඇදහිලි ද දක්නට තිබුණි. මුල් යුගයේ තිස්තුන් කෝටියක් දෙවියන් ඇදහූ මිනිසුන් පසුව "මහා බ්‍රහ්ම" නමින් සර්ව බලධාරී

එක් දෙවියෙකු අදහන්නට වූ බව දක්වේ. ත්‍රිපිටක සාහිත්‍ය ගත තොරතුරු අනුව යක්ෂයින්, අසුරයින්, ගාන්ධර්වයින්, කුම්භාණ්ඩයින්, නාගයින් යන අමනුෂ්‍ය කොට්ඨාස ගැන තොරතුරු දක්වෙන අතර දෙවියන් හා බ්‍රහ්මයින් ලෝකයේ ශ්‍රේෂ්ඨයින් බව විස්තර වෙයි. මනාවූ කුසල් කිරීම නිසා දේව ආත්ම ලැබූ දෙවිවරු සිටින ලෝක සයක් ගැන බුදු දහමෙහි කරුණු විස්තර වෙයි. මනාවූ කුසල් කිරීම නිසා දේව ආත්ම ලැබූ දෙවිවරු සිටින ලෝක ලෙස චාතුම්මහාරාජික දිව්‍ය ලෝකය හැඳින්වෙයි. එම දිව්‍ය ලෝකයේ දිසා හතරකට අධිගෘහිතව සිටින දෙවිවරු සතර දෙනෙකු ගැන විස්තර වෙයි.

නැගෙනහිරට අධිපති ලෙස ධෘතරාෂ්ඨ දෙවියන් ද, දකුණු දිශාවට අධිපති ලෙස විරූඪ දෙවියන් ද, බටහිර දිශාවට අධිපති ලෙස විරූපාක්ෂ දෙවියන් ද, උතුරු දිශාවට අධිපති ලෙස වෛශ්‍රවණ දෙවියන් ද, සිටින බව සඳහන් වෙයි. මෙම දෙවිවරුන් සම්බුදු සසුන රකින සතර වරම් දෙවිවරුන් ලෙස ද හඳුන්වා ඇත. එම චාතුම්මහාරාජික දිව්‍ය ලෝකයට ඉහළින් තාවතිංශය නම් දිව්‍ය ලෝකය පවතින අතර එහි දෙලොවට ම අධිපති ශක්‍ර දේවේන්ද්‍ර හෙවත් සක්විති රජු වාසය කරනු ලබයි. එම දිව්‍ය ලෝකයට ඉහළින් යාමය හා තුසිත දිව්‍ය දෙක පිහිටා ඇත. ඊට පසුව නිම්මානරති දිව්‍ය ලෝකය හා පරිනිම්මිත වසවත්තිය දිව්‍ය ලෝකය පිහිටා ඇත. මින් නිම්මානරති දිව්‍ය ලෝකයේ මැවුම්කාර දෙවිවරු සිටින බව සඳහන් වේ.

ඉහත ලෝකවල සිටින බොහෝ දෙවිවරු බුදුරදුන් සමඟ ද සංවාද පවත්වා ඇත. බුදු දහමෙහි දෙවිවරු කොටස් දෙකක් ගැන විස්තර වෙයි. එනම්,

01. සම්‍යක් දෘෂ්ටික දෙවිවරු
02. මිථ්‍යා දෘෂ්ටික දෙවිවරු යනුයි.

සම්‍යක් දෘෂ්ටික දෙවිවරු යනු බුදු දහම අසා බුදු දහම පිළිගත් දෙවිවරු ය. ඔවුන් නිරතුරුව ඔවුන්ට පින් අනුමෝදන් කරන මිනිසුන් ආරක්ෂා කරන බව සඳහන් වන අතර මිථ්‍යා දෘෂ්ටික දෙවිවරු වැරදි අදහස් උදහස් ඇතිව දිව්‍ය ලෝකවල අධික කාම සැප විඳින බව දක්වේ. කෙසේ වෙතත් කවර හෝ දෙවියකු හෝ දිව්‍යාංගනාවක වීමට මනුෂ්‍ය ලෝකයේ දී පිංකම් හේතු වන බව බුදු දහමෙහි නිරතුරුවම දක්නට ලැබෙයි. බුදුරජාණන් වහන්සේ විසින් මංගල, පරාභව, ධජග්ග, ආටානාටිය ආදී සූත්‍ර රැසක්ම දේශනා කොට ඇත්තේ දෙවියන් අරමුණු කරගෙනයි.

බෝසතුන් මෙලොව ඉපදීමට පෙර තව්තිසා දිව්‍ය ලෝකයේ සිටි බවත් දේව ආරාධනාවකට අනුව පස්මහ බැලුම් බලා මෙලොව ඉපදුන අතර බරණැස ඉසිපතනාරාමයේ දී ප්‍රථම දම් දෙසුම පවත්වන අවස්ථාවේ ද දෙවිවරු පැමිණ බණ අසා සිටියහ. ප්‍රථම දම් දෙසුම වූ දම්සක් පැවතුම් සූත්‍රයේ ද දිව්‍ය ලෝක පිළිබඳව ද සඳහන් වෙයි. මිනිස් ලොවට වඩා දිව්‍ය ලෝකවල ආයු ප්‍රමාණය වැඩි වන අතර ඇතැම් දිව්‍ය ලෝකවල ආයුෂ මිනිස් ලොව අවුරුදු 100ක් දිව්‍ය ලෝකයේ එක දවසක් බවත්, එමෙන්ම ඇතැම් දිව්‍ය ලෝකවල මිනිස් ලොව අවුරුදු දහසක් එහි එක් දවසක් ආදී ලෙසත් දක්වේ. ඊට අමතරව දිව්‍ය ලෝකයේ ඇති මදාරා, පරසතු, කඩුපුල් ආදී මල් වර්ග ගැනත් එහි ඇති ගංගාවන් පිළිබඳවත් සඳහන් වෙයි. දෙවිවරු ආහාර

අනුභව නොකරන අතර සතුට ඔවුන්ගේ ආහාරය බව ද විස්තර වේ.

දීඝ නිකායේ මහා සමය සූත්‍රය අනුව එකල සිටි දේව සමූහයන් පිළිබඳවත්, දිව්‍ය ලෝකයේ සිටින ප්‍රධාන දෙවිවරු ගැනත්, එම දෙවිවරු අණසක පවත්වන දිශාවන් ගැනත් විස්තර වේ. සංයුක්ත නිකායේ සක්කපඤ්හ සූත්‍රය අනුව,

**යේ ගහට්ඨා පුඤ්ඤකරා**
**සීලවන්තෝ උපාසකා**
**ධම්මේන දාරං පෝසෙන්ති**
**තේ නමස්සාමි මාතලී**

පින් දහම් කරන සිල්වත් ගිහි උපාසක උපාසිකාවන්ට ශක්‍ර දේවේන්ද්‍රයා නමස්කාර කරන බව දැක්වේ. ඒ අනුව ධර්මානුකූලව කටයුතු කරන ගිහි ජනයාට දෙවියන්ගේ ආශිර්වාදය ලැබෙන බව බුදු දහම අවධාරණය කොට ඇත. සංයුක්ත නිකායේ සක්කපඤ්හ සූත්‍රය අනුව දිව්‍ය ලෝකයේ සිටින පංචසික නම් වීණා වාදකයා බුදුරදුන් සමඟ සංවාද කළ අයුරුත් ඔහුගේ වීණා වාදනය බුදුරදුන් අගය කළ අයුරුත් සඳහන් වෙයි.

මනුෂ්‍ය ලෝකයේ ජීවත්වන මිනිසුන් පින් දහම් කොට අනුමෝදන් කරන පින් ලබාගන්නා දෙවිවරු මනුෂ්‍ය ලෝකයේ වෙසෙන මිනිසුන් ආරක්ෂා කරන බව අංගුත්තර නිකායේ දැක්වෙන සූත්‍ර ධර්ම වලින් තවදුරටත් පැහැදිලි වෙයි. දිව්‍ය ලෝකයේ සිටින දෙවිවරු වරින්වර මිනිස් ලොවට පැමිණ සිල්වත් ගුණ දහම් රකින මිනිසුන්ට ආරක්ෂාව සලසන බව ද එහි දැක්වේ.

බුදුරජාණන් වහන්සේ ප්‍රාතිහාර්ය දක්වන අවස්ථාවල දෙවියන් පැමිණ වැඳුම් පිදුම් කළ අතර උන්වහන්සේ ලක්දිවට වඩින විට සුමන සමන් දෙවියන් බුදු සිරසට ඡත්‍රයක් අල්ලාගෙන පැමිණි බව මහාවංශයේ සඳහන් වෙයි. ඒ අනුව ලක්දිව සමනල අඩවියට සුමන සමන් දෙවියන් අධිගෘහිතව සිටින බව දක්වෙන අතර බුදුරදුන් පිරිනිවන්පාන අවස්ථාවේ ලක්දිව ආරක්ෂා කරන ලෙසට දෙවියන්ට භාරකල බව ද සඳහන් වෙයි. බුදුරදුන් පිරිනිවන් පානා අවස්ථාවේ දෙව් ලොවට අධිපති ශක්‍රයා "අනිච්චාවත සංඛාරා" යනාදී ගාථාව කියමින් ශෝකය ප්‍රකාශ කල බව ද බුදුදහමෙහි සඳහන් වෙයි.

දෙවිවරුන්ටත් වඩා ඉහළින් පිහිටි බ්‍රහ්ම ලෝක විස්සක් ගැන ද බුදු දහමෙහි සඳහන් වේ. බ්‍රහ්මයන් යනු දෙවියන්ට වඩා ශ්‍රේෂ්ඨ පිරිසක් බව ද දක්වේ. ශුද්ධාවාස නම් බ්‍රහ්ම ලෝකයේ අනාගාමී මාර්ගයන්ට පත් බ්‍රහ්මයින් වාසය කරන අතර පසුව ඔවුන් අරහත් බවට පත්ව නිර්වානාවබෝධය ලබන බව ද සඳහන් වේ. ශක්‍රයා සෝවාන් ඵලයට පත් වූ අතර සහම්පති බ්‍රහ්මයා අනාගාමී ඵලයට පත් වූ බවට ද එහි විස්තර වෙයි.


මේ අනුව සම්‍යක් දෘෂ්ටික දෙවිවරු බුදුරදුන්ගෙන් ධර්මය අසා විවිධ මාර්ගඵලයන්ට පත්වී ඇති අතර බුදුපාමොක් මහ සඟනට උපස්ථාන කිරීමත් සැදැහැවත් බොදුනුවන්ගේ ආරක්ෂාවත් ඔවුන් විසින් සලසන බව බුදුදහමෙහි විස්තර වෙයි. මේ අනුව බුදු දහමෙහි දේව සංකල්පය ඉතා පුළුල් ලෙස විග්‍රහ වෙයි.

බුදුරජාණන් වහන්සේ ගේ දේශනාවන්ට වෙනත් මඟක යමින් වත්මන් ලාංකිකයන් හා ලෝවැසියන් දෙවියන් ඇදහීමට නැඹුරු වී ඇති බව පැහැදිලි කරුණකි.

ලංකාව විවිධ විදේශීය ආක්‍රමණයන්ට ලක්වීමත් සමඟ හින්දු, ක්‍රිස්තියානි ආගම්වල ඇදහීම් ක්‍රම ලක්වැසියාට ද හුරු පුරුදු වී ඇත. පොළොන්නරු යුගයේ බොහෝ රජවරු හින්දු කාන්තාවන් සමඟ විවාහ වූ නිසා රජු විහාරයට බුදුන් වැඳීමට ගිය විට තම රජ බිසවට වන්දනාමාන කිරීම සඳහා ආරාමවල දේවාල ඉදිකළ බව සඳහන් වෙති. එම යුගයේ පටන් අද දක්වා එහි විකාශනයක් ලෙස අද මුළු මහත් ලංකාවේ ම වෙහෙර විහාරස්ථාන තුළ දේවාල ඉදිකරමින් බෞද්ධ වන්දනාවන්ට අමතරව දේව ඇදහිලි හා පුද සිරිත් දක්නට ඇත. විෂ්ණු, කතරගම, විභීෂණ, දැඩිමුණ්ඩ, නාථ, පත්තිනි ආදී ලෙස හින්දු දහමෙහි පිළිගත් දෙවියන් ඇදහීමට ලාංකීය බෞද්ධයෝ හුරුපුරුදු වී සිටිති. මිනිසාට වඩා අසීමිත බලයක් දෙවියන්ට ඇතැයි විශ්වාස කරන මිනිසුන් විවිධ පුද පූජා භාරහාර සිදුකරමින් විවිධ සම්පත් ප්‍රාර්ථනා කරති. නමුත් බෞද්ධ සංකල්පයට අනුව මෙලෙස දෙවියන් ඇදහීම නුවණැති ක්‍රියාවක් නොවේ. තම ජීවිතයේ ප්‍රාර්ථනා සඵල කර ගැනීමට තම උත්සාහයෙන් වෙහෙස මහන්සියෙන් ක්‍රියා කළ යුතු අතර දෙවියන් ඇදහීමෙන් තම අපේක්ෂා සඵල කරගත නොහැකි ය.

# 10

# බුදු දහම හා නිවන



මෙලොව උපන් මිනිසා ඇතුළු සෑම සත්ත්වයෙකු ම සැප විඳීමට කැමති වන අතර දුක් විඳීමට අකමැති ය. වත්මන් සමාජයේ සෑම මිනිසෙකුම තම සුවය සඳහා

විවිධ ලෙසින් වෙහෙසෙයි. සිද්ධාර්ථ බෝසතාණන් වහන්සේ ද සදාකාලික සුවය සොයා ගියේ ය. මිනිසා විඳින විවිධ වූ දුක් ගැහැට උන් වහන්සේ දුටු සේක. විසිනව වසරක් ගිහි ගෙයි විසූ බෝසතුන් පංචකාම සම්පත් වින්දනය කළේය. එය තාවකාලික සුවයක් පමණක් බවත් ශරීරයට සැප දීමෙන් සදාකාලික සුවය ලැබිය නොහැකි බවත් වටහා ගත් බෝසතාණෝ පැවිදිව සදාකාලික සුවය වෙනුවෙන් අවුරුදු සයක් දුෂ්කර ක්‍රියා කළහ. එකල ඇතැමුන් අනුගමනය කළ ශරීරයට දුක් දී සැප සෙවීමේ එම ක්‍රමය ද අත්හළ බෝසතාණෝ මධ්‍යම ප්‍රතිපදාව හෙවත් ආර්ය අෂ්ඨාංගික මාර්ගය අනුගමනය කොට බුද්ධත්වය ලබා උතුම් නිවනින් සැනසුණු සේක.

වත්මන් සමාජයේ බොහෝ දෙනා තම සැපය සඳහා විවිධ ක්‍රියා මාර්ග අනුගමනය කරති. ඇතැම්හු දුශ්චරිත ක්‍රියා ද ඇතැම්හු සුචරිත ක්‍රියා ද කරති. එසේ කුමන ක්‍රමයකින් සැප සෙව්වද එහිදී ලබන සැපය තාවකාලික ය. රාගය, ද්වේශය, මෝහය මුල්කර ගනිමින් විවිධ අමුණු හා ආශාවන් පසුපස ගොස් ලබන සුවය තාවකාලික වින්දනයක් සේ ම කෙලෙස් සිතිවිලි තවත් වර්ධනය කරවයි.

බුදු දහමට අනුව මෙලොව උපදින පුද්ගලයා ගේ අපේක්ෂා 3 ක් දක්වේ. එනම්, මොලොව දියුණුව, පරලොව දියුණුව සහ නිවන් සුවය සලසා ගැනීමයි. මොලොව දියුණුව යනු ඇස, කණ, නාසය, දිව, ශරීරය පිනවමින් ජීවත් වීමයි. එසේ මෙලොව තාවකාලික සුවය ලබන පුද්ගලයා පරලොව ද එම සැපයම අපේක්ෂා කරයි. නමුත් එය තාවකාලක බව බුදු දහමේ සඳහන් වේ. බුදු සමය විග්‍රහ කරන අග්‍රඵලය නම් නිවන් සුවයයි.

එය කෙලෙස් දුරු කිරීමෙන් ලබන සුවයකි. ලෝභය, ද්වේශය, මෝහය, යන අකුසල සිතිවිලි දුරුකොට අලෝභ, අදෝස, අමෝහ යන කුසල සිතිවිල වැඩීම නිවන් මගේ මුල් පියවරයි. එම නිසා බුද්ධ, ධම්ම, සංඝ යන තෙරුවන කෙරෙහි ශ්‍රද්ධාව පළමුව ඇතිකරගත යුතු වේ. නිවන් දකින තුරු කායික හා මානසික සුවය ශ්‍රද්ධාවෙන් හා කුසල සිතිවිලිවලින් ලැබිය හැකි ය. සිත, කය, වචනය යන තුන් දොර සංවර කර ගනිමින් නිවන් සුවය පිළිබඳ අධ්‍යයනය කළ යුතු වේ.

බුදුරදුන් දම්සක් පැවතුම් සූත්‍රයේදී දුක, දුකට හේතුව, දුක නැති කිරීම හා දුක නැති කිරීමේ මඟ යන චතුරාර්ය සත්‍ය දේශනා කළ සේක. එහිදී, දුක නැති කිරීම යනු නිවනයි. මේ ලොවේ නිරතුරුවම ඇති ස්වභාවය නම් දුකයි. එම දුකට හේතුව තණ්හාවයි. තණ්හාව නැති කළ කල්හි දුක හට නොගනී. එම නිසා තණ්හාව සහමුලින් ම නැති කිරීම යනු දුක නැතිවීම හෙවත් නිවනයි. එම නිවන ලබාගැනීමට යා යුතු මඟ මැදුම් පිළිවෙත හෙවත් ආර්ය අෂ්ඨාංගික මාර්ගයයි. එනම්, සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යනුයි. මින් මුලින් දැක්වෙන සම්මා දිට්ඨි, සම්මා සංකල්ප දෙක ප්‍රඥාව ලෙසින් ද, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව යන තුන සීලය ලෙසින් ද, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන තුන සමාධි ලෙසින් ද ප්‍රගුණ කිරීමෙන් සියලු කෙළෙස් නිවා නිවන් මඟට පිවිසීමට හැකියාව ලැබෙයි. එම අනුපූර්ව ත්‍රි ශික්ෂාව (සීල, සමාධි, ප්‍රඥා) නිරතුරුව වැඩීමෙන් කායික මානසික සහනය ද හිමිවනු ඇත.

බුදුරජාණන් වහන්සේ විසින් කෙලෙසුන් දුරුකොට සෝවාන්, සකෘදාගාමී, අනාගාමී, අරහත් යන මාර්ග හා ඵල අනුව නිවන් දකින මඟ විග්‍රහ කොට ඇත. මිනිසා ඇතුළු සියලු සත්වයා මෙලොව බැඳ තබන සංයෝජන ධර්ම 10 ක් ඇත. එනම්,

1. සක්කාය දිට්ඨි (මමය, මාගේ ය යන ආත්ම දෘෂ්ටිය)
2. විචිකිච්ඡා (බුද්ධාදී අටතැන්හි සැකය)
3. සීලබ්බත - පරාමාස (මිසදිටු ඉගැන්වීම් පිළිගැනීම)
4. කාමරාග (පස්කම් සැප පිළිබඳ ආශාව)
5. ව්‍යාපාද (ක්‍රෝධය)
6. රූපරාග (රූපාවචර බ්‍රහ්ම ලෝකවල ඉපදීමට ආශාව)
7. අරූපරාග (අරූපාවචර බ්‍රහ්ම ලෝකවල ඉපදීමට ආශාව)
8. මාන (අහංකාරය)
9. උද්ධච්ච ( නොසන්සුන්කම)
10. අවිජ්ජා (නොදැනීම) යනුයි.

ඉහත සංයෝජන දහය අතරින් සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස යන සංයෝජන තුන දුරු කිරීමෙන් සෝවාන් ඵලයට පත්වෙයි. පසුව දැක්වෙන කාම රාග හා ව්‍යාපාදය තුනී කිරීමෙන් සකෘදාගාමී ඵලය ලැබේ. එම දෙක සම්පූර්ණ ලෙස දුරු කිරීමෙන් අනාගාමී ඵලය ලැබේ. පසුව දැක්වෙන රූපරාග, අරූපරාග, මාන, උද්ධච්ච, අවිජ්ජා යන පහ දුරු කිරීමෙන් සියලු කෙලෙසුන් නසා අරහත් ඵලය ලබාගත හැකි ය. ඉහත සංයෝජන දහයෙන් මුල් පහ ඕරම්භාගිය සංයෝජන ලෙසත්, සෙසු සංයෝජන පහ උද්ධම්භාගිය


සංයෝජන ලෙසත්, හැඳින්වෙන අතර එම දහයම දුරු කිරීමෙන් අරහත් ඵලය ලබා ආසවක්ඛය ඥාණය තුළින් නිර්වාණාවබෝධයට පත්වෙයි.

බුදුරදුන් දෙසූ භාවනා ප්‍රගුණ කිරීමෙන් ද නිර්වාණාවබෝධය ලබාගත හැකි ය. සමථ හා විදර්ශනා නමින් භාවනා ක්‍රම දෙකකි. ඉන් සමථ භාවනාවෙන් කරනුයේ පංචනීවරණ යටපත් කිරීමයි. සමථ භාවනා වැඩීමෙන් ධ්‍යාන හා සමාපත්ති ලබා ගැනීමට හැකියාව ලැබෙන අතර බුදුරදුන් ලොව පහළ වීමට පෙර ද එම භාවනාව ප්‍රගුණ කළ තවුසෝ සිටියහ. බුදුරජාණන් වහන්සේ තම ඥානයෙන් නිර්වාණාවබෝධය ලබා ගැනීම සඳහා දේශනා කොට ඇති භාවනා ක්‍රමය විදර්ශනා භාවනාවයි. ලොව ඇති සියලු වස්තූහු අනිත්‍යයි, දුකයි, අනාත්මයි යනුවෙන් මෙනෙහි කිරීම විදර්ශනා භාවනාව නම් වේ. ඒ තුළින් පුද්ගල පංචස්කන්ධය කෙරෙහි මමය, මාගේය යන මමත්වය දුරුවෙයි. එය නිවන් සුවය පිණිසම හේතුවෙයි.

මේ අනුව ඔබට නිවන යනු කුමක්දැයි වැටහෙනු ඇත. කෙලෙසුන් දුරු කිරීමට උත්සාහ කරන තැනැත්තාට නිවන දුර නොවේ. එම පුද්ගලයා වෙත නිවන ළං වෙයි. රාගය, ද්වේශය, මෝහය වඩන පුද්ගලයාට නිවන බොහෝ දුරය. එබඳු තැනැත්තාගේ සසර ගමන ද දිගය. එනිසා ඔබත් නිවන් මඟ හඳුනාගෙන රාග, ද්වේශ, මෝහා දී කෙලෙසුන් දුරුකර නිවනින් සැනසීමට උත්සාහ කරන්න.

# 11

# බුදු දහම හා සමාජ පැවැත්ම



සමාජයක යහපැවැත්ම සඳහා විනය හෙවත් හික්මීම අතිශය වැදගත් ය. බුදුරදුන් "විනයෝ නාම සාසනස්ස ආයු" යනුවෙන් දේශනා කරමින් විනය බුදු සසුනේ ආයුෂ ලෙස පැහැදිලි කරදී ඇත. ඒ අනුව සමාජයේ

යහපැවැත්ම සඳහා ආචාර ධර්ම අවශ්‍යය. බුදුරදුන් බුද්ධත්වයට පත්වීමෙන් පසු මුල් විසි වසර තුළ කිසිඳු විනය නීතියක් නොපැනවීය. නමුත් පසුව පැවිදි වූ පිරිසගේ විනය විරෝධී ක්‍රියා දුටු බුදුරදුන් විනය ශික්ෂා පද පනවා වදාළ සේක. ඒ තුළින් වර්තමානය දක්වා බුදු සසුන නොනැසී පවතියි.

නූතන සමාජ සංස්ථාව දෙස බැලීමේ දී විවිධ දූෂිත ක්‍රියාවන්ට යොමු වූ පුද්ගලයන් දැකිය හැකිය. ආගමික ශාස්තෘන් විසින් පනවා වදාළ ආචාර ධර්ම නොපිළිපැදීම හා රාජ්‍ය නීති පිළිනොගෙන ක්‍රියාකිරීම ඊට හේතුවයි. දූෂිත සමාජයක් නිවැරදි මගට ගැනීමේ දී විවිධ ක්‍රමෝපාය අනුගමනය කළ යුතු ය.

බුදු දහම විනය ගරුක සමාජයක් සඳහා පංචශීල ප්‍රතිපත්තිය හඳුන්වා දී ඇති අතර රාජ්‍ය නීති සංග්‍රහයේ ද මෙය වෙනත් නම්වලින් ඉදිරිපත් කොට ඇත. රජයක වගකීම වන්නේ රට වැසියා සුඛිත මුදිත භාවයට පත් කිරීයි. ඒ සඳහා රාජ්‍ය නීති ක්‍රියාත්මක විය යුතු ය. ආගම මගින් පනවා ඇති ශික්ෂා මගින් ස්වයං පාලනයක් ඇති කර නොගන්නේ නම් රාජ්‍ය නීති රීති මගින් පුද්ගලයා හික්මවීම කළ යුතු ය. නමුත් වත්මන් රාජ්‍ය නීති සිදුරු සහිතය. වැරදිකරුවාට නීතියේ රැහැනෙන් පලාගොස් නැවත වැරදි කිරීමට හැකියාව ඇත. දේශපාලනය හා පුද්ගල හිතවත්කම් අනුව වැරදි කරුවාට දඬුවම් හිමි නොවේ. එනිසා ආගම තුළින් ඇති කරන විනය සමාජ යහපැවැත්මට මනා අනුබලයක් වෙයි. ආගමික ශාස්තෘවරයාට ඇති ගෞරවය නිසා විනය ශික්ෂා පිළිපැදීමට අන්‍යයන්ගේ බල කිරීමකින් තොරව යොමුවෙයි.

වත්මන් සමාජයේ විවිධ අපරාධ, වංචා, දූෂණ දසතින් අසන්නට දකින්නට ලැබෙයි. බුදු දහම අනුව ඒවා,

1. වැරදි සිතිවිලි
2. වැරදි වචන
3. වැරදි ක්‍රියා

යනුවෙන් වර්ග කළ හැකි ය. නපුරු සිතිවිලි ඇති කරගනු ලබන පුද්ගලයා නපුරු වචන කතා කරයි. දූෂිත ක්‍රියාවල නියුතු වෙයි. මෙබඳු පුද්ගලයන් නිසා සමාජය දූෂිත සමාජයක් බවට පත්වෙයි. නමුත් යම් පුද්ගලයෙකු සැබෑ ලෙසින් තෙරුවන් සරණ ගොස් පන්සිල් සුරකිමින් තිදොර සංවර කර ගනී ද ඔහු නපුරු දේ නොසිතයි. නපුරු වචන කතා නොකරයි. නරක ක්‍රියා නොකරයි. එබඳු පුද්ගලයා පාලනය කිරීමට රාජ්‍ය නීති හෝ වෙනත් සමාජ නීති රීති අවශ්‍ය නොවේ.

අද සමාජයේ සැබෑ ලෙස තම ආගමට අනුව ක්‍රියා කරන පිරිස දුර්ලභ ය. තම ආගමෙහි ආචාර ධර්ම පද්ධතිය පිළිබඳ නොසිතයි. ආගම් නායකයාට ගරු නොකරයි. පුද පූජා නොපවත්වයි. මිල මුදල් පසුපසම හඹා යයි. මුදල් හා වෙනත් වස්තුව සෙවීමටම මුළු මහත් ජීවිතයම කැප කරයි. ඒ අනුව මුදල් හා වස්තුව සොයා ගනී. ධර්මය නොදත්කම නිසා තමා උපයන වස්තු විනාශ වෙයි. සුරාවට, සූදුවට ඇබ්බැහි වීම නිසා උපයන ධනය විනාශ වෙයි. එමෙන්ම ජලයෙන්, ගින්නෙන්, සොර සතුරන්ගෙන් විනාශ වෙයි. ලෝභය හා මසුරුකම නිසා ඉපයූ ධනයෙන් සතුටක් නොලබයි. මෙවන් විපත් පුද්ගලයාට සිදු වනුයේ ධර්මය අනුව

කටයුතු නොකරන නිසයි. වත්මන් සමාජ සංස්ථාවේ මෙබඳු පුද්ගලයන් සුලභව දැකිය හැකි ය.

සෙසු සත්වයන් අතරින් මිනිසාට දියුණු කළ හැකි චින්තනයක් පැවතිය ද නිවැරදිව සිත මෙහෙයවා කටයුතු නොකරීමෙන් ඉතා පහත් තත්ත්වයට පත්ව ඇත. නූතන සමාජයේ අනුගාමිකයන්ට උපදෙස් දෙන උපදේශකයන් ද නිවැරදි උපදෙස් ලබා නොදීම නිසා ද මිනිස් සමාජය වැරදි මාර්ගවලට යොමු වී ඇත. ධර්ම දේශනා - බෝධි පූජා - භාවනා, පිරිත් දේශනා ආදී ක්‍රියාවල දී හරි මාර්ගය වෙනුවට වැරදි ධර්ම දේශනා තුළින් බුදුරදුන් දෙසූ දහම වෙනුවට දේශකයාගේ අදහස් ශ්‍රාවකයාට ප්‍රකාශ කිරීම, භාවනාව විලාසිතාවක් මෙන්ම මුලා කරවන ලෙස එය උපයෝගී කර ගැනීම, පිරිත් දේශනය නවීකරණය කිරීම ආදිය තුළින් ධර්මයටත් විනයටත් ශ්‍රාවකයාගේ චින්තනයටත් සිදුවන හානිය සුළුපටු නොවේ. එදා පටන් මේ දක්වා මිනිසා සුමඟට යොමු කළ ආගමික චාරිත්‍ර වාරිත්‍ර පුද පූජා වර්තමානයේ නවීකරණයට ලක් කිරීම නිසා මිනිස් සමාජයේ විවේචනයට ද එය ලක් වී ඇත. එනිසා පෙර පටන් පැවත ආ ආගමික සිරිත් විරිත් පුද පූජා කඩ නොකර ඒ අයුරින් ම පවත්වාගෙන යා යුතු ය.

බෞද්ධ නිවසේ වැදුම් පිදුම් ආගමික සිරිත් අද සිදු නොකරයි. ඒවා සිදු කරන්නේ නම් ඒ පවුලේ කිහිප දෙනෙකු පමණි. මත් වතුර සහ දුම් පානය නිසා නිවස අපවිත්‍ර වී ඇත. සූදුව හා වැරදි කාමසේවනය ද ඇතැම් නිවෙස්වල දැකිය හැකි ය. මව්පිය දූ දරු ස්වාමි භාර්යා සබඳතා පළුදු වී ගොසිනි. විදේශිකයා පවා ඇගයීමට ලක් කළ හෙළ බොදු ආගන්තුක සත්කාරය ද ගිලිහෙමින්


පවතී. ගුවන් විදුලිය හා රූපවාහිනිය කිසිදු හිරිකිතයකින් තොරව සදාචාර විරෝධී වැඩසටහන් ඉදිරිපත් කරයි. අසභ්‍ය පොත්පත්, සඟරා, වීඩියෝ පට සෑම තැනකම දක්නට ඇත. මේ තුළින් සමාජය වල්මත් වී ඇත. පුද්ගල විනය හා ආචාර ධර්ම මෙනිසා ගිලිහී ගොස් දුරාචාරයට යොමු වී තිබේ.

විනය ගරුක සමාජයක් නිර්මාණයෙහිලා ආගමික නායකයින්ගේ මෙහෙය අතිශය වැදගත් ය. බෞද්ධ, කතෝලික, හින්දු, ඉස්ලාම් ආදී ආගමික ස්ථාන හා ආගමික නායකයින් අප රටේ සිටී. බුදු දහම බහුතර ජනතාවගේ ආගමයි. විවිධ සන්නිවේදන ක්‍රම මගින් ආචාර ධර්ම පුරුදු පුහුණු කර වීමට ලංකාවේ සියලුම ආගමික නායකයින් තම ආගමික මධ්‍යස්ථාන හරහා ක්‍රියාකළ යුතු ය. ආගම දහමට අනුව ජීවත් විය හැකි පරිසරයයක් ද නිර්මාණය විය යුතු අතර, එය රාජ්‍ය පාලක පක්ෂයේ වගකීම වේ. ආගම දහම මගින් මිනිස් සමාජයට ලබාදෙන දැනුම ආකල්පයන්ට අනුව ජීවත් විය හැකි පරිසරයක් නූතන යුගයේ නොමැති වීම කණගාටුවට කරුණකි. පෙර සිටි රාජ්‍ය නායකයින්ගේ දුර්වල ප්‍රතිපත්ති නිසා එවන් තත්ත්වයක් උදා වී ඇත. නමුත් සමාජය නිවැරදි මඟට යොමු කිරීමට සුදුසු කාලය දැන් උදා වී ඇත. පංච ශීලය, දස පනත හෝ සෙසු ආගමික ආචාර ධර්ම පද්ධති අනුව සමාජීය පුද්ගලයන් ක්‍රියා කරන්නේ නම් එවන් සමාජයේ සියලු දෙනාටම යුක්තිය සාධාරණය ඉටුවී සතුටින් සැනසීමෙන් ජීවත් වීමට හැකියාව ලැබේ. එවන් විනය ගරුක සමාජයක් බිහිකර ගැනීම සඳහා වගකිව යුත්තන් මෙන්ම අප සියලු දෙනා ද උත්සාහ ගත යුතු ය. එවිට සත්ව හා මනුෂ්‍ය

ඝාතනය, සොරකම, දූෂණය, බොරුව, මත්වතුර හා මත්ද්‍රව්‍ය භාවිතය ආදී දුශ්චරිත ක්‍රියා සිදු නොවේ. දූෂිත ක්‍රියා කරන්නන්ට එරෙහිව වැටකඩොළු බාධක පැනවිය යුතු අතර සුචරිතයෙහි යෙදෙන්නන්ට අවශ්‍ය පහසුකම් සලසා දිය යුතු ය. ලක්වැසි සියලු දෙනා අපේක්ෂා කරන විනයගරුක සමාජය බිහිවන්නේ එවිටයි. ඒ සඳහා අප විවිධ කැපකිරීම් කළ යුතු ය. එම කැපවීම් හා යුතුකම් තුළින් යහපත් සමාජයක් ම බිහිවෙනු ඇත.

# 12

# බුදු දහම හා රාජ්‍ය පාලනය



බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කොට ඇති විවිධ සංකල්ප අතර රාජ්‍ය පාලනය පිළිබඳ සංකල්පය ඉතා පුළුල් ලෙස විග්‍රහ කොට ඇත. බුදු දහමට අනුව රාජ්‍ය පාලනය පිළිබඳ ඓතිහාසික කතා පුවත දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රයෙන් විස්තර වෙයි.

ආභස්සර නම් බ්‍රහ්ම ලෝකයෙන් චුතව ආ බ්‍රහ්මයෝ පෘථිවියේ උපත ලැබූහ. ක්‍රමයෙන් පරිනාමයට පත් වූ ඔවුහු මිනිසුන් ලෙස හඳුන්වන්නට විය. මුල් කාලයේ ඔවුන් පෘථිවියේ ඇති වස්තු පොදුවේ පරිහරණය කළ අතර පෞද්ගලිකත්වයක් නොවී ය. කල්යත්ම ඇතැම් මිනිස්සු සම්පත් පෞද්ගලිකව බෙදා වෙන්කර ගෙන දේපළ පරිහරණය කරන්නට වූහ. එනිසා ඇතැමුන්ට සම්පත් අඩුවෙන් ද ඇතැමුන්ට වැඩියෙන් ද සම්පත් හිමි විය. ඒ තුළින් ඇති නැති පරතරයන් ඇතිවිය. එහි ප්‍රතිඵලය වූයේ දුප්පත් සහ පොහොසත් යනුවෙන් සමාජයේ මිනිසුන් දෙකොටසක් බවට පත් වීමයි. මෙනිසා මිනිස් සිත් තුළ තණ්හාව වර්ධනය වන්නට විය. දුප්පතුන් ධනවතුන්ගේ ධනය සොරකම් කරන්නට විය. සොරකම් කිරීම සඳහා අවි ආයුධ ද නිපදවන්නට විය. අවි ආයුධ නිපදවීමෙන් මිනිස් ඝාතන ඇතිවිය. ඉන් කලකෝලාහල ද හටගත්තේ ය. මිනිසුන් බොරුකීමට ද පෙලඹුණි.

සමාජයේ දිනෙන් දින කලකෝලාහල, අවුල් වියවුල් හට ගැනීමට පටන් ගත් නිසා වෛරය, ක්‍රෝධය, ඊර්ෂ්‍යාව ආදී පව්ටු සිතිවිලි මිනිස් සිත්තුළ ජනිත විය. සමාජයේ සැක බිය හට ගත්තේ ය. මෙහි අනිටු විපාක ගැන කල්පනා කළ සමාජයේ බුද්ධිමත් මිනිසුන් සාමකාමී සමාජයක් ඇති කිරීම සඳහා සාකච්ඡා පවත්වා විවිධ තීරණ ගනු ලැබී ය. එහි ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය නායකයා බිහි විය. සමාජයේ පුද්ගලයන් අතුරින් දක්ෂ ක්‍රියාශීලී බුද්ධිමත් පුද්ගලයකු ජනතාවගේ කැමැත්ත මත රජු වශයෙන් පත් විය. මහා ජන සම්මතයෙන් පත්වුණු ඔහු මනා පෞරුෂයෙන් යුතු පුද්ගලයෙකු විය. ඔහුගෙන් රටේ ජනතාව ප්‍රධාන වශයෙන් කරුණු තුනක් අපේක්ෂා කළහ. එනම්,

1. හික්මවිය යුතු පුද්ගලයන් හික්මවීම
2. ගැරහිය යුත්තන්ට ගැරහීම
3. නෙරපිය යුත්තන් රටින් නෙරපීම යනුයි.

ජනතා අපේක්ෂාවන් මුදුන්පත් කරමින් මෙලෙස රට පාලනය කළ රජුට ජනතාව අයබදු වශයෙන් තමන් උපයන ධනයෙන් කොටසක් ප්‍රදානය කළෝ ය.

රජු තමාගේ පාලන පහසුව පිණිස පසු කාලීනව පුරෝහිත, ඇමති, මන්ත්‍රී, නගර පාලක, ග්‍රාම නිලධාරී ආදී රාජ්‍ය නිලධාරීන් ද පත්කරගනු ලැබී ය. කල්යත්ම රාජ්‍ය පාලනයේ අරමුණු පාලකයන් තුළින් ගිලිහී යන්නට විය. ජනතා සුබ සිද්ධියට වඩා රාජ්‍ය නායකත්වයේ හා නිලධාරීන්ගේ සුභ සිද්ධිය වෙනුවෙන් ක්‍රියා කරන පාලන තන්ත්‍රයක් බිහි විය. ඒ නිසා පාලක හා පාලිත යන දෙපිරිස අතර විවිධ ගැටුම් ඇති විය.

බුදුරදුන් ලොව පහළවන සමය වන විට රාජ්‍ය පාලනය ක්‍රම දෙකකට බෙදී පැවතුණි. එනම්,

1. ඒකාධිපති රාජ්‍ය ක්‍රමය
2. සමූහාණ්ඩු පාලන ක්‍රමය යනුවෙනි.

බුදුරදුන් විසින් සමූහාණ්ඩු පාලන ක්‍රමය අගය කොට ඇති අතර මහ රජුගේ ඒකාධිපතිත්වයෙන් යුතුව පාලනය වූ ඒකාධිපති පාලන ක්‍රමය අගය කොට නැත. භාරතයේ විශාලා මහනුවර ලිච්ඡවී රජ දරුවන් සමූහාණ්ඩු පාලනයක් ගෙන ගිය බව සඳහන් වේ.

බුදුරජාණන් වහන්සේ දැහැමි රාජ්‍ය පාලන ක්‍රමයක් සඳහා හඳුන්වා දී ඇති ප්‍රතිපත්ති රැසක් බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වේ. එනම්,

1. තමා ධාර්මික වීම
2. පන්සිල් සුරැකීමේ ප්‍රතිපදා
3. දස සක්විතිවත් ප්‍රතිපදා
4. දස රාජ ධර්ම ප්‍රතිපදා
5. සප්ත අපරිහානී ධර්ම ප්‍රතිපදා
6. සතර සංග්‍රහ වස්තු ප්‍රතිපදා
7. බෞද්ධ ආර්ථික ප්‍රතිපදා

සෑම රජෙකුම පළමුව තමා ධාර්මික විය යුතු ය. බුදු දහම අගයන, ධර්මයට ගරු කරන, ධර්මයට සත්කාර කරන, ධර්මය ඡත්‍රයක් සේ සලකන අයෙකු විය යුතු ය. එමෙන් ම තමා පන්සිල් සුරකින අයෙකු විය යුතුය. එනම්,

1. මනුෂ්‍ය හා සත්ව ජීවිත ආරක්‍ෂා කිරීම.
2. ජනතා දේපළ සුරැකීම.
3. වැරදි කාම සේවනය නොකිරීම.
4. සත්‍යවාදී බව
5. මත්පැන් මත්ද්‍රව්‍යවලින් වැළැක්වීම යනුයි.

මෙම පංචශීලය නිරතුරුව රකින්නා සේම පොහොය දා අටසිල් සුරැකීම ද රාජ්‍ය නායකයකුට ඉතා වැදගත් වේ. ඒ තුළින් කෙලෙස් ධර්මන් ද දුරුවෙයි.

දීඝ නිකායේ චක්කවත්ති සිහනාද සූත්‍රයේ දැක්වෙන දස සක්විතිවත් සංකල්පය කවර රාජ්‍ය නායකයෙකුට වුව ද තම රාජ්‍යය සුඛිත මුදිත කර ගැනීම සඳහා බෙහෙවින් වැදගත්වෙයි.

1. තමා ධාර්මිකයෙකු වීම
2. තම අඹු දරුවන් දැහැමින් පෝෂණය කිරීම

3. යුධ භටයන්ට අවශ්‍ය පහසුකම් සැලසීම
4. ක්ෂත්‍රිය වංශිකයන්ට අවශ්‍ය පහසුකම් සැලසීම
5. බමුණු ගෘහපතියන්ට අවශ්‍ය පහසුකම් සැලසීම
6. නගර ගම් නියම්ගම් වැසියන්ට පහසුකම් සැලසීම
7. ශ්‍රමණ බමුණන්ට අවශ්‍ය පහසුකම් සැලසීම
8. තිරිසන් සතුන්ට රැකවරණ සැලසීම
9. දිළිඳු ජනතාවට උදව් උපකාර කිරීම
10. මහණ බමුණන්ගේ (ආගමික නායකයන්ගේ) උපදෙස් අනුව කටයුතු කිරීම

මෙම දස සක්විති සංකල්ප අනුගමනය කරමින් පාලනය කරන රාජ්‍යයක් කිසිදු කලෙක බිඳ නොවැටේ. අතීතයේ විසූ මහා විජිත, මධුර, දල්හනේමි, මඛාදේව, ධර්මාශෝක, දෙවන පෑතිස්, සිරිසඟබෝ යනාදී රජවරු ද මේ අනුව රාජ්‍ය පාලනය කොට රට සුඛිත මුදිත බවට පත් කළහ.

රාජ්‍ය නායකයෙකු තම රාජ්‍ය පාලනය කිරීමේ දී අනුගමනය කළ යුතු කරුණු දහයක් දස රාජ ධර්ම ලෙස බුදු දහමෙහි විග්‍රහ වෙයි. එනම්,

1. දානය
2. සීලය
3. පරිත්‍යාගය
4. අවංකබව
5. මෘදු බව
6. කෙළෙස් දුරු කිරීම
7. ක්‍රෝධ නොකිරීම
8. අවිහිංසාව
9. ඉවසීම
10. විරුද්ධ නොවීම

යන කරුණු දහයයි. රාජ්‍ය නායකයා මේ තුළින් මනාවූ ආධ්‍යාත්මික ශික්ෂණයකට පත්වන අතර එය ජනතාවගේ කීර්ති ප්‍රශංසා ලැබීමට ද මහඟු අනුබලයකි.

තමන් සහ රාජ්‍යය පරිහානියට පත් නොවී ගෞරවාන්විත පාලනයකට හේතුවන ප්‍රතිපත්ති හතක් සප්ත අපරිහානි ධර්ම ලෙස බුදු දහමේ විස්තර වෙයි.

1. රාජ්‍ය පාලකයින් නිතර එක්රැස් වීම.
2. සමගියෙන් රැස්වී සමගියෙන් ක්‍රියා කොට සමගියෙන් විසිර යාම
3. ජනතාවට පීඩා ගෙනදෙන නීති නොපනවා ජනතා සුභසිද්ධිය සඳහා පනවා ඇති නීති ක්‍රියාත්මක කිරීම
4. වැඩිහිටියන්ගේ උපදෙස්වලට ගරු කිරීම
5. කුල කාන්තාවන්ට රැකවරණය සැලසීම
6. ඓතිහාසික සිද්ධස්ථාන රැක ගැනීම
7. මධ්‍යස්ථ මතධාරී ආගමික නායකයින්ගේ උපදෙස් ලබා ගැනීම.

මෙම ප්‍රතිපත්ති බුද්ධ කාලීනයේ රජවරු අනුගමනය කොට එම රාජ්‍ය දැහැමි රාජ්‍යයක් බවට පත්කර ගෙන ඇත. විශාලා මහ නුවර ලිච්ඡවි රජ දරුවන් මෙම පාලන ප්‍රතිපත්ති අනුගමනය කොට රට සෞභාග්‍යමත් කර ගත් අතර ඔවුන් මිහිපිට සිටින දෙවිවරුන් ලෙස ද බුදුරදුන් හඳුන්වා දී ඇත.

රාජ්‍ය පාලනයේ දී පාලකයෙකුට විශේෂයෙන් තිබිය යුතු ගුණාංග සතරක් ලෙස සතර සංග්‍රහ වස්තු හැඳින්විය හැකි ය. රජෙකු නිරතුරුව රට වැසියන්ගේ සිත් දිනාගෙන ක්‍රියා කළ යුතු ය. ඒ සඳහා හේතු වන්නේ,

1. දානය (පරිත්‍යාගය)
2. ප්‍රිය වචනය (ජනයාට ප්‍රිය වචනයෙන් කතා කිරීම)
3. අර්ථ චර්යාව (ජනතාව යහපත් ක්‍රියාවල යෙදවීම)

4 සමානාත්මතාවය (සියලු ජනයාටම සමානව සැලකීම)

යන සතර සංග්‍රහ වස්තූන් ය. රාජ්‍ය පාලකයින් තමන් ගැන නොව ජනතාව ගැනම සිතා ක්‍රියා කළ යුතු ය. නිරතුරුව ඔවුන්ගේ සුභසිද්ධිය සඳහාම කටයුතු කළ යුතු ය. සියලු රට වැසියන්ට තමාගේ දරුවන් ලෙස සිතා ඔවුන්ට අවශ්‍ය සියලු පහසුකම් සැලසීම රාජ්‍ය නායකයාගේ වගකීම වේ.

බුදුරදුන් විසින් දේශිත, දීඝ නිකාය කූට දන්ත සූත්‍රයේ සඳහන් අයුරින් රටේ ආර්ථික සංවර්ධනය උදෙසා අනුගමනය කළ යුතු ආර්ථික ප්‍රතිපත්ති 3ක් එහි දැක්වේ. එනම්.

1. ගොවි ජනතාවට අවශ්‍ය ගොවි බිම්, පොහොර හා බීජ සපයා දීම.

2. වෙළෙන්දන්ට අවශ්‍ය ප්‍රවාහන පහසුකම්, වෙළඳ පොළ හා ප්‍රාග්ධන පහසුකම් ලබාදීම.

3. රාජ්‍ය සේවය කරන පිරිසට රැකියා, නිවාඩු හා වැටුප් ලබාදීම යනුයි.

එමෙන් ම සිඟාලෝවාද සූත්‍රයේ දැක්වෙන කරුණු අනුව රජෙකු කිසිවිටෙක ඡන්දය, ද්වේශය, භය, මෝහය යන සතර අගතියෙන් ක්‍රියා නොකළ යුතු බවත් දූර දක්නා නුවණින් එඩිතරව ක්‍රියා කළ යුතු බවත් සඳහන් වේ. දෙමව්පියන් තම දරුවාට දක්වන ස්නේහය මෙන් රාජ්‍ය නායකයා රටේ ජනතාවට මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යන සතර බ්‍රහ්ම විහරණයෙන් යුතුව ක්‍රියා කළ යුතු බව ද එහි දැක්වේ.

මේ අනුව රාජ්‍ය පාලන පක්ෂය රටේ ජනතාවගේ ආර්ථික, ආගමික, සාමාජික, සංස්කෘතික ප්‍රගතිය උදෙසා ක්‍රියා කරන ජනතාවගේ සිත් සතුටු කරන පිරිසකි. එනිසා සෑම රාජ්‍ය නායකයෙකුම බුදුරදුන් දේශනා කළ රාජ්‍ය පාලන ප්‍රතිපත්ති නිසිලෙස අනුගමනය කරන්නේ නම් දැහැමි සුඛිත මුදිත සමාජයක් රට තුළ බිහිවනු ඇත.

# 13

# බුදු දහම හා කම්කරු අයිතිය



බුදු දහම මනුෂ්‍ය මෙන්ම තිරිසන් සමාජයටත් ගහ කොළ ආදී පරිසරයටත් ආදරය කරුණාව දක්වන දහමකි. මිනිසා කිසි විටෙකත් අනුන්ගේ යහපත් අවවාදවලට මිස බලපෑම්වලට යටත් නොවිය යුතු බව බුදු දහමේ සඳහන් වේ. මානව කේන්ද්‍රීය වූ බුදු දහම මිනිසාගේ

නිදහස් චින්තනය අගය කරයි. සමානාත්මතා සංකල්පය යටතේ සමස්ථ මිනිස් සමාජයට ම සම අයිතිවාසිකම් හිමිකරදී ඇත. එනිසා කිසිදු මිනිසෙක් තවත් මිනිසෙකුගේ වහලෙකු, යටත් වැසියෙකු නොවිය යුතුය. සෑම මිනිසෙකුටම යුතුකම් ඉටුකිරීමෙන් අයිතිවාසිකම් ලැබීමට හිමිකම් ඇත.

බුදුරදුන් ලොව පහළ වූ සමයේ විවිධ විෂම වූ සමාජයක් ලොව පැවතුණි. බමුණු දහම යටතේ සුළු පිරිසකට පමණක් සියලු වරප්‍රසාද භුක්ති විඳීමට හැකියාව තිබූ අතර, විශාල පිරිසක් ඔවුන්ගේ වහලුන් බවට පත්කර ගනිමින් බැල මෙහෙවර කම්වලට යොදාගෙන තිබුණි. මිනිස් සමාජයේ ඇති-හැකි, නැති-බැරි, ලොකු-කුඩා, ධනපති-නිර්ධන ආදී ලෙසින් පන්ති පරතරයක් දක්නට තිබුණි. එකල පැවති බොහෝ මිථ්‍යා ආගමික ඉගැන්වීම්වලින් පවා මිනිස් අයිතිවාසිකම් අහිමිකර තිබුණි. සමාජ අසාධාරණකම් නිසා බොහෝ මිනිසුන් පීඩා විඳි අතර කාන්තා සමාජය අන්ත අසරණ තත්ත්වයකට පත්ව තිබුණි. කුඩා කාලයේ පියා යටතේ ද, තරුණ කාලයේ ස්වාමියා යටතේ ද, මහලු කාලයේ වැඩිමල් පුතු යටතේ ද වහල් ජීවිතයක් ගත කිරීමට ඇයට සිදු විය. නමුත් බුදුරදුන් පිරිමි පක්ෂය හා සම තත්ත්වයට කාන්තාව පත්කරනු ලැබීය.

භික්ෂුණියක්, උපාසිකාවක්, මවක්, බිරිඳක් වශයෙන් සමාජයේ ශ්‍රේෂ්ඨත්වයට පත්වීමට කාන්තා පක්ෂයට බෞද්ධ ඉගැන්වීම් ඉවහල් විය. පන්ති පරතරය හා සමාජ අසාධාරණත්වය නිසා පීඩා විඳි විශාල පිරිසක් බුද්ධ කාලයේ සිටි බව සඳහන් වෙයි. සුනීත, සෝපාක, රජ්ජුමාලා, භද්‍රවතිකා ඇතින්න ඉන් ප්‍රධාන වේ.

සුනීත යනු එකල සමාජයේ සිටි කැලිකසල ඉවත් කරමින් ජීවත් වූ කම්කරුවෙකි. සමාජයේ වෙනත් අය විඳින නිදහසක් ඔහුට නොවී ය. බුදුරදුන් ඔහු වෙත වැඩම කොට සමාජ සාධාරණත්වය හා ආධ්‍යාත්මික ප්‍රගතිය සලසා දුන්සේක. රජ්ජුමාලාව ද අනුන්ට බැලමෙහෙවරකම් කරමින් ජීවත්වූ අසරණ තරුණ කාන්තාවකි. ස්වාමි දියණියගේ විවිධ වූ පීඩා නිසා ජීවිතය ද ඇයට එපා විය. එවන් අවස්ථාවක සමාජයේ සැනසීමට මඟ හෙළිකළේ බුදුරදුන් ය. සෝපාක නම් කුඩා දරුවා වැඩිහිටි සමාජයෙන් දුක් පීඩා විඳිමින් සමාජයේ අතරමංව සිටි අතර බුදු රදුන් එම දරුවාට විමුක්තියේ මඟ හෙළිකළහ. බුද්ධ කාලයේ විසූ උදේනි රජු භද්‍රවතිකා ඇතින්නියගෙන් උපරිම වැඩගෙන මහලු වූ පසු නොසලකා හැරියේ ය. බුදුරදුන්ගේ මැදිහත්වීම නිසා ඇතින්නට රජුගේ සැලකිලි ලබන්නට වරම් උදාවිය. මෙලෙස සමාජ අසාධාරණත්වයට ලක් වූ පුද්ගලයන් හා සත්වයන් වෙනුවෙන් නිරතුරුව බුදුරදුන් පෙනී සිටිමින් විමුක්තියට මඟ හෙළිකළහ.

ධනය, බලය, කුලය මිනිසාගේ උස් පහත්කම් මනින මිණුම් දඬු ලෙස බ්‍රාහ්මණ සමාජය සැලකූ නමුත් බුදු දහම එය ප්‍රතික්ෂේප කොට ඇත. මිනිසකු සමාජයේ උසස් හෝ පහත් වන්නේ කුලයෙන් හෝ උපතින් නොවන බව බුදුරදුන් දේශනා කළ සේක.

**නජච්චා වසලෝ හෝති**
**නජච්ඡා හෝති බ්‍රාහ්මණෝ**
**කම්මනා වසලෝ හෝති**
**කම්මනා හෝති බ්‍රාහ්මණෝ**

වසලයකු හෝ බ්‍රාහ්මණයෙකු වන්නේ උපතින් නොව කරන ක්‍රියාව නිසා බව මෙයින් පැහැදිලි ය. අයහපත් ක්‍රියා කරන්නා කවර තරාතිරමේ අයකු වුව ද, වසලයෙක් වන බවත්, යහපත් ක්‍රියා කරන්නා සමාජයේ ශ්‍රේෂ්ඨයෙක් වන බවත් මෙහි සඳහන් වේ. එම නිසා ආයතනයක ප්‍රධානියා හෝ කම්කරුවා සමාජයක ශ්‍රේෂ්ඨ වන්නේ කවර නිසාද යන බව මෙයින් පැහැදිලි වේ.

සමාජයේ සෑම පුද්ගලයකුට ම යුතුකම් හා අයිතිවාසිකම් ඇත. බුදුරදුන් දෙසූ සිඟාලෝවාද සූත්‍රය අනුව මව්-පිය, දූ-දරු, ගුරු-සිසු, ස්වාමි-භාර්යා, ස්වාමි-සේවක, හිත-මිත්‍ර, ගිහි-පැවිදි ආදී සමාජ සංස්ථාවල යුතුකම් හා ඔවුන්ට හිමි අයිතිවාසිකම් සවිස්තරව දක්වේ. වැඩබිම්, ගොවිපළ, සේවා ස්ථානය ආදී කවර තැනක වුවද වටිනා සම්පත වන්නේ සේවකයා ය. ඔහු හෙළන දහදිය කඳුළු, ශ්‍රමය සමාජයේ හා එම ස්ථානයේ දියුණුවට හේතු වෙයි. සේවකයා වැඩපළේ දී ඉටුකරන යුතුකම් වෙනුවෙන්, ආයතන ප්‍රධානියාගෙන් ඔහුට අයිතිවාසිකම් ලැබිය යුතු ය. ප්‍රධානියා තමාගේ යුතුකම් නිසි ලෙස ඉටුකරන කල්හි, සේවකයාගෙන් සේවය ලබාගැනීමේ අයිතිවාසිකම් ඇත. සිඟාලෝවාද සූත්‍රයේදී ස්වාමි - සේවක යුතුකම් විග්‍රහ කරන විට සේවකයාගේ පක්ෂයෙන් යුතුකම් පහක් ඉටුවිය යුතු බව සඳහන් වේ.

1. උදෙන්ම අවදි වී වැඩ ආරම්භ කිරීම
2. වේලාව අවසානය දක්වා වැඩ කිරීම
3. ස්වාමියා දෙන දේවල් පමණක් ගැනීම
4. උපරිම ලෙස සේවය කිරීම
5. ස්වාමියාගේ යහගුණ ප්‍රකාශ කිරීම

යනුවෙන් එය විග්‍රහ වෙයි. එම සූත්‍රයේ ස්වාමි-සේවක සමාජය හඳුන්වා ඇත්තේ යට දිශාව ලෙසිනි. තම උපරිම ශ්‍රමය යොදා සේවය ලබා දීමට සේවකයන් / කම්කරුවන් සමත්විය යුතු ය. තම යුතුකම් නිසි ලෙස ඉටු නොකර, පාලක පක්ෂයෙන් අයිතිවාසිකම් ඉල්ලීම සාධාරණ නොවේ. තමා යටතේ හොඳින් වැඩකරන සේවකයන්ට උපරිම පහසුකම් සැළසීමටත් දුර්වල ක්‍රියාවන් පෙන්නුම් කරන සේවකයන්ට උපදේශන සේවා ලබාදී ඔවුන් නියමිත ක්‍රියාවල යෙදවීමටත් ප්‍රධානීන් සමත්විය යුතු ය. එසේ නොමැතිව සේවකයන් තලා පෙලා හිරිහැර පීඩාවන්ට ලක්කිරීම නියම පාලකයකුගේ පිළිවෙත නොවේ. පාලකයා හෙවත් ආයතනය ප්‍රධානියා තම සේවකයන් වෙනුවෙන්,


1. සේවකයාගේ දක්ෂතාවය අනුව වැඩ පැවරීම
2. ආහාර පාන හා ශ්‍රමයට සරිලන වැටුප් ලබාදීම
3. සෞඛ්‍ය පහසුකම් ලබාදීම
4. තමාට ලැබෙන විශේෂ ආහාර සේවකයන්ට ද දීම
5. සුදුසු කල නිවාඩු හා විශ්‍රාම ලබාදීම

යන යුතුකම් ඉටුකළ යුතු ය. සේවකයා උපරිම මහන්සියකට පත්කොට සේවය ලබාගෙන ඔවුන්ට අවශ්‍ය පහසුකම් නොදෙන්නේ නම්, එතැන ඇත්තේ ශ්‍රම සූරාකෑමකි. අද බොහෝ පාලකයින්ට ශ්‍රමය සූරාකන බවට චෝදනා එල්ල වී ඇත. වැඩපලේ දී තමන්ට වන අසාධාරණකම් වෙනුවෙන් වැඩ වර්ජන, උද්ඝෝෂණ, පෙළපාලි ආදී විරෝධතා දැක්වීමට සේවකයන්ට සිදුවී ඇත. ඉන් කෝපයට පත් පාලකයෝ ඔවුන්ට පහර දීම, අසාධාරණ ලෙස සේවයෙන් නෙරපීම වැනි අයුතු

සහගත ක්‍රියාවල යෙදෙති. ඉන් සේවක පක්ෂය තව තවත් අසරණ තත්ත්වයට පත්වේ. පීඩාවට පත්ව අවි ආයුධ පරිහරණයට ද ඔවුන් පෙළඹේ. මෙහි වෙනසක් දැකිය යුතු යුගය උදාවී ඇත. ආයතන ප්‍රධානීන් මෙන් ම කම්කරු පක්ෂයට ද තෘප්තියෙන් වැඩ කිරීමට අවස්ථාව සැලසෙන ආචාර ධර්ම පද්ධතියක අවශ්‍යතාවය පැන නැගී ඇත. බුදුරදුන් දෙසූ ධර්මයට අනුව තම යුතුකම් මැනවින් ඉටුකිරීමටත්, අයිතිවාසිකම් ලබාගැනීමටත්, සෑම අයෙකුම ක්‍රියා කළ යුතු ය. පාලක පක්ෂයටත් සේවක හා කම්කරු පක්ෂයටත්, මහජනතාවටත්, යුක්තිය සාධාරණය ඉටුවී සැනසීමේ මාර්ගය උදාවන්නේ එවිට ය. එම නිසා වෙසෙසින්ම මේ කෙරෙහි පාලක පක්ෂයේ අවධානය යොමුවිය යුතු ය.

# 14

# බුදු දහම හා අපේ වගකීම්



බුදු දහම යනු සමස්ථ සත්වයාගේ ම හිතසුව පිණිස හේතුවන දහමකි. බෞද්ධයා යනු තෙරුවන් සරණ ගිය පුද්ගලයා ය. තෙරුවන් හඳුනාගෙන ඒ අනුව කටයුතු කරන්නා කිසිවිටෙකත් අන් සරණ සොයා නොයයි. අද ලෝකයේ බොහෝ රටවල විවිධ ගැටුම් හටගෙන තිබේ.

එසේ ගැටුම් හට ගැනීමට ප්‍රධාන හේතුව තණ්හාවයි. තම අදහස් වලට එකඟ නොවන විට අනෙකාට වෛර කරයි. චෝදනා කරයි. ඔහු නසන්නට උත්සාහ දරයි. ඒ සඳහා අවි ආයුධ අතට ගනියි. අසාධාරණ ලෙසින් අන්සතු යමක් අත්පත් කර ගැනීමට යාම හෝ අසාධාරණ ලෙසින් ලබාගත් යම් සම්පතක් රැක ගැනීමේ දී පුද්ගලයාට විවිධ කරදර හිරිහැරයන්ට මුහුණපෑමට සිදුවෙයි. තම නිවසේ හෝ සමාජයේ හෝ සේවා ආයතනයක හෝ රටක හෝ යම් ගැටුමක්, ආරවුලක් හටගෙන ඇත්නම් එය විසඳීමට පළමුව අවි ආයුධ ගැනීම සුදුසු නොවේ. ඉවසීම, අනෙකා සමඟ සාකච්ඡා කිරීම ආදියෙන් ගැටලු ව විසඳා ගත යුතු බව බුදු දහම පෙන්වාදෙයි.

නමුත් අසාධාරණ ලෙසින් අනුන්ගේ සම්පත් උදුරා ගැනීමට යමෙකු හෝ යම් පිරිසක් ක්‍රියා කරන්නේ නම් ඊට එරෙහිව ක්‍රියා කළ යුතු ය. වත්මන් සමාජය දෙස බැලූ විට අයුක්තිය යුක්තිය බවටත් යුක්තිය අයුක්තිය බවටත් පත්ව ඇත. එනිසා සාධාරණ විසඳුමක් සෙවීම සංකීරණ ගැටලුවකි.

එදා බුදුරදුන් බුද්ධත්වයට පත් වීමේ දී රජ සැප අත්හැරීමට සිදුවිය. රජ බොජුන් වෙනුවට අනුන් දුන් පිණ්ඩපාත ආහාර වැළඳීමට සිදුවිය. අවුරුදු සයක් ම දුෂ්කර ක්‍රියා කිරීමට සිදුවිය. ලොවට සැනසීම උදා කිරීම සඳහා උතුම් සම්බුද්ධත්වය ලබා ගැනීමට උත්සාහ කරන විට එය වැළැක්වීම සඳහා විවිධ පිරිස් උත්සාහ දැරූහ. දස මාරසේනා පැමිණ ඊට බාධා කළහ. පසුව පස්මරුන් පැමිණියහ. මාර දූවරු පැමිණියහ. ඒ සියලු දෙනාම පරාජයට පත් කිරීමේ හැකියාව බෝසතුන් සතු විය. එම

නිසා අප සතු සම්පතක්, භූමියක් හෝ රටක් යම් පිරිසක් පැහැර ගැනීමට හෝ යටත් කර ගැනීමට උත්සාහ කරන විට ඔවුන් පැරදවීමේ හැකියාව අප සතු විය යුතු ය.

අනුන් නැසීමේ චේතනාවෙන් තොරව අසාධාරණයට එරෙහි වීමට සමස්ත මානව වර්ගයාටම අයිතියක් ඇත. සමාජ සංස්ථා සමූහයක් එක්ව ජන නායකයෙකු පත් කරයි. එම නායකයා අවංක නිහතමානී රටට දැයට ලැදි අයෙකු මෙන්ම එඩිතර කාර්යශූර අභීත අයෙකු ද විය යුතු ය. සතුරන් පරාජය කිරීමේ ශක්තිය තිබිය යුතු ය. රටක ආරක්ෂාව වෙසෙසින්ම සහතික වීම වැදගත් ය. යම් සතුරු කණ්ඩායමක් රටක නායකයාට අභියෝග කිරීම, රටේ ජනතාව ඝාතනය කිරීම, ආරක්ෂක නිලධාරී පිරිස් ඝාතනය කිරීම වැනි ක්‍රියාවල නියුතු වන්නේ නම් ඔවුන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමට රටේ නායකයා එඩිතර විය යුතු ය. සතුරන් පරදා රට රැක ගැනීමේ වගකීම ඇත්තේ රටේ නායකයාටය. මනුෂ්‍යත්වයේ උතුම් බව රැකෙන්නේ ඔහු සිතන පතන ආකාරය අනුවයි. යමෙකු වැරදි සිතුම් පැතුම්වලින් යුතු වූ විට ඔහු සමාජ විරෝධියෙකු බවට පත්වේ. නිවැරදිව සිතන පතන පුද්ගලයා සමාජයට ප්‍රිය අයෙකු බවට පත්වේ.

සමාජයක ජීවත්වන කවර පුද්ගලයෙකුට වුව ද ඕනෑම සිතුවිල්ලක් ඇතිකර ගත හැකි ය. නමුත් ක්‍රියා කිරීමේ දී රටේ සදාචාර නීතිරීති අනුව ක්‍රියා කිරීමට සිදුවෙයි. සමාජයක යහපැවැත්ම ඇති වන්නේ යහගුණ පිරි මිනිසුන් සිටීනම් පමණී. රටේ නායකයාගේ පටන් සාමාන්‍ය මිනිසා දක්වා මිනිස් සිත් සතන් තුළ ආචාර ධර්ම ඇති කිරීමට රටක සමාජයක නීති රීති සමුදායට වඩා ආගමකින් ඉටුවන මෙහෙය මහඟු ය. ලොවේ ඇති

ආගම් අතර අද බුදු දහම සුවිශේෂත්වයට පත්වී ඇත්තේ එහි ඇති මානව කේන්ද්‍රීය බව නිසයි. අනෙක් සියලු ආගම් දේවකේන්ද්‍රීය ආගම් ය. මිනිසාගේ මෙලොව පරලොව දියුණුව මෙන්ම සංසාර විමුක්තිය මිනිසා විසින් ම සලසා ගත යුතු ආකාරය බුදු සමය විග්‍රහ කරයි. නමුත් අද මිනිසා සිදු කරන්නේ අගතිගාමී ක්‍රියාවන් ය. ඊට හේතුව, බුදු දහම පිළිබඳ නිවැරදි අවබෝධයක් නැතිකම සහ තම ආත්මාර්ථකාමී බවයි. තම දියුණුව ගැන මිස අනුන්ගේ දියුණුව ගැන කිසි විටෙකත් කල්පනා නොකරයි. තමන්ගෙන් රටට, ජාතියට, ආගමට ඉටුවිය යුතු මෙහෙය නිසි ලෙස ඉටු නොකරයි. මෑත යුගය දෙස බලන විට එම තත්ත්වය ඉස්මතුව පෙනෙයි. තම වගකීම් අමතක කොට පටු පරමාර්ථ උදෙසා අන්‍යාගම්වාදීන්ගේ වුවමනා වෙනුවෙන් පෙනී සිටීමට ඇතැම් ලාංකීය ජනයා පෙලඹී සිටී. බෞද්ධ අබෞද්ධ සියල්ලන් සාමයට කැමති ය. නමුත් සාමය නමින් පෙනී සිටිමින් රට ජාතිය ආගම ආරක්ෂා කරන පිරිසගේ උතුම් මානසිකත්වය බිඳ දැමීමට ක්‍රියා කරන අයුරු අතිශය කනගාටුදායක ය.

බෞද්ධ හැඟුමින් යහපත් දිවි පෙවෙතක් ගත කළ ශ්‍රී ලාංකිකයන්ගේ උතුම් ආචාර ධර්ම දැක මුළු ලොවම එදා මවිත විය. ලාංකික ජනතාවගේ උතුම් පැවැතුම් නැති කිරීමට විදේශිකයෝ විවිධ උපක්‍රම භාවිත කළහ. වත්මන් යුගයේ ද එබඳු උපක්‍රමශීලී ක්‍රියා අප හමුවේ දක්නට ඇත. රට, ජාතිය, ආගම ආරක්ෂා කර ගැනීමට ක්‍රියා කරන ශ්‍රේෂ්ඨ පුද්ගලයන්ට එරෙහිව අද විවිධ බලවේග අප රටේ ක්‍රියාත්මක වෙමින් පවතී. විදේශිකයන් තම අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ලාංකික ඇතැම්

සංවිධානවලට මුදල් දී සංවිධාන ගොඩනඟා රට, දැය, සමයට සිදු කරන ව්‍යසනය පිළිබඳ අප සැමගේ අවධානය වෙසෙසින් ම යොමු විය යුතු ය.

ලක්දිවට අනුබුදු මිහිඳු මාහිමියන් වැඩම කිරීමෙන් පසු බෞද්ධ සමාජයක් බිහි විය. එම බෞද්ධ ආචාර ධර්ම හා සංස්කෘතිය අප කවර හේතුවක් නිසාවත් අමතක කළ යුතු නොවේ. අප සමාජය ධර්මයට අනුකූලවන තරමට ලංකාව ශ්‍රේෂ්ඨ වේ. ධර්මයෙන් ඈත් වීම පරිහානියට හේතු වේ. එවිට ශ්‍රේෂ්ඨ රටක් ලෙස ලෝකයා අප නොපිළිගනී. රටක් හෝ සමාජයක් ශ්‍රේෂ්ඨ වන්නේ එහි වාසය කරන්නන් තුළ ශ්‍රේෂ්ඨ ගති පැවතුම් ඇත්නම් පමණි.


වත්මන් ලාංකීය සමාජයේ සිංහල, දෙමළ, මුස්ලිම් යනුවෙන් ජන වර්ග තුනක් සිටී. ඔවුන් අතර ඇත්තේ කතා කරන භාෂාවේ සහ අදහන ආගමේ වෙනසකි. ගැටුම්කාරී තත්වයක් නැත. ඇතැම් පිරිස් මෙම භාෂාවේ වෙනස උපයෝගී කරගෙන තම පුද්ගලික හා කණ්ඩායම්හි පටු අරමුණු ඉටු කර ගැනීමට උත්සාහ දරති. ලංකාවේ පමණක් නොව ලොව සෑම රටකම මෙම තත්ත්වය දැකිය හැකිය. ඒ සඳහා ඉඩක් ලබාදිය යුතු නොවේ. ජාති භේදය ලෙස හඳුන්වා දෙමින් පටු අරමුණු ඉටු කර ගැනීමේ ක්‍රියාවන්ට රජයෙන් වැට බැඳිය යුතු ය. එම උත්සාහයන් පරාජය කළ යුතු ය.

බෞද්ධ හා විද්‍යාත්මක මතය අනුව මිනිසා පරිසරය හා සත්වයන් නිරතුරුව වෙනසකට පත්වේ. සිතිවිලි වෙනස් වේ. අව්, වැසි, උදේ, දවල්, රෑ ඇති වෙයි. සත්වයා සහ ගහ කොළ හටගනී. පවතියි. නැතිවී යයි. මේ තත්ත්වය කිසිවෙකුට වෙනස් කළ නොහැකි ය.

මේ යථාර්ථය හඳුනාගෙන අප ජීවත් විය යුතු ය. තමන් ජීවත් වන කාලය තුළ තමන් උපන් රටට, ජාතියට, ආගමට අමතක නොවන සුවිශාල සේවයක් කළ යුතු ය. එසේ නොවන්නේ නම් එම ජීවිතයෙන් කිසිඳු ප්‍රතිඵලයක් නැත. එනිසා සෑම මිනිසෙකුම අභිමානයෙන් හා ශ්‍රේෂ්ඨත්වයෙන් යුතුව ජීවත්විය යුතු ය. සමාජයෙන් අවමානයට පත්වී ජීවත් වීමේ කිසිදු ප්‍රතිඵලයක් නැත. අවමානයට පත් නොවී විශිෂ්ට පිරිමියෙකු හෝ ගැහැනියක ලෙස ජීවත් වීමට අප වගබලා ගත යුතු ය. ඒ සඳහා නිවැරදි මාර්ගය බුදු දහම පෙන්වා දී ඇත. කවර තරාතිරමේ අයෙකුට වුව ද තම ජීවිතය ශ්‍රේෂ්ඨ බවට පත්කර ගැනීමට බුදු දහම පෙන්වා දී ඇති ඒ මාර්ගය ධර්මය ඇසීම - කියවීම වැනි ක්‍රියාවන් තුළින් සලසාගත හැකි ය. බුදු දහම තවමත් නොනැසී පවතින නිසා ජීවිතයේ ආලෝකය ද නොනිවී ආරක්ෂා කරගත හැකි බව තේරුම් ගෙන ඒ ආලෝකය ළඟා කර ගැනීමට ඔබත් උත්සාහවත් වන්න.

# 15

# බුදු දහම හා ධනය



බුදු දහම ධනය ඉපැයීම, ධනය පරිහරණය හා එය ආරක්ෂා කර ගැනීම පිළිබඳ සූත්‍ර රැසකින් කරුණු ඉදිරිපත් කොට ඇත. බුදු දහමට අනුව ධනය ඉපයීම හා රැස්කර

ගැනීම සුදුසු ද? නැද්ද? යන ප්‍රශ්නය බොහෝ දෙනෙක් විමසති. එහිදී බුදු දහම ධනය ඉපයීමටත්, රැස්කර ගැනීමටත්, වියදම් කිරීමටත් සාධාරණ හා ධාර්මික බවින් එය කළ යුතු බව සඳහන් වේ. ධාර්මිකව ධනය උපයන්නේ කෙසේ ද ඒ සඳහා බුදු දහම "**උට්ඨාන විරියාධිගතේහි බාහාබල පරිචිතේහි සේදා වක්ඛිත්තේහි ධම්මිකේහි ධම්ම ලද්ධේහි**" යනුවෙන් දක්වා ඇත. ඉන් කියවෙන්නේ දෑත දෙපය වෙහෙසවා දහඩිය වගුරුවා උත්සාහයෙන් වීර්යයෙන් යුක්තව ධාර්මිකව ධනය ඉපයිය යුතු බවයි. අවි බලයෙන් හෝ අනුන්ට හිංසා, පීඩා කිරීමෙන් කිසි විටෙකත් ධනය නොඉපයිය යුතු බව දක්වේ. ධාර්මික හා සාධාරණ බව නිරතුරුව අගය කළ යුතු ය.

බුදු දහමට අනුව ධන සම්පත් උපයන ක්‍රම රැසක් ඇත. රාජ්‍ය සේවය, කාෂිකර්මාන්තය, වෙළඳාම, සත්ත්ව පාලනය, විවිධ කර්මාන්ත ආදිය ඒ අතර වේ. මෙලොව ජීවත්වන පුද්ගලයාට ධනය, මිල මුදල්, ගෙවල් දොරවල්, සැප පහසුකම් අවශ්‍යය. එම නිසා ඒවා නිවැරදි ලෙසින් උපයා සපයා ගත යුතු ය. යමෙකු අනුන්ට හිංසා පීඩා කිරීම සොරකම් කිරීම, බොරුකීම ආදී ක්‍රියාවන්ගෙන් මුදල් හා ධනය උපයා ගනියි ද එය නිවැරදි ධාර්මික ධනයක් නොවේ. එලෙස ධනය උපයා ලබන දියුණුව දිගු කලක් නොපැවතී පරිහානිය කරා ගමන් කරවයි.

බුද්‍ද දහම නිවැරදි ජීවන ක්‍රමයක් ලෙස රාජ්‍ය සේවය අනුමත කර ඇත. නමුත් වර්තමානයේ ඇතැමුන් රාජ්‍ය සේවය කරන මුවාවෙන් විවිධ අකටයුතුකම්වල යෙදෙයි. ඇතැම් විට රාජ්‍ය සේවය නිසිලෙස ඉටු නොකර එය පැහැර හැර වැටුප් ලබා ගනියි. එය වංචනික ක්‍රියාවකි. රාජ්‍ය සේවකයින් තම කාලය, ශ්‍රමය, හැකියාව යොදා

රට දියුණු කිරීමේ උදාර අරමුණින් ක්‍රියා කොට ඊට සුදුසු ජීවත් වීමට හැකි වැටුපක් ලබාගත යුතු ය. එසේ නොවී තමාගෙන් සේවය ලබා ගැනීමට එන පුද්ගලයන් බොරු කියා රැවටීම, ඔවුන්ගෙන් අල්ලස් ලබා ගැනීම කිසිවිටෙකත් සිදු නොකළ යුතු ය.

කෘෂි කර්මාන්තය ද ධනය උප්පයා සතුටින් ජීවත් විය හැකි හොඳ ජීවනෝපායකි. වී ගොවිතැන, හේන් ගොවිතැන හා විවිධ වගා ක්‍රම තුළින් මිනිසාට දියුණු විය හැකි ය. නමුත් එහිදී ඔහු අනුන්ට හිංසාවන ලෙසින් අනුන්ගේ දියුණුවට හා චරිත ඝාතනයට හේතුවන අයුරින් ක්‍රියා කරන්නේ නම් එය නිවැරදි කෘෂිකර්මාන්තයක් නොවේ. එකමුතුකම හා සමගිය තුළින් කෘෂි වගාවන්ගෙන් ඵලදාව ලබා ගැනීමට උත්සාහවත් විය යුතුය. තම භෝග වගා සඳහා ඇතිවන කෘමි උවදුරු දුරු කිරීමේ දී සතුන්ට හිංසා කරන චේතනාවෙන් තොරව කටයුතු කළ යුතු ය. ගොවිතැන් ආදී කටයුතු කිරීමේ දී යොදාගනු ලබන ගව මහීසාදීන්ට හිංසා කිරීමෙන් ද වැළකීම ඉතා වැදගත් වේ.

ධන සම්පත් උපයාගෙන දැහැමින් ජීවත් වන මාර්ගයක් ලෙස වෙළෙඳාම ද හැඳින්වේ. වෙළෙඳාම් කිරීමේ දී ධාර්මික බව තිබිය යුතු ය. වෙළඳාම් කිරීමේ දී වැරදි පිළිවෙත්වලින් වැළකිය යුතු ම ය. තුලා කූට (හොර තරාදි) මාන කූට (හොර මිනුම්) කංස කූට (හොර පඩි) උක්කෝටික (අල්ලස් ගැනීම) විපරාමෝස (අනුන්ට හිංසා කිරීම) වංචන (රැවටීම) ගුම්බ විපරාමෝස (මං පැහැරීම) ආදී ක්‍රියා වලින් වැළකිය යුතු ම ය. එමෙන්ම බුදු දහමේ දක්වා ඇති නොකළ යුතු වෙළෙඳාම් ලෙස ගැනෙන

1. මස් වෙළෙඳාම
2. සත්ත්ව වෙළෙඳාම
3. ආයුධ වෙළෙඳාම
4. මත්පැන් වෙළෙඳාම
5. වසවිස වෙළෙඳාම

යන වෙළෙඳාම් කිසි විටෙකත් නොකළ යුතු ය. ඇතැම්හු වැඩි ආර්ථික වාසි ලබා ගැනීමේ අරමුණින් මෙවන් අධාර්මික වෙළෙඳාමෙහි නියුතු වෙති. ඒ තුළින් දියුණුවක් ලද නොහැකි ය. එබඳු ක්‍රියාමාර්ග මගින් යමෙකු දියුණු වුවත් ඉක්මනින් පරිහානියට පත් වීමට සිදු වෙයි.

ධාර්මික ධනය උපයන මාර්ගයක් ලෙස සත්ත්ව පාලනය හැඳින් වෙයි. සත්ත්ව ඝාතනය බුදුදහම සපුරා ප්‍රතික්ෂේප කරයි. සත්වයන්ට අවශ්‍ය ආහාරපාන කලට වේලාවට ලබාදී කිරි, ගොම ආදිය ලබාගෙන ධනය රැස්කර ගත හැකිය. නමුත් සතුන් ඇතිකොට ඔවුන් මරා මස් විකිණීම, සතුන්ගේ බිත්තර විකිණීම ධාර්මික ජීවන ප්‍රතිපදාව නොවේ. එම නිසා සත්වයන් කෙරෙහි කරුණාව හා මෛත්‍රිය නිරතුරුවම ඇතිකර ගෙන ඔවුන් ආරක්ෂා කළ යුතු ය. හිංසා පීඩාවන කිසිඳු ක්‍රියාවක නියුතු වීම සුදුසු නොවේ.

යහපත් ජීවනෝපායනයේ දී විවිධ කර්මාන්ත කරමින් ජීවත් වීම ද ඉතා වැදගත් ය. සෑම අයෙකුටම රාජ්‍ය සේවය, කෘෂිකර්මය, වෙළෙඳාම ආදිය කිරීමට නොහැකි ය. එම නිසා තම ශක්තිය, හැකියාව සහ බුද්ධිය උපයෝගී කරගෙන යම් කර්මාන්තයක් කරගෙන ධනය හා මිල මුදල් උපයාගත හැකි ය. එය ස්වයං රැකියාවක් ද වේ. එය දියුණු කොට සෙසු අයට ද රැකියා සපයන තත්ත්වයට පත්කර ගත හැකි ය. නමුත් පටු අරමුණු ඇතිව අනුන්

රවටන යුක්ති සහගත නොවන ක්‍රියාවල කිසි විටෙකත් නියුතු නොවිය යුතු ය.

තමන් ධනය උපයා ගැනීමේ දී තමන්ටත් අනුන්ටත් හානි නොවන අයුරින් ක්‍රියා කළ යුතු ය. අනුන්ගේ ක්‍රියාවන්ට හානි කරමින් තමාගේ දියුණුව ගැන පමණක් සිතා කටයුතු කිරීම ධාර්මිකත්වය නොවේ. ධනය උපයා ගැනීම, එය ආරක්ෂා කර ගැනීම සහ එය වියපැහැදම් කරන ක්‍රමය ද බුදු දහමේ විග්‍රහ වෙයි. බුදුරදුන් ව්‍යග්ගපජ්ජ සූත්‍රයෙන් දේශනා කොට ඇති සමජීවිකතා සංකල්පය මෙහිදී වෙසෙසින් වැදගත් වෙයි. ධනය උපයා ගැනීමේ දී මෙන්ම වැය කිරීමේ දී ද ඉතා බුද්ධිමත් විය යුතු ය. කල්පනාකාරී විය යුතු ය. තමන් ලද ධනයෙන්,

1. තමන් පෝෂණය වීම
2. මව්පියන් පෝෂණය කිරීම
3. අඹු දරුවන් පෝෂණය කිරීම
4. ඥාතීන් පෝෂණය කිරීම
5. ආගමික කටයුතු ඉටු කිරීම

යන යුතුකම් ඉටු කිරීම කෙරෙහි තමාගේ අවධානය යොමු කොට ඒවා ඉටු කළ යුතු ය. එමෙන්ම ලැබූ ධනය පරිහරණය කරන ක්‍රම පහක් පංචබලි නමින් බුදු දහමේ ඉගැන්වේ. ඒ අනුව,

1. අතිථි බලි (ආගන්තුක සත්කාරය)
2. ඥාති බලි (නෑයන්ට සංග්‍රහ කිරීම)
3. පුබ්බපේතබලි (මිය ගිය නෑයන්ට පිං දීමට කරන පිංකම්)
4. රාජබලි (රජයට අයබදු ගෙවීම)
5. දේවතාබලි (දෙවියන්ට පිංදීම)

යන යුතුකම් ඉටු කිරීම සත් පුරුෂයන් විසින් තම ධනයෙන් සිදුකළ යුතු ය. තම ධනය කිසි ලෙසකින් වත් අනවශ්‍ය පුහු ආටෝප සාටෝප ක්‍රියා සඳහා නොයෙදවිය යුතු ය.

දීඝ නිකායේ සිඟාලෝවාද සූත්‍රය අනුව ඉපයූ ධනය විය පැහැදම් කළ යුතු ආකාරය විග්‍රහ වෙයි.

**ඒකේන භෝගේ භුඤ්ජෙය්‍ය - ද්වීහි කම්මං පයෝජයේ**

**චතුත්ථංච නිධාපෙය්‍ය - ආපදාසු භවිස්සති**

මින් පැහැදිලි වන්නේ ඉපයූ ධනය කොටස් හතරකට බෙදා එක් කොටසක් පරිභෝජනය සඳහා ද, කොටස් දෙකක් තමන් කරන කර්මාන්තවල දියුණුව සඳහා ද, සතරවෙනි කොටස ආපදාවක් වූ විට ගැනීමට ඉතිරි කිරීම ද කළ යුතු බවයි. ලැබූ සියලු ධනය වියදම් කිරීම ද, ලැබූ සියලු ධනය මසුරු කමින් ඉතිරි කිරීම ද නොකළ යුතු බව බුදු දහමේ සඳහන් වේ. ජලාශයකට ජලය ඇතුළු වන දොරටු වැසීමෙන් සිදුවන්නේ එහි ජලය නැති වීමයි. ඒ අනුව උත්සාහවත් නොවී අලසව සිටීමෙන් තමන්ට ධනය නොලැබී නිර්ධනයෙක් වෙයි. උත්සාහයෙන් තොරවීම දිළිඳුකමට මගයි. ජලය ඇතුළු වන දොරටු වසා පිටවන දොරටු හැරීමෙන් සිදුවන්නේ ජලය සිඳීයාමයි. එමෙන්ම ජලාශයට ජලය ඇතුළු වන දොරටු හැර පිටවන දොරටු වසා තැබීමෙන් ජලය පිරී ඉතිරී යයි. ඇතුළු වන දොරටු මෙන්ම පිටවන දොරටු ද සමසේ හැර තැබීමෙන් නිසි ලෙස ජල කළමනාකරණය සිදුවෙයි. ධනය ඉපයීම හා වියදම් කිරීමේ ක්‍රමය ද එබඳු ය.

අදින්න පුබ්බක, බිළාල පාදක, මසුරු සිටාණන් ආදී පුද්ගලයන් ලෝභකමින් වස්තුව ඉපයූහ. නමුත් ඉන් කිසිඳු යුතුකමක් ඉටු කළේ නැත. එනිසාම සමාජයෙන් නින්දාව ලබා පරිහානියට ම පත්විය. එනිසා ධන සම්පත්වලින් අප උපරිම ප්‍රතිඵල ලබා ගත යුතු ය. තමා වෙහෙස මහන්සි වී ධනය හා මිල මුදල් සොයා ගෙවල් දොරවල් තැනීම, වතුපිටි, භවබෝග සම්පත් ලබා ගැනීම යාන වාහන ගැනීම, රසවත් ආහාරපාන පරිභෝජනය කිරීම ඇඳුම් පැලඳුම්වලින් අලංකාර වීම ආදිය බුදු දහම ප්‍රතික්ෂේප කොට නැත. ඒවා ජීවිතයට අවශ්‍යය. එමෙන් ම මිනිස් දිවියේ දී ඒවා වඩාත් වැදගත් වේ. නමුත් අධික තණ්හාවෙන්, ඇල්මෙන් යුතුව ඒ පසුපස හඹා නොයා යුතු ය.

මෙලොව උපදින කිසිඳු පුද්ගලයකු උපයන භෞතික ධන සම්පත් පරලොවට ගෙන නොයයි. ඒවා අවශ්‍ය හා වැදගත් වන්නේ මොලොව දී පමණි. එනිසා ධනය පිළිබඳ අධික ආශාවෙන් ක්‍රියා නොකළ යුතු ය. මෙලොව ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා පමණක් ධනය අවශ්‍ය බවත් පරලොව සැනසුම ලැබිය හැක්කේ එම ධනය වියදම් කොට සිදු කරන කුසල් දහම්වලින් පමණක් බව ද සිහිකල්පනා කළ යුතු ය.

# 16

# බුදු දහම හා පුද්ගල පෞරුෂත්වය



සමාජයේ අභිමානවත් ජීවිතයක් ගත කිරීම සඳහා තම පෞරුෂ වර්ධනය අතිශයින් ම වැදගත් ය. පෞරුෂ වර්ධනය පිළිබඳ මෑත යුගයේ විවිධ අර්ථකථන ඉදිරිපත් වී ඇත. බුදු දහමට අනුව "සිතේ ක්‍රියාකාරිත්වය හා බැඳුණු නිවැරදි කායික හා වාචසික හැඩගැස්ම"

පෞරුෂය ලෙස අර්ථකථනය කළ හැකි ය. අවංක වූ හැඟීමෙන් යුතු ව සිදු කරන සද්ක්‍රියා තුළින් පුද්ගලයෙකු සමාජයේ පිළිගැනීමට ලක්වෙයි. එම පුද්ගලයාගේ මානසික මට්ටම කෙබඳුදැයි වෙනත් කෙනෙකුට තීරණය කළ නොහැකි ය. ඒ නිසා පුද්ගල පෞරුෂත්වය මැනීම අපහසු කාර්යයකි. පුද්ගලයෙකු සමාජයේ ක්‍රියාශීලීව කටයුතු කිරීමේ දී විවිධ බාධක හා අභියෝගවලට මුහුණ දෙයි. එහිදී ඔහු තම ජීවිතයට රැස්කර ගන්නා දැනුම, ආකල්ප හා කුසලතා පුද්ගල පෞරුෂ වර්ධනය කෙරෙහි බලපායි.

පුද්ගලයෙකු සමාජයේ හොඳ පෞරුෂයක් ගොඩනගා ගැනීමේ දී ආත්ම විශ්වාසය පළමුවෙන්ම ඇතිකර ගත යුතු ය. සෙසු පුද්ගලයන් හා ක්‍රියා කිරීමේ දී තමා පිළිබඳ අධි තක්සේරුවකට නොපැමිණිය යුතු ය. තමා සෙසු අය හා සමාන ලෙස ද නොසිතිය යුතුය. එමෙන් ම අනුන්ට වඩා තමන් පහත් යැයි ද නොසිතිය යුතුය. තමන් අනුන් හා සැසඳීමට යොමු වීමෙන් තම පෞරුෂයට හානි වේ. ඒ නිසා තමා නිරතුරුව අනුන් කෙරෙහි මෛත්‍රියෙන්, කරුණාවෙන් ක්‍රියා කළ යුතු ය. අනුන්ගේ චරිත හා තම චරිතය සසඳා බැලීමට උත්සාහ කිරීම තුළින් සිදු වන්නේ, අනුන් කෙරෙහි වෛරය, ක්‍රෝධය, ඊර්ෂ්‍යාව වැනි දුර්ගුණ ඇති වීමයි. එම නිසා සෙසු පුද්ගලයන් සමඟ ප්‍රියතාවයෙන් කතාබහ කිරීම සිනහසීම ඔවුන්ගේ විපතේදී පිහිට වීම ආදී ක්‍රියාවල යෙදිය යුතු ය. අනුන් හා තමන් සසඳා බැලීම මුළාවට හේතුවකි එනිසා හැකිතරම් පවිත්‍ර සිතිවිලි හා යහපත් ක්‍රියාකලාප පුරුදු පුහුණු කරගත යුතුය. යම් පුද්ගලයෙකු සමාජයේ කැපී පෙනීමට වෙහෙසක් ගන්නේ ද එය නිවැරදි පෞරුෂ ලක්ෂණයක් නොවේ. අවංකව තම

ආකල්ප අනුව ක්‍රියා කිරීමෙන් සමාජයේ සැමගේ ප්‍රියතාවයට පත්වෙයි. යමෙකු ඇති කරගනු ලබන ප්‍රියශීලී බව තවත් විටෙක දී අප්‍රිය බවක් ඇති කරන්නේ නම් ඒ තුළ අවංක බවක් විද්‍යාමාන නොවේ.

ඇතැමුන් පාරම්පරික ගති පැවතුම් නිසාම සමාජයේ පිළිගැනීමට ලක්වෙයි. තවත් පිරිසකට එම තත්ත්වය නොමැත. ඔවුන් ඒ සඳහා අවබෝධයෙන් ක්‍රියා කොට අඩු ලුහුඬු තැන් සකස් කරගත යුතු ය. කුඩා කල පටන් අධ්‍යාපනය, හොඳ පුරුදු, හැකියා, දක්ෂතා, යහපත් ආකල්ප ඇති කරගත යුතුය. අලස පුද්ගලයාට කිසි විටෙකත් හොඳ පෞරුෂයක් ගොඩනගා ගත නොහැකි ය. හොඳ දෙයට කැමති වීමත් නරක දෙයට අවංකව, අකමැති වීමත් තිබිය යුතු ය. බුදු දහමට අනුව පංච දුෂ්චරිතයට යොමු වූ පුද්ගලයාට යහ පැවැත්මක් නැත. ඇතැමුන් ප්‍රසිද්ධියේ පංච දුෂ්චරිතය පිළිකුල් කරයි. අප්‍රසිද්ධියේ සැඟ වී දුෂ්චරිත ක්‍රියා සිදු කරයි. එබඳු තැනැත්තාට සැබෑ ලෙසම හොඳ පෞරුෂයක් පවත්වා ගත නොහැකි ය.

සමාජය පිළිබඳ නිසි අවබෝධයක් නොමැති පුද්ගලයාට පෞරුෂයක් ඇති කරගත නොහැකි ය. එනිසා සමාජය පිළිබඳ නිවැරදි අවබෝධය ඉතා වැදගත් වෙයි. බුදුරදුන් ගේ චරිතය පුරා සැබෑ පෞරුෂ ගති ලක්ෂණ දක්වෙන අතර උන් වහන්සේ විසින් දේශිත සෑම සූත්‍රයකින්ම පෞරුෂ වර්ධනය සඳහා මග පෙන්වා ඇත.

බුදු දහමට අනුව නිවැරදි පුද්ගලයෙකු වීම සඳහා බලපාන ප්‍රධාන සාධක දෙකකි. එනම් ආරය හා පරිසරයයි.

ආරය යනු, පරම්පරාවෙන් උරුම වන දෙයයි. එමෙන් ම ඔහු පෙර ආත්මවල කළ කුසල් හා අකුසල කර්ම ද ආරය තුළින් මොලොවට ගෙන එයි. පෙර ආත්මයේ සිදු කළ කුසල් සහ යහපත් ගති සිරිත් මෙලොව දී ඉස්මතුවීම හොඳ පෞරුෂයකට හේතු වෙයි. පරිසර සාධක ද පුද්ගලයෙකුගේ පෞරුෂය ඔපවත් කරයි. දෙමව්පියන්, ගුරුවරුන්, වැඩිහිටියන්, යහළුවන් ඇසුර තුළින් ලබන දැනුම හා සිරිත් විරිත් පුහුණුව ඒ සඳහා ප්‍රබල බලපෑමක් කරයි. තම අභිමත හා හැකියා යහපත් සමාජය විසින් පිළිගන්නා තත්ත්වයට පත්ව තිබීම විශේෂ ය. සමාජය පිළිකුල් කරනු ලබන ගති සිරිත් ඇත්නාට නිවැරදි පැවැත්මක් ඇතිකර ගත නොහැකි ය. එනිසා දූරදර්ශීව සිතිය යුතු ය. අන්‍යයන්ගේ අදහස් උදහස් දැන ගැනීමේ හැකියාව මෙන්ම ඊට ගරු කිරීමට ද හැකියාව තිබිය යුතු ය.

ස්වීයත්වය හෙවත් ස්වකීය පෞරුෂය වර්ධනය සඳහා ආත්මාර්ථයෙන් මිදී පරාර්ථකාමී ක්‍රියා අනුගමනය ඉතා වැදගත් ය. අධිෂ්ඨානශීලී බව මෙන් ම නොපසුබට උත්සාහය ද තිබිය යුතු ය. දූරදර්ශීව ගනු ලබන තීරණ කිසි විටෙකත් වෙනස් කළ යුතු නොවේ. පටු වාද භේදවලින් ඉවත්ව අපක්ෂපාතීව, අවංකව, උනන්දුවෙන්, උත්සාහයෙන් ප්‍රියශීලී ක්‍රියාවෙන් යුතු ජීවිතයකට හුරු පුරුදු වීමෙන් තමා සමාජයේ නිරායාසයෙන් ම පිළිගැනීමට ලක්වන පුද්ගලයෙකු බවට පත්වෙයි. කිසිඳු දෙයකට කම්පා නොවිය යුතු අතර උපේක්ෂාවෙන්, ඉවසීමෙන් යුතුව ක්‍රියා කිරීමට නිරතුරුවම වගබලාගත යුතු ය. බොහෝ පුද්ගලයන් ප්‍රසිද්ධියේ හොඳ ගති පැවතුම් ද අප්‍රසිද්ධියේ දුෂ්චරිත ක්‍රියාවල ද නියුතු වෙයි. එබඳු පුද්ගලයෙකුට හොඳ සමාජ තත්ත්වයක් ඇති කරගෙන

පවත්වාගෙන යාම අපහසු ය. සෑම දෙයක් පිළිබඳවම උපේක්ෂාව හා ඉවසීමෙන් කටයුතු කිරීම විශිෂ්ඨ පෞරුෂයකට මඟ හෙළි කරයි.


බුදු සිරිත දෙස අවධානය යොමු කරන විට සැබෑ පෞරුෂය යනු කුමක් ද යන්න මැනවින් පැහැදිලි වෙයි. රාජ කුමාරයෙකු වූ සිදුහත් කුමරු කම්සුවයට වඩා උත්සුක වූයේ ලොවේ යථාර්ථය තේරුම් ගැනීමටයි. සතර පෙර නිමිති සහ නළඟනන්ගේ විප්‍රකාර බෝසතුන්ගේ පෞරුෂ සංවර්ධනය සඳහා මනා අනුබලයක් විය. සියලු රාජ සම්පත් හැර පැවිදිව අනුන් දුන් ආහාරයෙන් යැපුණේය. වසර හයක් දුෂ්කර ක්‍රියා කොට ජීවිතයේ යථාර්ථය වටහා ගනු ලැබීය. බෝසතාණන්ගේ චතුරංග සමන්තාගත වීර්ය පුදුම සහගතය. තම සම්, මස්, ලේ, නහර නැතිවී ගියත් බුදු වී මිස නොනැගිටිමියි සිතා බෝ මුල හිඳ බවුන් වැඩීය. අධිෂ්ඨානශීලී බව මෙන්ම නොපසුබට වීර්ය තම අරමුණ සඵල කර ගැනීම සඳහා අතිශය හේතුවන බව ඉන් පැහැදිලි වේ. එමෙන්ම දස මරසෙන් පරාජය කළ ආකාරය, යව ආහාරයට ගනිමින් තෙමසක් දොළොස්වන වස් කාලය ගත කිරීම, චිංචිමානවිකාව, මාගන්ධිය වැනි කාන්තාවන් ගේ ඇනුම් බැණුම් ඉවසා සිටීම, දේවදත්තගේ රුදුරු ක්‍රියා ඉවසීම, අංගුලිමාල, සුනීත, සෝපාක, පුණ්ණා දාසිය, රජ්ජුමාලා සුමගට යොමු කිරීම ආදී සිද්ධි දෙස බලන විට මනා පෞරුෂයෙන් යුතු පුද්ගලයාගේ ක්‍රියාහි අසිරිමත් හා ශ්‍රේෂ්ඨ බව මැනවින් පැහැදිලි වේ. සමාජයේ අනාථ, අසරණ, පිළිකුල් ලෙසින් ක්‍රියා කළ දහස් සංඛ්‍යාත ජනතාවට සරණ වූවා පමණක් නොව ඔවුන්ගේ ජීවිතවලට නව පෞරුෂයක් ගෙන දීමට ද බුද්ධ දේශනා බෙහෙවින් ඉවහල් විය.

තම ජීවිතයේ අඩුලුහුඬුකම් තමාගේ නුවණින් ම දැකීමට ඉඩ සැලසූ බුදුරදුන් යථාර්ථවත් ජීවිතයක් ගොඩ නගා ගැනීමට මඟ හෙළි කළහ. සමාජයෙන් ආ ගැරහුම්, නින්දා, අපහාස, විවේචන සියල්ලම ඉවසූ අතර කීර්ති ප්‍රශංසා කෙරෙහිද ඇල්මක් නොදැක්වූහ. සමාජයෙන් කෙතරම් නින්දා අපහාස තමාවෙත එල්ල වුව ද තමන් වැරදි වැඩ සිදුකර නොමැති නම් එම නින්දා අපහාස හමායන සුළඟක් මෙන් ද, පයට පෑගෙන දූවිල්ලක් සේද සිතා ක්‍රියා කළ යුතු බව බුදු දහම උගන්වයි. ස්වයං ඥාණයෙන් අවබෝධ කරගත් උතුම් සම්බුද්ධත්වය කිසිවිටෙකත් අවමානයට ලක් නොවීය. අවංක, නිහතමානී, සංවර, පිරිසිදු, අධිෂ්ඨානශීලී පෞරුෂ ලක්‍ෂණවලින් යුතු පුද්ගලයා සමාජයෙන් කොන්කිරීම හෝ ඊට බාධා කිරීම් ප්‍රතිඵල රහිත ය. ශ්‍රේෂ්ඨ චරිත ලක්‍ෂණවලින් හෙබියා වූ තැනැත්තාට කෙතරම් නින්දා අපහාස, තර්ජන, ගර්ජන කළද ඒවායෙහි විපාක දුෂ්චරිතයාටම විඳීමට සිදුවේ.

පුද්ගල පෞරුෂය ගොඩනගා ගැනීමට කාලාම, වාසෙට්ඨ, මධුපිණ්ඩික, සිඟාලෝවාද, සතිපට්ඨාන, වසල, පරාභව, මංගල ආදී සූත්‍ර තුළින් මනා අනුබලයක් ලැබෙයි. එම නිසා නෙළුම් මලක අසිරිය බඳු බුද්ධ චරිතය ආදර්ශයට ගැනීමත්, බෞද්ධ දර්ශනයේ සඳහන් ධර්ම කරුණු වටහාගෙන සමාජයෙන් ගැරහුම් නොලබන, ශ්‍රේෂ්ඨ, චරිතවත්, බුද්ධිමත්, ප්‍රියශීලී සැමගේ ඇගයුමට, ප්‍රශංසාවට ලක්වන ජීවිතයක් ගොඩනගා ගැනීමට උත්සුක විය යුතු ය. බුදු දහම පෙන්වන මනා පෞරුෂත්වය වන්නේ ද එයයි.

# 17

# බුදු දහම හා කාන්තා සමාජය



බුදු දහම සමාජයේ සෑම පුද්ගලයෙකුට ම සම අයිතීන් ලබාදී ඇති දහමකි. බුදුරදුන් පහළ වූ සමයේ කාන්තා පක්ෂය සමාජයේ පහත් තත්ත්වයට පත්ව තිබුණි. බ්‍රාහ්මණ දහම අනුව කාන්තාව යනු අනුවණ, පහත්, අපිරිසිදු, චපල, දුර්වල, නින්දිත, අදූරදර්ශී, විශ්වාස

නොකළ යුතු තැනැත්තියකි. එම නිසා ඇය සමාජයේ ආගමික, අධ්‍යාපනික, ආර්ථික, දේශපාලනික ආදී කිසිඳු කටයුත්තකට සම්බන්ධ කර ගත නොහැකි බව බ්‍රාහ්මණ ඉගැන්වීම්වල සඳහන් වේ. ඇඟිලි දෙකේ නුවණැති, වගකීම් පැවරිය නොහැකි, පාපකාරී ඇය පුරුෂයන්ගේ බැල මෙහෙවරට මිස අනෙක් කිසිඳු කටයුත්තකට නුසුදුසු බව දක්වේ. එම නිසා එකල කාන්තාවට සිදු වූයේ මුළු ජීවිත කාලය පුරා පුරුෂාධිපත්‍යයට යටත් වී අසරණ ජීවිතයක් ගත කිරීමටයි.

බ්‍රාහ්මණ ඉගැන්වීම් අනුව කාන්තාව කුඩා කාලයේ පියා යටතේ ද, තරුණ කාලයේ සැමියා යටතේ ද, මහලු කාලයේ වැඩිමල් පුතු යටතේ ද ජීවත් විය යුතුය. මේ නිසා ඇයට කිසි විටෙක නිදහසක් නොවී ය. කාන්තාවක ගේ උපත පවා අවාසනාවන්ත අසුබ ලක්ෂණයක් බව ඉගැන්වී ය. එකල පැවති යාගහෝම පුද පූජා ආදියට කිසි විටෙකත් සම්බන්ධ කර නොගත් තේය. සැමියා සතුටු කරමින්, ඔහුට කීකරුව, ඔහු කියන ආකාරය අනුව ජීවත් විය යුතු විය. ගුටිබැට වද හිංසා සියල්ල ඉවසා දරා සිටිය යුතු විය. සෑම ගැහැනු දරුවෙකුම වැඩිවියට පත්වූ පසු අනිවාර්යයෙන් ම විවාහ විය යුතු විය. පුරුෂයන්ට ඕනෑ තරම් කාන්තාවන් විවාහ කරගත හැකි විය. සැමියා අකාලයේ මිය ගියහොත් එම දර සෑයට පැන දිවි නසා ගැනීම භාර්යාව විසින් කළයුතු විය. එසේ නොකළ හොත් වැන්දඹුවක ලෙස ජීවත් විය යුතු විය. කාන්තාව යනු අවිශ්වාසනීය තැනැත්තියකි. ඒ බව බමුණන් ප්‍රකාශ කළේ අට්ටික්කා ගස්වල මල් පිපුණත්, සුදු කපුටන් සිටින බව කීවත්, මාළුන්ට දෙපා ඇති බව කීවත් එය විශ්වාස කළ හැකි නමුත්,

කාන්තාවගේ වචන විශ්වාස නොකළ යුතු බවයි. කාන්තාව කියන වචනය විනාශයට මිස යහපතට හේතු නොවන බව ද ඉගැන්වී ය. කාන්තාවක් විවාහ කර දීමේ දී විශාල ලෙස දෑවැදි දීමට සිදු විය. පියෙකු මිය ගිය පසු ඔහු සුගතිගාමී වීමට කළයුතු "පිතෘ යඥ" නම් යාගය පිරිමි දරුවෙකුම කළ යුතු වූ අතර ඒ නිසා කාන්තාවක් පවුලේ ඉපදීම ගැන මව්පියෝ බිය වූහ. තවද කාන්තාවගේ මුහුණ පියකරු බවත් පියුමක් බඳු බවත්, වචන ඉතා මිහිරි බවත්, සඳුන් වැනි බවත් දිව අග මී බිඳු සේ බවත් පැවසූ නමුත් ඇගේ හදවතේ ඇත්තේ හලාහල විෂ බවත් සඳහන් වේ. මෙලෙස මුළු මහත් කාන්තා සමාජයම එදා වහල්, අසරණ, පීඩිත, පහත් තත්වයට පත්ව තිබූ බව මැනවින් පැහැදිලි වේ.

භාරතීය මෙන්ම ලාංකීය කාන්තා පක්ෂයට නිදහස්, නිවහල්, සැනසුම්දායී, උත්තරීතර තත්ත්වයක් හිමි වූයේ බුදු දහම නිසයි. බුදු රජාණන්වහන්සේ බ්‍රාහ්මණ ඉගැන්වීම් දැඩි ලෙස විවේචනයට ලක්කළ අතර පිරිමි පක්ෂයට සමාන සමාජ තත්ත්වයක් කාන්තාවට හිමිකර දුන්හ. බ්‍රාහ්මණ සමාජය සමාජයෙන් බැහැර කළ කාන්තාව බුදු දහමින් සමාජයේ ඉහළ තත්ත්වයට පත්කර ඇත. ස්ත්‍රිය හෝ පුරුෂයා සමාජයේ ශ්‍රේෂ්ඨත්වයට පත් වන්නේ අධ්‍යාත්මික වශයෙන් හදවතේ ඇති ගුණ ධර්ම හා ක්‍රියා කලාප අනුවයි. නුවණින් යුතු කවර පුද්ගලයෙකු වුව ද සමාජයේ ශ්‍රේෂ්ඨත්වයට පත්වන බවත් අනුවණ තැනැත්තා සමාජයේ පහත් තත්ත්වයට පත්වන බවත් බුදු දහමේ ඉගැන්වේ.

**නසෝ සබ්බේසු ඨානේසු - පුරිසෝ හෝති පණ්ඩිතෝ**
**ඉත්ථිපි පණ්ඩිතා හොන්ති - තත්ථ තත්ථ විචක්ඛණා**

මින් කියවෙන්නේ පුරුෂයා හැමවිටම නුවණැති, නොවන බවත් විචක්ෂණ නුවණින් යුතු වූ කල්හි කාන්තාව ද සමාජයේ ශ්‍රේෂ්ඨ වන බවත් ය. පුරුෂ පක්ෂයට මෙන්ම කාන්තා පක්ෂයට ද සමාජයේ සංවර්ධන නියමුවන් විය හැකිය. නුවණ, උත්සාහය, ක්‍රියාශීලී බව යම් කාන්තාවකට ඇත්ද ඇය සමාජ ආර්ථික හා දේශපාලන ක්ෂේත්‍රයේ ද නියමුවන් ලෙස කටයුතු කරයි. අලස නොවී වැඩ කිරීමෙන් එදා කාන්තාව මහඟු ප්‍රතිඵල නෙළා ගන්නේ බුදු දහමෙන් පෙන්වා දුන් නිවැරදි මග නිසා ය.

දිනක් බුදුරදුන් සහ කොසොල් රජු අතර සාකච්ඡාවක් පැවතුණි. එහිදී කොසොල් රජු වෙත පැමිණි නිවසේ පණිවිඩකරුවෙකු රජුගේ අගබිසව වූ මල්ලිකා දේවියගේ කුසින් දියණියක් බිහිවූ බව ප්‍රකාශ කළේ ය. එහිදී රජු දියණියක් ලැබීම ගැන අතිශය කනගාටුවට පත්විය. එහිදී බුදුරදුන් රජු අමතා කනගාටු නොවන ලෙසත් දියණිය වුවද සීලයෙන් හා ගුණධර්මවලින් යුතු වූ කල්හි සමාජයේ ශ්‍රේෂ්ඨ බවට පත්වන බවත් පැහැදිලි කළ සේක. තවද

**ඉත්ථීපි ඒකච්චියා සෙය්‍යා පෝස ජනාධිප**
**මේධාවිනී සීලවතී සස්සු දේවා පතිබ්බතා**

යනුවෙන් දේශනා කරමින් ස්ත්‍රිය පහත් කොට නොසිතන ලෙසත්, යම් කාන්තාවක් සීලයෙන් ගුණයෙන් නුවණින් යුතුව පතිව්‍රතා ධර්මය රකී ද වැඩිහිටි උපදෙස් ගරු කරයි ද එම කාන්තාව රටක් පාලනය කිරීමට තරම් ශ්‍රේෂ්ඨ උසස් කාන්තාවක් වන බව දේශනා කළ සේක.

පුරුෂ පක්ෂයට මෙන් ම කාන්තා පක්ෂයට ද සමාජයේ සම අයිතිවාසිකම් ලබා දුන් බුදුරදුන් ආධ්‍යාත්මික ගුණධර්ම අනුව සමාජ වරප්‍රසාද හිමිකරදුන් සේක.

1. භික්ෂුණියක් වශයෙන්
2. මවක් වශයෙන්
3. ගෘහණියක් වශයෙන්
4. උපාසිකාවක් වශයෙන්

බුදු දහම නිසා කාන්තාව සමාජයේ ශ්‍රේෂ්ඨත්වයට පත් වූවාය. මුල් කාලයේ බුදුරදහු භික්ෂුණී සසුන ආරම්භ කිරීමට අකැමැති වූහ. ඊට හේතුව ඒ සඳහා සුදුසු සමාජ පරිසරයක් නොවූ හෙයිනි. මහා ප්‍රජාපතී ගෝතමිය කසාවත් පෙරවාගෙන තවත් කාන්තාවන් 500ක් සමඟ සැවැත් නුවර කූටාගාර ශාලාවට ගොස් බුද්ධ උපස්ථායක ආනන්ද තෙරුන් හමුවී කාන්තා පක්ෂයට පැවිද්ද ලබා දීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටියා ය. ආනන්ද තෙරුන් එය බුදුරදුන්ට දැන්වූ පසු අෂ්ට ගරු ධර්ම දේශනා කළ අතර ඒවා පිළිගෙන පිළිපැදීමට හැකිනම් භික්ෂුණී සසුන ආරම්භ කළ හැකි බව දේශනා කළ සේක. එම අෂ්ට ගරු ධර්ම මහප්‍රජාපතී ගෝතමී දේවිය ඇතුළු කාන්තා පිරිස පිළිගත් අතර එහිදී බුදුරදුන්ගේ අනුශාසනා පරිදි ලොව භික්ෂුණී සසුන ආරම්භ විය. කාන්තාවක විසින් මනුෂ්‍ය ලෝකයේ දී ලබන ශ්‍රේෂ්ඨතම පදවිය භික්ෂුණියක වී කෙලෙසුන් නසා රහත් ඵලය ලැබීමයි. ඒ සඳහා මඟ සැලසුනේ බුදු දහම නිසයි. කුල භේදය හා බ්‍රාහ්මණ ඉගැන්වීම් නිසා, ස්වාමියාගේ හිංසා පීඩාවන්ට පත්ව සිටි කාන්තා පක්ෂයට පැවිදිව ධර්ම මාර්ගයේ ගමන් කොට සැනසීමට එය මහඟු පිටිවහලක් විය. එමෙන්ම භික්ෂුණීන් සතු විවිධ දක්ෂතා ද ඉස්මතු වූ අතර එය අගයමින් බුදුරදුන් භික්ෂුණීන්ට තනතුරු ද ප්‍රදානය කළ සේක. ඛේමා තෙරණිය නුවණැති භික්ෂුණීන් අතරින් ද, පටාචාරා තෙරණිය විනයධර භික්ෂුණීන් අතරින් ද ආදී වශයෙන් අග තනතුරු ලබා භික්ෂුණී සසුනේ

ඇගයීමට ලක්වූහ. අංගුත්තර නිකායේ ඒකක නිපාතයෙන් එය විග්‍රහ වෙයි.

බුදු දහම කාන්තාවකගේ මව් පදවිය ද ඉහළින් අගය කොට ඇත. "බ්‍රහ්මාති මාතා පිතරෝ" යන බුදු වචන අනුව මව සහ පියා මහා බ්‍රහ්ම නමින් හඳුන්වා ඇත. නිවසේ සිටින බුදුවරු දෙදෙනාගෙන් එක් අයෙකු ලෙස ද මව හැඳින් වේ. පියාට මෙන්ම මවට සැලකීම උතුම් මංගල කරුණක් වේ. මවට නොසැලකීම පරිහානියට හේතුවෙයි. මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යන උතුම් සතර බ්‍රහ්ම විහරණ මවක් සතු බව විස්තර වේ. සමාජයට යහපත් වැඩදායී දරුවන් බිහි කරන්නේ මවයි. එනිසා මව් පදවිය ඉතා උතුම් පදවියක් ලෙස බුදු දහමේ ඉගැන්වේ.

සිව්වනක් පිරිසේ උපාසිකාවක් වශයෙන් ද බුදු දහම කාන්තාව අගය කොට ඇත. සිල්වත් කාන්තාව සමාජයට යහපතකි. කායික හා වාචසික සංවරය කාන්තාවක ගේ උතුම් ආභරණ දෙකක් වේ. පන්සිල්, අටසිල්, දසසිල් ආදිය සුරකිමින් කටයුතු කරන තෙරුවන් සරණ ගිය කාන්තාව පුරුෂයන්ගේ පවා වැඳුම් පිදුම්වලට ලක් වේ. නිති පන්සිල් පොහොය අටසිල් සුරැකීම නිසා සමාජය ඇය ඉහළින් පිළිගැනීමට ලක් කරයි. බුද්ධ කාලයේ සිටි විශාඛා, සුජාතා, බන්ධුල මල්ලිකා ආදී කාන්තාවෝ උපාසිකාවන් බවට පත්වී බුදුරදුන්ගෙන් ද විවිධ තනතුරු ලබා ශ්‍රේෂ්ඨත්වයට පත් වූහ. ඒ තුළින් සංසාර විමුක්තිය ද සලසා ගත්හ.

තවද කාන්තාවට බුදු දහමින් ලැබුණු පිටිවහල නිසා ජන සමාජයේ උසස් පිළිගැනීමටත් විශිෂ්ටත්වයටත් පත් වීමට හැකියාව ලැබුණි. ඉන්දියාව ඇතුළු තදාසන්න

රටවල අගමැතිනි, ජනාධිපතිනි ආදී දේශපාලනයේ ඉහළ තනතුරු ලැබුණි. රාජ්‍ය නායිකාවන් බවට පත්වී රාජ්‍ය පාලනය කිරීමේ සුවිශේෂ හැකියාවක් ද කාන්තාව සතු ය.

බුදු දහම නිසා ලාංකීය කාන්තා පක්‍ෂයට ද නිදහස්ව නිවහල්ව ස්වතන්ත්‍රව ක්‍රියා කිරීමේ හැකියාව ලැබුණි. අනුබුදු මිහිඳු මාහිමියන්ගේ දම් දෙසුම් අසා ලාංකීය කාන්තා පක්‍ෂය ද භික්‍ෂුණියක්, උපාසිකාවක්, මවක්, බිරිඳක් ලෙස අධ්‍යාත්මික වශයෙන් උසස් තත්ත්වයට පත්වී ජන සමාජයේ ඇගයීමට පාත්‍ර විය.

දඹදිව ධර්මාශෝක රජුගේ දියණිය මෙන්ම මිහිඳු මාහිමිගේ සොයුරිය වූ සංඝමිත්තා තෙරණිය ජයශ්‍රීමා බෝධිය දක්ෂිණ ශාඛාවක් ද දහ අට කුලයක කලා ශිල්පීන් ද සමඟ ලක්දිවට වැඩම කළේ භික්‍ෂුණී සසුන ඇරඹීම සඳහායි. උඳුවප් පුර පොහෝ දිනක සිදුවූ එම සංඝමිත්තා ගමනය අපට ඓතිහාසික සිදුවීමක් ලෙස සැලකිය හැකි ය. ජය ශ්‍රීමා බෝධී දක්ෂිණ ශාඛාව අනුරපුර මහමෙව්නා උයනේ රෝපණය කෙරුණු අතර එතැන් සිට එය ලක්වැසියන්ගේ උතුම් පූජනීය වස්තුවක් බවට පත් විය. පසුව දෙවනපෑතිස් රජුගේ අනුග්‍රහය මත සංඝමිත්තා තෙරණියගේ මූලිකත්වයෙන් අනුලා දේවිය ඇතුළු කාන්තාවන් 500 දෙනෙකු පැවිදි කරවා ලක්දිව භික්‍ෂුණී සසුන ඇරඹූහ. එතැන් පටන් ලක්දිව දස දෙස කාන්තාවන් පැවිදි වීමත් සමඟ භික්‍ෂුණී සසුන ව්‍යාප්ත විය. භික්‍ෂුණී සසුන දියුණු කිරීමට ලක්දිව බොහෝ රජවරු ද අනුග්‍රහ දක්වූහ. දෙවන පෑතිස් රජු හත්ථාල්හක නමින් භික්‍ෂුණී ආරාමයක් ද මැදුරු 12කින් යුතු උපාසිකාරාමයක් ද කරවා පූජාකළ බව මහාවංශයේ සඳහන් වේ.

කාවන්තිස්ස රජු තම දියණිය සසුනට පූජා කළේ ය. දුටු ගැමුණු රජු මිරිස වැටි පූජෝත්සවයට භික්ෂුණීන් නම දහසක් වැඩම කරවී ය. ලජ්ජිතිස්ස, මහා තිස්ස, කුඨකණ්ණ තිස්ස වැනි රජවරු ද භික්ෂුණී සසුන දියුණු කිරීමට විවිධ සේවා සිදු කළහ.

පසුව ලාංකීය කාන්තාවගේ විශිෂ්ටත්වය දස දෙස පැතිර යන්නට විය. විහාරමහා දේවිය වැනි වීර කාන්තානවන්, සෝමා දේවිය වැනි පති භක්තික කාන්තාවන්, ඇහැලේපොල කුමාරි හාමි වැනි උතුම් මව්වරුන්, ලීලාවතී සහ කල්‍යාණවතී වැනි සිංහල රැජිනියන් හේමමාලා කුමරිය වැනි (දළදාව රැගෙන ඒම) කාන්තාවන් අප රටට දායාද වූයේ බුදු දහම නිසාවෙනි. එමෙන්ම මෑත යුගයේ අගමැතිනි, ජනාධිපතිනි වැනි උතුම් රාජ්‍ය පදවි පවා හිමිකර ගැනීමට කාන්තා පක්ෂය සමත් වී ඇත. සමාජයෙන් කොන්කර පහත්කර තිබූ කාන්තා සමාජය බුදු සමය නිසා සමාජ නායකත්වයට ද පත්ව ඇත. ඒ අනුව බුදු දහම කාන්තා සමාජය සුවිශේෂ ඇගයුමකට ලක්කර ඇති බව පැහැදිලි වේ.

# 18

# බුදු දහම හා යුග ජීවිතය



බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූයේ ලෝක සත්ත්වයාට සැනසුම උදා කිරීමටයි. මෙලොව, පරලොව හා නිවන් සුවය සලසා ගැනීමට සෑම බෞද්ධයෙකුම

කැමති ය. දුකින් ජීවත් වීමට අකමැතිය. මව්කුස පිළිසිඳ ගැනීම, ඉපදීම, නම් තැබීම, ඉඳුල් කට ගෑම, කන් විදීම, කෙස් කැපීම, අකුරු කියවීම, විවාහ වීම ආදී අවස්ථා පුද්ගල ජීවිතයක මංගල අවස්ථා ලෙස හැඳින්විය හැකි ය. බුදු දහම ලෞකික සැපවත් දිවියකට මඟ පෙන්වා ඇති දහමකි. සමාජයේ මූලික ඒකකය පවුලයි. එය ආරම්භ වන්නේ විවාහයෙනි. විවාහ ජීවිතයේ සාර්ථකත්වය රැඳී ඇත්තේ ආචාර ධර්ම මතයි. ආචාර ධර්ම හඳුනා නොගත් විවාහ වැඩි කල් නොගොස් දෙදරා යයි. එම නිසා සාර්ථක යුග ජීවිතයක් සඳහා බුදුරදුන් දේශනා කොට ඇති ආචාර ධර්ම විමසා බැලීම අතිශය වැදගත් ය.

සාර්ථක විවාහ ජීවිතයකට ප්‍රවේශ වීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු රැසක් තිබේ. බුද්ධ කාලයේ සිටි මහාධන සිටු පුත්‍රයාට අසූ කෝටියක් ධනය තිබූ අතර ඔහු විවාහ වූයේ ද අසූ කෝටියකට ධනය හිමිකම් කියූ කුල කාන්තාවක සමඟ යි. ධනය ඇතත් මේ දෙදෙනා නූගත් වූ නිසා විවාහ වූ පසු විවිධ දුෂ්චරිතයන්ට ඇබ්බැහි වී දෙදෙනාගේ ම ජීවිත අවාසනාවන්ත විය. එක් බමුණෙකුට දූවරුන් සතර දෙනෙක් විය. එම දූවරුන් සතර දෙනා විවාහ කර ගැනීමට පුරුෂයන් සතර දෙනෙක් සිටියහ. එක් පුරුෂයෙකු රූමත් ය. දෙවැනි පුරුෂයා මහලුය. තුන්වන පුරුෂයා වංශවත් අයෙකි. සතර වැන්නා සිල්වත් අයෙකි. පිය බමුණා දිනක් බුදුරදුන් හමුවට ගොස් මේ සතර දෙනාගෙන් වඩා වැදගත් වන්නේ කවරෙක්දැයි විමසී ය. එවිට බුදුරදුන් පිළිතුරු දෙමින් "රූමත්කම තරුණකමට ප්‍රයෝජනවත් ය. මහලු තැනැත්තා පිදිය යුත්තෙකි. කුලවත් පුරුෂයා සාරවත්

පිළිගැනීමට ලක්වේ. වඩා වැදගත් පුරුෂයා වන්නේ සිල්වත් පුරුෂයා ය" යනුවෙන් පැහැදිලි කළ සේක. මේ අනුව විවාහ වීමට පෙර යහපත් සිරිත් විරිත් පරීක්ෂා කළ යුතු බව පෙන්වා දී ඇත. තමන්ට වඩා වයසින් බොහෝ අඩු කාන්තාවන් විවාහ කර ගැනීම පරිහානියට හේතුවන බව ද සඳහන්වේ. සම සීල, සම ශ්‍රද්ධා, සම ත්‍යාග, සම ප්‍රඥා යන සිව් ලක්ෂණයන්ගෙන් යුතු දෙදෙනාගේ යුග ජීවිතය අතිශයින් සාර්ථක ය. අංගුත්තර නිකායේ චතුක්ත නිපාතයේ යුග ජීවිත සතරක් ගැන සඳහන් වේ.

1. දෙව්යෙකු දෙවඟනක හා විසීම
2. දෙව්යෙකු මළ මිනියක් හා විසීම
3. මළ මිනියක් දෙවඟනක හා විසීම
4. මළ මිනියක් මළ මිනියක් හා විසීම

මෙහි දෙවියා යනු සදාචාරවත් විනීත පුද්ගලයා ය. දෙවඟන යන්නෙහි තේරුම ද එයයි. මළමිණිය යනු අදැහැමි දුරාචාරී බවයි. බුදුරදුන් අගය කොට ඇත්තේ දෙව්යෙකු දෙවඟනක හා විසීම නම් වූ යහපත් පුරුෂයා සමඟ යහපත් කාන්තාවක් විවාහ ජීවිතයක් ගත කිරීමයි. සැමියා හා බිරිඳ යනු පවුලයි. සමාජයට නව සාමාජිකයින් බිහිවන්නේ හොඳ පවුලක් තුළිනි. එනිසා සැමියා සහ බිරිඳ යන දෙදෙනාම සදාචාරවත් විය යුතු ය.

දෙදෙනෙකු විවාහ වීමේ දී මව්පියන්ගේ ආශිර්වාදය අවශ්‍ය ය. එසේ නොවන විවාහ ජීවිත බුදු දහම අගය නොකරයි. විවාහ වූ කාන්තාවක විසින් පිළිපැදිය යුතු ආචාර ධර්ම දහයක් මිගාර සිටුවරයා විසින් විශාඛාවට හඳුන්වා දී ඇත. එනම්,

1. ඇතුළත ගිනි පිටතට නොදෙන්න.
2. පිටත ගිනි ඇතුළට නොගන්න.
3. දෙන්නන්ට දෙන්න.
4. නොදෙන්නන්ට නොදෙන්න.
5. දෙන්නන්ටත් නොදෙන්නන්ටත් දෙන්න.
6. සුවසේ හිඳින්න.
7. සුවසේ සැතපෙන්න.
8. සුවසේ අනුභව කරන්න.
9. ගිනි පිරිමසන්න.
10. ඇතුළු ගෙයි දෙවියන් පුදන්න යනු යි.

බුදුරදුන් විවාහක දෙදෙනෙකු විසින් සාර්ථක ජීවිතයක් ගත කිරීම සඳහා ඉටුකළ යුතු යුතුකම් විවිධ අවස්ථාවල දේශනා කොට ඇත. සෑම බිරිඳක් විසින් ම ආදරය, භක්තිය, වගකීම් ඉටු කිරීම, පති භක්තිය, දරුවන් පෝෂණය කිරීම, අරපරිස්සම, නිවස සුන්දරව තබා ගැනීම යන යුතුකම් ඉටුකළ යුතු ය. එමෙන් ම සෑම සැමියෙකු විසින්ම ආචාරශීලී බව, මෘදු බව, ප්‍රියවාදීබව, විශ්වාසවන්තකම, අවංකකම යන ආචාරධර්ම අනුගමනය කළ යුතුය. බුදුරදුන් සිඟාලෝවාද සූත්‍රයේදී අඹු සැමියන් බටහිර දිශාව ලෙස නම්කර ඇත. එහිදී සැමියා ඉටුකළ යුතු යුතුකම් පහක් ද බිරිඳ ඉටුකළ යුතු යුතුකම් පහක් ද සඳහන් වෙයි. සැමියා විසින් භාර්යාවට,

1. ගරුසරු දැක්වීම.
2. අවමන් නොකිරීම
3. පර ස්ත්‍රීන් කරා නොයාම
4. නිවසේ වගකීම බිරිඳට පැවරීම
5. ඇඳුම් පැළඳුම් ආභරණ ආදිය සැපයීම

යන යුතුකම් ඉටුකළ යුතු ය. එසේම ඊට සමගාමීව භාර්යාව විසින් ද,

1. නිවසේ වැඩ මැනවින් ඉටු කිරීම
2. පිරිවර ජනයාට සංග්‍රහ කිරීම
3. පර පුරුෂයන් කරා නොයාම
4. රැස්කල වස්තුව ආරක්ෂා කිරීම
5. කම්මැළි නොවී වැඩ කිරීම

යන යුතුකම් ඉටුකළ යුතු ය. එවිට ස්වාමියා සහ භාර්යාව අතර අන්‍යෝන්‍ය විශ්වාසය ඇති වෙයි. අඬදබර ඇති නොවෙයි. පවුලේ සමගිය ආරක්ෂා වෙයි. ගිහිගෙය ගිනි ගෙයක් හා සමාන හෙයින් සියලු කටයුතු සැලකිලිමත්ව හා ඉවසීමෙන් කිරීමට වගබලා ගත යුතු ය.

විවාහයෙන් සෑම භාර්යාවක්ම සැමියාගේ සිත දිනා ගැනීමට අනුගමනය කළ යුතු යුතුකම් අටක් අංගුත්තර නිකායේ සඳහන් වෙයි. එනම්

1. සැමියාට පෙර අවිදිවීම
2. සැමියාට පසුව නින්දට යාම
3. සැමියා ගේ අවශ්‍යතා විමසා බැලීම
4. ප්‍රිය මනාප ලෙස හැසිරීම
5. ප්‍රියමනාප ලෙස කථා කිරීම
6. සැමියා විසින් ගරු සැලකිලි දක්වන අයට සැලකීම
7. ස්වාමියා උපයන වස්තුව ආරක්ෂා කිරීම
8. සෑම තැනක්ම සුන්දරව තබා ගැනීම යනුයි.

බුදුරදුන් මෙම උපදෙස් විශාඛාවටත් නන්දමාතා සිටු දේවියටත් දේශනා කොට ඇත. මෙලෙස කටයුතු කරන කාන්තාව දේවතාවියක් ලෙස හඳුන්වා ඇත.

සප්ත භාර්යා සූත්‍රය දේශනා කරමින් බුදුරදුන් භාර්යාවරු හත් දෙනෙක් හඳුන්වා දෙයි.

1. වධක සම (සැමියාට වධ දෙන)
2. චෝරි සම (සොරකම් කරන බිරිඳ)
3. සාමි සම (අධිපතිනියක් වැනි බිරිඳ)
4. මාතු සම (මවක් වැනි බිරිඳ)
5. භගිනි සම (නැගෙණියක් වැනි බිරිඳ)
6. සඛී සම (මිතුරියක් වැනි බිරිඳ)
7. දාසි සම (දාසියක් වැනි බිරිඳ)

මින් මුලින් සඳහන්ව ඇති භාර්යාවරු තිදෙනා බුදු දහම අගය නොකරයි. එවැනි භාර්යාවන් නිසා නිවසේ නිතර ගැටුම් ඇතිවේ. විවාහ ජීවිතය අවුල් සහගත වෙයි. එවන් බිරිඳක් නිසා සැමියෙකුට අපමණ දුක් වේදනා විඳීමට සිදුවෙයි. බුදු සමය අගය කරනුයේ මාතු, භගිනි, සඛී සහ දාසි යන භාර්යාවන් සතර දෙනා ය. එවන් ගති ලක්‍ෂණ ඇති බිරිඳක් ලැබීමෙන් දෙදෙනාගේ ම ජීවිත සාර්ථකත්වයට පත්වෙයි.

විවාහ ජීවිතයක් සාර්ථක වන්නේ යුතුකම් ඉටු කිරීමෙනි. බිරිඳගේ යුතුකම් සැමියාගේ අයිතිවාසිකම් ය. සැමියාගේ යුතුකම් බිරිඳගේ අයිතිවාසිකම් වේ. එනිසා තම යුතුකම් නිසිලෙස වටහාගෙන ක්‍රියා කළ යුතු ය.

පන්සිල් සුරකිමින් යහපත් පවුල් ජීවිත ගත කරන අඹු සැමියන් දෙවියන්ගේ ද ප්‍රශංසාවට ලක්වන බවත් ඔවුන්ට දෙව්ලොව අධිපති ශක්‍රයා ද නමස්කාර කරන බවත්,

"යේ ගහට්ඨා පුඤ්ඤකරා
සීලවන්තා උපාසකා
ධම්මේන දාරං පෝසෙන්ති
තං නමස්සාමි මාතලී"
යන පාඨය අනුව මැනවින් පැහැදිලි වෙයි.

යශෝධරා තෙරණියගේ චරිතය අනුව එතුමිය පිරිනිවන් පෑමට පෙර "මෙලොව යහපත් ස්ත්‍රී පුරුෂ දෙදෙනාගේ විවාහය සම රෝද දෙකකින් යුතුව ගමන් කරන රථයක් බඳු ය. එනිසා දෙදෙනාගේ අදහස් සම විය යුතු ය. යහපත් ස්ත්‍රිය තම සැමියාට අවංකව ආදරය කළ යුතු ය. දෙවියෙක්, ගුරුවරයෙක්, පියෙක් සේ සිතා කටයුතු කළ යුතු ය. පුරුෂයන්ට ආදරය නොදක්වන ස්ත්‍රීහු අපාගත වන්නාහ. පුරුෂයාට අවංකව ආදරය දක්වන ස්ත්‍රීහු සුගතියෙහි උපදින්නාහ" යනුවෙන් කර ඇති ප්‍රකාශය වත්මන් භාර්යාවන්ට තම විවාහ ජීවිතය සාර්ථක කර ගැනීමට අතිශය ආදර්ශවත් ය.


බුද්ධ කාලයේ ජීවත් වූ නකුල මාතා සහ නකුල පිතා යන අඹු සැමියන්ගේ ජීවිත බුදුරදුන්ගේ පවා ඇගයීමට ලක්ව ඇත. දෙදෙනාම ශ්‍රද්ධාවෙන්, ශීලයෙන්, පරිත්‍යාගයෙන්, ප්‍රඥාවෙන් සම වූහ. මෙබඳු වූ අදහස් ඇති දෙදෙනෙකු ප්‍රාර්ථනා බලයෙන් පසු ආත්මවලද අඹුසැමියන් වී සාර්ථක ජීවිත ගත කරනු ලබයි. බුදුරදුන් සෙසු අඹු සැමියන් අමතා නකුල මාතා නකුල පිතා යන දෙදෙනා මෙන් සුවසේ සමගියෙන් ජීවත් විය යුතු බව දේශනා කොට ඇත.

මෙලෙස බුදුරජාණන් වහන්සේ විසින් යහපත් අදහස් ඇති දෙදෙනාගේ විවාහ ජීවිතය අගය කොට ඇත. එමෙන් ම සාර්ථක විවාහ ජීවිතයක් සඳහා බුදුරදුන්

දී ඇති උපදෙස් මැනවින් පිළිපදින්නේ නම් වත්මන් සමාජයේ ජීවත්වන අඹුසැමියන්ගේ ජීවිත ද වඩාත් සාර්ථක වනු ඇත. සැනසීමෙන් විශ්වාසයෙන් යුතුව ජීවත් වීමට හැකියාව ලැබෙනු ඇත. එහෙයින් විවාහ ජීවිත ගත කරන ඔබ සැමත් බුදුරදුන් දෙසූ උපදෙස් පිළිගෙන ඒ අනුව යුග දිවිය සාර්ථක කර ගැනීම සඳහා උත්සාහවත් වන්න.

# 19

# බුදු දහම හා කර්මය හා පුනර්භවය



## කර්මය

කර්මය යන වචනය පාලි භාෂාවේ "කම්ම" නමින් හඳුන්වයි. බුදුරදුන් ලොව පහළවීමට පෙර ද කර්මය ගැන ඉගැන්වූ ආගම් තිබිණි. නමුත් කර්මය පිළිබඳ නිවැරදි සංකල්පයක් ඉදිරිපත් කර ඇත්තේ බුදුරජාණන්

වහන්සේ ය. යම් කර්මයක් කිරීමට මුල් වන්නේ චේතනාවයි. බුදුරදුන් එය භික්ෂූන් අමතා දේශනා කළේ,

**"චේතනාහං භික්ඛවේ කම්මං වදාමි**
**චේතියිත්වා කම්මං කරෝති**
**කායේන වාචාය යමනසා"**

(මහණෙනි, චේතනාව කර්මය යැයි කියමි. සිතාමතා සිතින් කයින්, වචනයෙන් කර්මය රැස් කරයි) යනුවෙනි.

**කර්මයේ ප්‍රභේද 02 ක් ඇත. එනම්**

1. අකුසල කර්මය
2. කුසල කර්මය

ලෝභය, ද්වේශය, මෝහය යන අකුසල මුල් වීමෙන් සිතින්, කයින්, වචනයෙන් සිදු කරන ක්‍රියා අකුසල කර්ම නම් වේ. අලෝභ, අද්වේශය, අමෝහය (කුසල මූල) යන පුණ්‍ය චේතනා මුල්ව සිතින්, කයින්, වචනයෙන් සිදු කරන ක්‍රියා කුසල කර්ම නම් වේ.

පුණ්‍ය හෝ පාප චේතනාවකින් තොරව අපගේ සිත, කය, වචනය යන තිදොරින් සිදුවන ක්‍රියා තුළින් අපට කුසලයක් හෝ අකුසලයක් සිදු නොවේ. නිදසුනක් ලෙස අප පාරේ ගමන් කරන විට අපගේ පයට පෑගී සතුන් මැරී යාම, සතුන්ට හිරිහැර වීම තුළින් අපට කුසලයක් හෝ අකුසලයක් සිදු නොවේ. ඊට හේතුව අපගේ චේතනාවකින් තොරව ඉබේ සිදුවන දෙයක් වීමයි.

ලෝභය, ද්වේශය, මෝහය මුල් වී තිදොරින් සිදුවන අකුසල කර්ම සහ අලෝභය, අද්වේශය, අමෝහය මුල්වී තිදොරින් සිදුවන කුසල කර්මය මොනවාදැයි අපි පහත වගුව තුළින් හඳුනා ගනිමු.

| තිදොර | කුසල කර්මය | අකුසල කර්මය |
|---|---|---|
| සිත | මෛත්‍රිය, කරුණාව, දයාව, ඉවසීම, නිහතමානී බව | වෛරය, ක්‍රෝධය, ඊර්ෂ්‍යාව, මසුරුබව, අහංකාරකම, කලකිරීම |
| කය | දන් දීම, සිල් රැකීම, අනුන්ට උදව් කිරීම | සතුන් මැරීම, සොරකම, කාමය වරදවා හැසිරීම, සුරා පානය, සූදුව |
| වචනය | සත්‍ය වචනය, අර්ථවත් වචන, මෛත්‍රිය සහගත වචන | බොරුකීම, කේලාම් කීම, හිස් වචන කීම, පරුෂ වචන කීම |

අප පෙර ආත්මයේ සිදු කළ කුසල හා අකුසල් මේ භවයේ විපාක දෙනු ලබයි. මේ ආත්මයේ සිදු කරන කුසල් හා අකුසල් වල ඵල විපාක ලබන ආත්මයේ දී ලබාදෙයි. බුදුරදුන් චුල්ල කම්ම විභංග සූත්‍රයේ දී විපාක දෙන කර්ම (කුසල් අකුසල්) 14 ක් දේශනා කොට ඇත.

01. දීර්ඝායුෂ ලැබීමට හේතුව - සැමට මෛත්‍රිය කිරීම
02. ආයුෂ අඩුවීමට හේතුව - සතුන් මැරීම
03. නිරෝගී වීමට හේතුව - අනුන්ට කායික පීඩා නොකිරීම
04. නිතර රෝගී වීමට හේතුව - අනුන්ට කායික පීඩා කිරීම
05. රූමත්වීමට හේතුව - අනුන්ට ක්‍රෝධ නොකිරීම
06. විරූපී වීමට හේතුව - අනුන්ට ක්‍රෝධය කිරීම

07. මහානුභාව සම්පන්න වීමට හේතුව - අනුන්ගේ දියුණුව සලසා දීම
08. අල්පානුභාව සම්පන්න වීමට හේතුව - අනුන්ගේ දියුණුවට ඊර්ෂ්‍යා කිරීම
09. පොහොසත් වීමට හේතුව - අනුන්ට උපකාර කිරීම (දන් දීම)
10. දුප්පත් වීමට හේතුව - අනුන්ට උපකාර නොකිරීම (දන් නොදීම)
11. කුලවත්වීමට හේතුව - නිහතමානීව සිටීම
12. කුලහීනවීමට හේතුව - අහංකාර වීම
13. නුවණැති වීමට හේතුව - බුද්ධිමතුන්ගෙන් හොඳ නරක විමසා දැන ගැනීම
14. අනුවණ වීමට හේතුව - හොඳ නරක නොවිමසීම

මිනිසාට කර්ම විපාකයට මුහුණ පෑමට සිදුවන්නේ මේ අයුරිනි. බුද්ධ කාලයේ කර්මය පිළිබඳ වෙනත් ආගමිකයන් ඉදිරිපත් කළ මත කිහිපයක් ම තිබුණි.

**පුබ්බේ කත හේතු වාදය** - (සියල්ල සිදුවන්නේ පෙර ආත්මයේ කරන ලද කර්මය අනුව බව)

**අධිච්ච සමුප්පන්නවාදය** - (සෑම දෙයක් ම සිදුවන්නේ අහම්බෙන් බව)

**නියති සංගති හේතුවාදය** - (සෑම දෙයක් ම සිදුවන්නේ කිසියම් නියතයක් අනුව බව)

මෙම ඉගැන්වීමේ දී බුදුරදුන් ලොව පහළවීමට පෙර පැවති ඉගැන්වීම් විය. බුදු දහමේ කර්මය ප්‍රධාන

ඉගැන්වීමක් වුව ද ලොව සියල්ල සිදුවන්නේ කර්මය නිසා යැයි නූගැන්වේ. කර්මය එක් නියමයක් පමණි. ලොව සියල්ල සිදුවන්නේ පංචනියාම ධර්ම අනුව බව විග්‍රහ වේ. එනම්,

01. උතු නියාම
02. බීජ නියාම
03. ධම්ම නියාම
04. චිත්ත නියාම
05. කම්ම නියාම යනු යි.

**උතු නියාම යනු** :-

කාලගුණික වශයෙන් සිදුවන වෙනස්වීමයි. අව්ව, වැස්ස, රැය, දහවල, සුළඟ, ශීත, උෂ්ණ ආදී වෙනස්කම් සිදුවන්නේ ලොව පවත්නා උතු නියාම නිසයි.

**බීජ නියාම යනු :-**

රෝපණය කරන බීජයක් අනුව පැළ හට ගැනීම, ගසක් වීම, මල්හට ගැනීම, ගෙඩි හට ගැනීම ආදී ලෙස වන සිදුවීම් ය. තව ද දෙමව්පියන්ට ලැබෙන දරුවන්ගේ රූපය, කටහඬ, හැසිරෙන විලාසය, ගති පැවතුම්, දෙමව්පියන් ට සමාන වීම ද බීජ නියාමයට තවත් නිදසුනකි.

**ධම්ම නියාමය යනු :-**

ලොව සොබාදහමට අනුව සිදුවන වෙනස්වීම් ය. බිලිඳෙකු මව්කුසින් බිහිවීම, වර්ධනය වීම, ළමයෙකු වීම, තරුණයෙකු වීම, වැඩිහිටියෙකු වීම, මහලු වීම, මරණයට පත්වීම ආදිය සිදුවන්නේ ලොව සොබාදහමට අනුවයි. එමෙන්ම ගසක් හට ගැනීම, මල් හට ගැනීම, ගෙඩි හට ගැනීම, ගස දිරාපත්වීම ආදී සිදුවීම් ද ධම්ම නියාමයට අනුව සිදුවෙයි.

**චිත්ත නියාමය යනු :-**

පුද්ගලයන්ගේ සිතිවිලි අනුව සිදුවන වෙනස්කම්ය. යහපත් සිතිවිලි ඇතිවිට යහපත් වැඩ කිරීම, අයහපත් සිතිවිලි ඇති විට අයහපත් වැඩ කිරීම යනුවෙන් දක්විය හැකි ය. සිතින් සිතන දේ අනුව හොඳ හෝ නරක සිතිවිලි ඇතිවේ. සිත, කය, වචනය අනුව තිදොරෙහි ක්‍රියාකාරීත්වය ද ඒ අනුව වෙනස් වේ.

**කම්ම නියාමය යනු :-**

පුද්ගලයෙකු පෙර ආත්මයේ හෝ මේ ආත්මයේ සිදුකරන ලද කුසල හෝ අකුසල කර්මයට අනුව ලැබෙන විපාකයන් ය. කුසල ක්‍රියා සිදු කිරීමෙන් යහපත් ක්‍රියා ප්‍රතිඵල ද අකුසල ක්‍රියා සිදු කිරීමෙන් අයහපත් විපාකයන්ට ද මුහුණ පෑමට සිදුවෙයි.

ඉහත නියාම ධර්මය අනුව පැහැදිලි වන්නේ ලොව සියල්ල නියාම ධර්ම අනුවම සිදුවන බවයි. කර්මය එහි එක් නියාමයක් බව ද තේරුම් ගත යුතුය. පංච නියාම ධර්ම අවබෝධ කරගෙන ලොව පැවැත්ම වටහා ගැනීම ඉතා වැදගත් ය.

ඇතැම් කර්ම අපගේ උත්සාහය නිසාත් ඇතැම් කර්ම සමාජ හේතු සාධක අනුවත් වෙනස් කළ හැකිය. එය වටහා ගැනීම සඳහා බුදුරදුන් දේශනා කොට ඇති සම්පත්ති සතර සහ විපත්ති සතර විමසා බලමු.

1. ගති සම්පත්ති - ගති විපත්ති
2. කාල සම්පත්ති - කාල විපත්ති
3. උපධි සම්පත්ති - උපධි විපත්ති
4. පයෝග සම්පත්ති - පයෝග විපත්ති

ගති සම්පත්ති යනු ධනවත් පවුලක ඉපදීමට හේතුවන කර්ම ශක්තියයි. එබඳු පවුලක ඉපදුනු විට

පෙර ආත්මයේ කළ අකුසල් හි විපාක ද වැලකී යා හැකි ය. ගති විපත්ති යනු දිළිඳු පවුලක උපත ලැබූ විට විවිධ කරදර හිරිහැර දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදුවෙයි. පෙර ආත්මයේ කල අකුසල් තිබුණ ද එහි යහපත් ප්‍රතිඵල ද යටපත්වී දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදුවෙයි.

**කාල සම්පත්ති** යනු සෞභාග්‍යමත් කාලයක උපත ලැබීමට හේතුවන කුසල ශක්තියයි. කලට වැසි ලැබී කෙත්වතු සරුසාර වී සිතුම් පැතුම් ඉටුවන කාලයක උපත ලැබීමෙන් ධනවත්ව සැප සම්පත් විඳිය හැකි ය. ඒ තුළින් අකුසල කර්මවල විපාක ද වැළකී යයි. **කාල විපත්ති** යනු අවාසනාවන්ත කාලයක උපත ලැබීමට හේතුවන අකුසල ශක්තියයි. ආහාරපාන, අඟහිඟකම්, නියඟය ආදී දුෂ්කරතා ඇති කාලයක ඉපදීමෙන් තමා පෙර ආත්මයේ කළ කුසල් තිබුණ ද එහි විපාක නොලැබ දුක් විඳීමට සිදුවනු ඇත.

**උපධි සම්පත්ති** යනු පෙර කුසල් නිසා රූප සම්පත්තියෙන් යුතුව ඉපදීමයි. ධනවත් හෝ දිළිඳු හෝ කවර පවුලක උපත ලැබූවත් ඔහු සමාජයේ ප්‍රියශීලී බවට පත්වෙයි. වරප්‍රසාද හිමිවෙයි. පිළිගැනීමට ලක්වෙයි. **උපධි විපත්ති** යනු අශෝභනව උපත ලැබීමයි. පෙර අකුසල් ඊට බලපානු ලබයි. ධනවත් පවුලක අශෝබනව උපත ලැබූවත් නොයෙක් අවමානයන්ට ලක්වීමට සිදුවෙයි. පෙරකල කුසල් තිබුණ ද එහි ආනිසංස ලැබීමට ද නොහැකි වනු ඇත.

පයෝග සම්පත්ති යනු තැනට සුදුසු නුවණින් කටයුතු කිරීමේ හැකියාවයි. එවිට ඔහු සමාජයේ අවමානයට ලක් වෙයි. පයෝග විපත්ති යනු අනුවණයෙකු වීමයි.

මේ අනුව කර්මය පුද්ගල ජීවිතයට බලපානු ලබන ප්‍රබල සාධකයක් බව පැහැදිලි වේ.

## පුනර්භවය

පුනරුත්පත්තිය සහ පුනර්භවය යනු සංකල්පය දෙකකි. පුනරුත්පත්තිය යනු මොලොව උපන් තැනැත්තා මියගොස් තවත් ආත්මයක උපදින බව පිළිගැනීමයි. බුදු දහම එය පිළිනොගනී. බුදු දහමේ ඉගැන්වෙන්නේ පුනර්භවය පිළිබඳවයි. පුනර්භවය යනු මිය ගිය පුද්ගලයාගේ සිතිවිලිවලට අනුව අලුත් රූපකායක් ඇතිව අලුත් ආත්ම භවයක ඉපදීමයි. ඊට බලපාන සිත් 2 කි.

1. එක් භවයක ජීවිතයේ අවසානය හෙවත් මරණයත් සමඟ ඇතිවන චුති සිත
2. එම චුතිය සිත ඇසුරින් භවයක ඇතිවන පටිසන්ධි සිත

යනු යි. පුද්ගලයා ඉපදුනදා සිට මිය යන දින දක්වා සෙල්ලම් කිරීම, ඉගෙනීම, රක්‍ෂා කිරීම ආදී විවිධ ක්‍රියාවල නියුතු වෙයි. ආයුෂ අවසානයේ මරණයට පත්වෙයි. මරණය යනු ශරීරයෙන් විඤ්ඤාණය වෙන් වීමයි. ශරීරයෙන් උෂ්ණය, ආයුෂ, විඤ්ඤාණය ඉවත් වීමත් සමඟ මරණය සිදුවෙයි. ශරීරය පොළොවට පස් වී යන අතර විඤ්ඤාණය විසිරී නොයයි.

පුනර්භවයට සම්බන්ධ වන්නේ එම විඤ්ඤාණ ශක්තියයි. එම විඤ්ඤාණය අලුත් භවයක් වෙත ගමන් කරයි. පුනර්භවයක් ලැබීමට මරණාසන්න මොහොතේ කරුණු 03 ක් බලපායි. ඒ අනුව,

01. කර්මය
02. කර්ම නිමිති
03. ගති නිමිති පහළ වෙයි.

තමා ජීවිතයේ දී කළ කුසල් හෝ අකුසල් මරණාසන්න මොහොතේ දී අරමුණු වීම කර්මය නම් වේ. එම කර්මය කිරීමේ දී උපකාර වූ හා වෙනත් හේතු සාධක කර්ම නිමිති නම් වේ. උදාහරණ ලෙස එක් පුද්ගලයකු තවත් පුද්ගලයෙකු ඝාතනය කිරීමේ දී ඊට යොදාගත් අවි ආයුධ, වස විස දැක්විය හැකි ය. දානයක් දීමේ කුසල ක්‍රියාවක් නම් ආහාර පාන, භික්ෂු පිරිකර, උදව් කල පුද්ගලයන් දැක්විය හැකි ය.

ගති නිමිති යනු මරණාසන්න පුද්ගලයා මනෝමය ඇසින් දකින රූපයන් ය. මරණාසන්න මොහොතේ රතුපාට වස්ත්‍ර, ආචාරශීලී මිනිසුන් මැවී පෙනෙන්නේ නම් මිනිස් ලොව ද, දෙවිවරු, දෙවඟනන්, දිව්‍ය රථ පෙනෙන්නේ නම් දෙව්ලොව ද, ප්‍රේතයන් දකීනම් ප්‍රේත ලොවද, ගිනිදැල්, යක්ෂයන් දකී නම් අපායෙහි ද උපදින බව සඳහන් වේ.

පුද්ගලයෙකු හෝ සත්ත්වයෙකු මව් කුසේ පිළිසිඳ ගැනීම හෙවත් ප්‍රතිසන්ධිය සඳහා බලපාන කරුණු 03ක් මජ්ඣිම නිකායේ මහාතණ්හා සංඛ්‍ය සූත්‍රයේ දැක්වෙයි. එනම්,

01. මව ඔසප්වීම
02. මව්පිය සංවාසය
03. ගන්ධබ්බ හෙවත් විඤ්ඤාණය පිළිසිඳ ගැනීම

පිළිසිඳ ගැනීමෙන් පසු කළලය ක්‍රමයෙන් වර්ධනය වී මව් කුසින් මෙලොවට බිහිවෙයි. සත්ත්වයින් මෙලොව බිහිවන උත්පත්තිය ස්ථාන 04ක් පිළිබඳ දහමේ සඳහන් වේ.


01. අණ්ඩජ
02. ජලාබුජ
03. සන්සේදජ
04. ඕපපාතික

**අණ්ඩජ** යනු මාළුවන්, කුරුල්ලන් වැනි බිත්තරවලින් උපදින සතුන් ය. **ජලාබුජ** යනු මිනිසුන්, සිවුපාවුන් වැනි මව්කුසින් උපදින සතුන් ය. **සන්සේදජ** යනු පියවි ඇසට නොපෙනෙන තරම් වූ ශුද්‍ර ජීවීන් ය. අන්වීක්ෂය වැනි උපකරණවලින් මෙම සතුන් දකබලා ගත හැකි ය. දෙවියන්, ප්‍රේතයන්, භූතයන් වැනි ඉබේ හට ගන්නා පිරිස **ඕපපාතික** නම් වේ.

ඉහත කරුණු අනුව බුදු දහමෙහි විග්‍රහවන කර්මය හා පුනර්භවය යනු කුමක්දැයි වටහා ගත හැකි ය. ඔබේ සංසාර ගමන සකස් විය යුත්තේ කෙසේදැයි ඒ අනුව ඔබට තීරණය කර ගැනීමට අපහසු නොවනු ඇත.

# 20

# බුදු දහමට අනුව සාර්ථක ජීවිතයකට පියවර



මෙලොව උපන් සෑම පුද්ගලයෙකු ම සාර්ථක ජීවිතයක් ගොඩනගා ගැනීමට ඉතා කැමැති ය. නමුත් ඒ සඳහා අනුගමනය කළ යුතු නිවැරදි ප්‍රතිපත්ති හඳුනා නොගැනීම නිසා විවිධ ගැටලුවලට මුහුණ පා තිබේ.

සාර්ථක ජීවිතයක් යනු භෞතික හා අධ්‍යාත්මික යන දෙ අංශයෙන් ම ලබන දියුණුවයි. බුදුරජාණන් වහන්සේ භෞතික හා අධ්‍යාත්මික දියුණුව තුළින් සාර්ථක ජීවිතයක් ගොඩනගා ගත හැකි අයුරු මැනවින් දේශනා කොට ඇත. ඒ අනුව ශ්‍රද්ධාව, සීලය, පාපයට ලජ්ජාව, පාපයට බිය, උගත්කම, පරිත්‍යාගය, ප්‍රඥාව සාර්ථක ජීවිතයක් සඳහා හේතුවන උතුම් ගුණ ධර්ම හතක් ලෙස බුදු දහමේ විග්‍රහ වෙයි.

## 01. ශ්‍රද්ධාව

ශ්‍රද්ධාව යනු බුද්ධ, ධම්ම, සංඝ යන තෙරුවන් කෙරෙහි විශ්වාසයයි. එනම්, නව අරහාදී බුදු ගුණ, ස්වක්ඛාතාදී දහම් ගුණ, සුපටිපන්න ආදී සඟ ගුණ පිළිගැනීමයි. තෙරුවන්ගේ ගුණ නිසි ලෙස හඳුනාගෙන ඊට වැඳුම් පිදුම් කරන ධර්මය ඇසීමට කැමති, සංඝ රත්නයට ගරු කරන පුද්ගලයාට ධර්ම ප්‍රීතියෙන් කල් ගෙවිය හැකි ය. බුදුරදුන් දෙසූ ධර්මය අවබෝධ කරගෙන කර්මය හා කර්ම ඵලය විශ්වාස කරන තැනැත්තා සැබෑ ශ්‍රද්ධාවන්තයා ය. ඔහු කිසිඳු දිනෙක තෙරුවන් හැර නොයයි. තෙරුවන තම ජීවිතයට සරණ හා පිහිට කර ගනිමින් සුවසේ කල් ගෙවයි.

## 02. සීලය

සීලය යනු කය සහ වචනය සංවර කර ගැනීමයි. ඒ තුළින් සිත හීලෑ වීම ද සිදුවෙයි. කයින් සිදුවන සතුන් මැරීම, සොරකම් කිරීම, වැරදි කාම සේවනය, සුරාපානය යන දුෂ්චරිත සහ වචනයෙන් සිදුවන බොරුකීම, කේලාම් කීම, හිස් වචන කීම, පරුෂ වචන කීම යන වාචසික දුෂ්චරිතයෙන් ද වැළකිය යුතු ය. අනුන්ගේ ජීවිත හා දේපළ ආරක්ෂා කිරීම, දුන් දෙය පමණක් ගැනීම, වැරදි

ලෙස කාම සේවනය නොකිරීම, මත් වතුර හා දුම්වැටි පානය නොකරන්නෙකු වීම තුළින් කාය සුචරිතය සුරකින අයෙකු වෙයි.

වාචසික සුචරිතය උදෙසා සත්‍ය, අර්ථවත්, ප්‍රියශීලී, කාරුණික අනුන් සමගි කරන වචන කථා කළ යුතු ය. මෛත්‍රී සහගත සිතින් සුදුසු වේලාවේදී සත්‍ය කථා කරන පුද්ගලයා සමාජයට ප්‍රියශීලී පුද්ගලයෙකු බවට පත්වෙයි. කායික හා වාචසික දුෂ්චරිතයෙන් වැළකීම විරති නමින් ද කායික හා වාචසික සුචරිතයේ යෙදීම සමාදාන නමින් ද හැඳින්වේ. නිති පන්සිල් පොහොය අටසිල් සමාදන් වීමම ප්‍රමාණවත් නොවේ. එම සිල්පද ආරක්ෂා කිරීමෙන් සුචරිත සිල්වත් දැහැමි අයෙකු බවට පත්වෙයි.

## 03. පාපයට ලජ්ජාව

කයින් හා වචනයෙන් දුෂ්චරිත සිදු කිරීමෙන් තමාට සමාජයෙන් අවමන් විඳීමට සිදුවෙයි. අනුන්ගේ පිළිකුලට ලක්වෙයි. එසේ සිතා පාපකාරී දුෂ්චරිත ක්‍රියා කිරීමට ලජ්ජා වීම "හිරි" නමින් ද හැඳින්වේ. යම් ක්‍රියාවක් කිරීමට පෙර එම ක්‍රියාවෙන් තමන්ට යහපතක් සිදුවේ ද අයහපතක් සිදුවේද යැයි සිතාබැලිය යුතු ය. තමාගෙන් යම් වරදක් වූ විට සමාජයෙන් අවමන් විඳීමට සිදුවෙයි. එවිට තමා පිළිකුල් කරයි. එනිසා එවැනි වැරදි ක්‍රියාවලින් වැළකිය යුතු ය. යමක් කිරීමට පෙර දුර දක්නා නුවණින් එහි ඵල විපාක සිතා බැලීම බුද්ධිමතාගේ ස්වභාවයයි. තමා අතින් යම් වරදක් වූ විට එය වසා ගැනීම පහසු දෙයක් නොවේ. වරදේ දී අනුන් පිළිකුල් කරයි. එනිසා කල්තියා එබඳු දුෂ්චරිතවලින් වැළකී සිටිය යුතු ය.

## 4. පාපයට බියවීම

පාප යනු දුෂ්චරිත ක්‍රියාවන් ය. නුවණැත්තෝ ඊට බිය වෙති. පාපය තුළින් සමාජයෙන් අපමණ නින්දා අපහාස විඳීමට සිදුවෙයි. යහපත් සමාජයේ පිළිකුලට හා අවමානයට ලක්වෙයි. එවිට තමා පරිහානි පුද්ගලයෙකු බවට පත්වෙයි. සමාජයෙන් කොන් වෙයි. ඇතැම් විට නීතියේ රැහැනට පවා හසුවෙයි. එලෙස මෙලොව පිරිහීම යනු පරලොව ද පිරිහීමයි. ඊට බිය වී දුසිරිත හෙවත් පාපයෙන් වැළකීම ඔත්තප්ප නමින් ද හැඳින්වේ. තමා යහපත් සුසිරිත්වල යෙදීමෙන්ම සමාජයේ කීර්තිමත් අයෙකු වෙයි.

බුදු දහමෙහි හිරි ඔත්තප්ප යන දෙක ලෝක පාලක ධර්ම හෙවත් දේව ධර්ම නමින් ද හඳුන්වා ඇත. හිර ඔත්තප්ප ගුණ දෙකින් යුතු තැනැත්තා මිනිසුන් අතර සිටින දෙවියෙකු බඳු ය. කවර සමාජයක වුව ද කීර්ති ප්‍රශංසා ලැබීමට ලජ්ජාව සහ බිය බෙහෙවින් ඉවහල් වෙයි.

## 5. උගත්කම

සාර්ථක ජීවිතයක් ගොඩනඟා ගැනීමට උගත්කම වෙසෙසින් ම හේතු වේ. අතීතයේ උගතා ලෙස සලකන ලද්දේ බොහෝ දේ ඇසූ පුද්ගලයා ය. ඔහු බහුශ්‍රැත නමින් හැඳින් වී ය. නූතනයේ උගත්කම ඇති කර ගැනීමට ඇසීම, පොතපත කියවීම, ලිවීම, බැලීම, පර්යේෂණය, නිරීක්ෂණය ආදී ක්‍රම භාවිත කරයි. මෙලෙස ධාරණය කර ගන්නා දැනුම තුළින් යහපත් ආකල්ප ඇතිවේ. යහපත් ආකල්ප තුළින් කුසලතා වර්ධනය වේ. නූතනය දැනුම සොයා යන යුගයකි. දිනෙන් දින නවීන විද්‍යාත්මක

සොයා ගැනීම් සිදු කරයි. ඒ කෙරෙහි අවධානය යොමු කළ යුතු ය. සෑම අයෙකු තුළම විචාර බුද්ධිය වෙසෙසින් ම තිබිය යුතු ය. උගත්කම ඥානවන්ත ලෙස පරිහරණයෙන් ජීවිතයේ උපරිම ඵල නෙලාගත හැකි ය.

## 6. පරිත්‍යාගය

තමන් සතු දෙයක් අනුන්ට දීම පරිත්‍යාගයයි. එය පූජා බුද්ධියෙන් හෝ අනුග්‍රාහක බුද්ධියෙන් සිදුකළ හැකි ය. තමන් සතු දෙයක් අන්‍යයන්ට දිය යුත්තේ ලෝභය, ද්වේශය, මෝහය යන අකුසල චේතනා තුන සිතින් යටපත් කිරීමෙනි. පරිත්‍යාගය, කරුණාව, මෛත්‍රිය, නුවණ, පරිත්‍යාගශීලී පුද්ගලයා ළඟ තිබිය යුතු ය. අප උපයන දෙයින් අනුන්ටත් කොටසක් දීම සත් පුරුෂ ලක්ෂණයකි. දුගී මගී යාචකාදීන්ගේ අසරණ නැතිබැරිකම් දෙස සානුකම්පිතව සිතා අනුග්‍රාහක බුද්ධියෙන් පරිත්‍යාග කළ හැකි ය. නොඑසේ නම් මහා සංඝ රත්නය ආදී උතුමන්ගේ ගුණ මහිමය සලකා පින් රැස්කර ගැනීමේ අරමුණින් පූජා බුද්ධියෙන් දන් පූජා කළ හැකි ය. එහි අනුසස් ඉමහත් ය. සත් පුරුෂයන්ගේ සත් ක්‍රියාවක් වන පරිත්‍යාගය පුරුදු පුහුණු කර ගැනීමෙන් මෙලොව පරලොව යහපත ද උදාවෙයි.

## 7. ප්‍රඥාව

අධ්‍යාපනය ලැබීම සහ තමා ජීවිතයේ දී ලබන අත්දැකීම් තුළින් ප්‍රඥාව දියුණු වේ. හොඳ නරක වටහාගෙන දුර දක්නා නුවණින් ක්‍රියා කිරීමෙන් තමන්ටත් අනුන්ටත් යහපත් සැලසෙයි. සෑම දෙයක් පිළිබඳවම ගැඹුරින් සිතා ක්‍රියා කිරීමෙන් විපත් ද දුරුවෙයි. තමන් යහපත දකින පුද්ගලයෙකු වී සෙසු අයට අවවාද

අනුශාසනා කිරීම තුළින් සෙසු අයගේ ජීවත ද අර්ථවත් වෙයි. බුදු දහමට අනුව චතුරාර්ය සත්‍ය අවබෝධ කර ගැනීමෙන් ලබන ප්‍රඥාව විමුක්තිය පිණිස හේතු වෙයි. සමාජ ඇසුර සහ විවිධ අත්දැකීම් තුළින් ලබන බුද්ධිය දෙලොව යහපතකට ද හේතු වේ.

මෙම උතුම් ගුණ ධර්ම හත ඔබේ ජීවිතයටත් හුරු පුරුදු කරගෙන සාර්ථක ජීවිතයක් ගොඩ නගා ගැනීමට ඔබත් උත්සාහවත් වන්න.

# 21

# බුදු දහමේ සැපවත් දිවියකට නිවැරදි සූදානම



මෙලොව වශයෙන් සැපවත් ජීවිතයක් ගත කිරීම සඳහාත් පරලොව යහපත් ආත්මයක් ලබා සැප සම්පත් විඳීමටත් සෑම මනුෂ්‍යයෙකුම කැමැති වේ. මේ සඳහා බුදුරජාණන් වහන්සේ මෙන්ම වෙනත් ආගමික

නායකයින් ද මග පෙන්වා ඇත. නමුත් වත්මන් මිනිස් සමාජය මේ මග නිවැරදිව හඳුනා නොගැනීම නිසා මිනිස් ජීවිත ඉතා අවසනාවන්ත තත්ත්වයට පත්වී ඇත.

මිනිසාගේ සතුට සැනසීම ඇත්තේ බොහෝ දුර ඈත නොව තමා ළගම ය. සතුට සැනසීම සොයා අප බොහෝ දුර යා යුතු නැත. වෙහෙස මහන්සි විය යුතු ද නැත. අප සිතේ පවතින, අපගේ දෑසට නොපෙනෙන රාගය, ද්වේශය, මෝහය යන අකුසල චේතනා තුන පිළිබව අපි මොහොතක් සිතා බලමු. මෙලොව ස්ත්‍රීන් හා පුරුෂයන් රාගය නිසා කෙතරම් දුෂ්චරිතවල්ට යොමු වෙනවා ද? සමාජ ආචාර ධර්ම සිඳබිඳ දා ආශාවන් පසුපස යාමෙන් තමාම මුළාවට පත්වෙයි. ලෙඩ රෝගයන්ට ගොදුරු වෙයි. සමාජයේ අපකීර්තියට පත්වෙයි. එම නිසා අපි රාගය දුරුකොට බුද්ධියෙන් කාම සැපයෙහි ආදීනව දෙස බලමු.

අප සිතේ ඇතිවන ද්වේශය නිසා අමනුෂ්‍යකම් සිතේ රජ කරයි. අනුන්නේ දියුණුව නුරුස්සයි. විවිධ දුෂ්චරිත වෙත සිත අයාලේ ගමන් කරයි. සිතෙහි තරහ ජනිත වූ විට තමා කරන කියන දෙය තමාම නොදනියි. දුෂ්චරිත ක්‍රියාවල නියුතු වී පසුව පසුතැවෙයි. එනිසා ද්වේශයෙන් තොරව කාරුණික හා මෛත්‍රී සිතින් කටයුතු කර සැනසීම ළඟා කර ගනිමු.

අපි සමාජයේ ජීවත් වීමේ දී අන්‍යයන් සමඟ සබඳතා ගොඩනගා ගැනීම අතිශයින් වැදගත් ය. රාගය, ද්වේශය, මෝහයෙන් තොරව අනුන් කෙරෙහි මෙත් සිත් පතුරවා ජීවත් වීමෙන් ප්‍රියශීලී බවට පත්වේ. නමුත්, බොහෝ දෙනා අනුන්ගේ දියුණුවට හා සැපතට ඊර්ෂ්‍යා කරමින් ජීවත්වන අයුරු දක්නට ඇත. එසේ අනුන්ගේ සැපතට

ඊර්ෂ්‍යා කිරීමෙන් අපට වන හානි වටහා ගැනීමෙන් එහි විපාක හා ආදීනව තේරුම් ගත හැකි අතර නිවැරදි දිවියක් ගත කිරීමට ද පෙලඹීමක් ඇතිවේ. මිනිස් ජීවිතය අර්ථවත් කර ගැනීම සඳහා හේතුවන කරුණු රැසක් අංගුත්තර නිකායේ කෝධන සූත්‍රයෙන් පැහැදිලි වේ. එනම්,

## 1. මිනිස් රූප ශෝභාව

මනුෂ්‍ය ආත්ම භවයක් ලැබූ සෑම අයෙකුම රූමත් වීමට කැමති වේ. අපි රූමත් වීමට නම් පළමුව අපගේ සිත රූමත් විය යුතු ය. සිත රූමත් වීම යනු කරුණාව, මෛත්‍රිය හා ඉවසීම සිත තුළ තිබීමයි. පෙර ආත්මවල පැවති සිතිවිලි මේ ආත්මයේ තම ශරීර ශෝභාවට හා දියුණුවට හේතු වෙයි. රූමත් අයෙකු දෙස බලා අප ඔහු කෙරෙහි ඊර්ෂ්‍යාවෙන් මොහු විරූපී වේවා ආදී වශයෙන් අන්‍යයන්ගේ රූමත් බවට ශාප කළ විට එහි විපාක වශයෙන් පසු ආත්මයේදී ඔහු විරූපී පුද්ගලයෙකු බවට පත්වෙයි. එම නිසා තමන්ට වඩා රූමත් අයට වෛරය ක්‍රෝධය දැක්වීම කිසි විටෙකත් නොකළ යුතු ය.

ස්ත්‍රියක හෝ පුරුෂයෙකු මුහුණෙන්, කෙස් කළඹින්, ශරීර වර්ණයෙන්, ඇස්වලින් ආදී ශරීර අවයවවලින් අනෙක් අයට වඩා දැකුම් කළු වීම පෙර ආත්මයේ කරන ලද කුසලයක ප්‍රතිඵලයක් විය හැකි ය. ඔහු දෙස අනෙක් අය බැලිය යුත්තේ ඉවසීම හා මෛත්‍රිය පෙරදැරිවය. තමන් ද එබඳු තත්ත්වයකට පත්වීමට කැමති නම් රූමත් අයට වෛර නොකළ යුතු ය. කිසි විටෙක කවර හේතුවක් නිසා වත් ශාප කිරීම ද නොකළ යුතු ය. වෛරය, ඊර්ෂ්‍යාව, අප දෙලොවම අවාසනාවට පත් කරවන දුර්ගුණ දෙකකි. උසස් වූ රූප ශෝභාවක් ඇති කර

ගැනීමට ඔබ පවිත්‍ර වූ සිතැතිව මෛත්‍රියෙන් හා කරුණාවෙන් ක්‍රියා කළ යුතු ය.

## 2. සුවසේ නින්දයාම

සැපවත් ජීවිතයක තිබෙන සුවිශේෂ ලක්ෂණයක් ලෙස සුවසේ නිදා ගැනීම හැඳින්විය හැකි ය. ඇතැමුන් මහ මැදුරුවල ජීවත් වුව ද රාත්‍රියට නින්ද නොයයි. විවිධ දේ කල්පනා කරමින් කල්පනා ලෝකවල පසුදා පහන් වන තුරු කල් ගෙවති. රාත්‍රියට නිදි වැරීමෙන් කායික හා මානසික දුර්වලතා හා ලෙඩ රෝග ඇතිවේ. කය වෙහෙසා ක්‍රියා කිරීමට නොහැකි වෙයි. රෑ නින්දට ගිය විට අතීත සිදුවීම් සිහිපත් නොකළ යුතු ය. එමෙන්ම අනුන්ට වෛර කිරීමේ සිතිවිලි ද නිදි යහනේ දී ඇතිකර නොගත යුතු ය. අනෙකාගේ දියුණුව විනාශ කිරීමට කල්පනා කරන්නාගේ දියුණුව බිඳ වැටෙයි. එනිසා නිදි යහනට ගිය විට සියල්ල අමතක කොට තෙරුවන් සිහි කිරීමෙන් සුවදායී නින්දක් ලැබේ.

ඇතැමුන් නිදා ගැනීමට ඇඳ ඇතිරිලි කොට්ට මෙට්ට දමා තම යහන සුවපහසු ලෙස සකස් කර ගනී. උඩු වියන් බැඳ අලංකාර ලෙස යහන සකස් කර ගනී. එහි නිදා ගැනීමට ගිය විට යටි සිතේ ඇති රාග, ද්වේශ, මෝහාදී පව්ටු සිතිවිලි ඉස්මතු කරගනී. ඒ තුළින් තමාට සුව නින්දක් නොලැබේ. මෙය වටහාගෙන පව්ටු අදහස් උදහස් සිතින් ඈත් කොට නිදියහනේ දී මෙත් සිතින් තෙරුවන් සිහිකොට සුව නින්දක් තුළින් මෙලොව ජීවිතය සැපවත් කර ගැනීමට උත්සාහ ගනිමු.

## 3. දැන උගත් බව

සමාජයේ ගෞරවනීය පුද්ගලයෙකු වීමට දන උගත් කම තිබිය යුතු ය. වැඩිහිටියන්ගේ අවවාද

අනුශාසනා පිළිගැනීම, පොතපත කියවීම හා බුද්ධිමත් චරිතවත් පුද්ගලයන් ආදර්ශයට ගෙන ක්‍රියා කිරීම තුළින් සමාජයේ දැන උගත් පුද්ගලයෙකු විය හැකි ය. අනුන්ගේ අධ්‍යාපනයට, උගත්කමට හා තනතුරුවලට නින්දා අපහාස හෝ ඊර්ෂ්‍යා කිරීමෙන් තමාට සමාජයේ උගත් බුද්ධිමත් පුද්ගලයෙකු විය නොහැකි ය. සමාජ අත්දැකීම් තුළින් පරිණත පුද්ගලයෙකු වීමට මෝහය හෙවත් අනුවණකම දුරින්ම දුරුකළ යුතු ය. මෝහය ඇතිවිට කිසි විටෙකත් උගත් පුද්ගලයෙකු විය නොහැකි ය. බුද්ධිමතුන්ට නින්දා අපහාස කරන, ඉගෙනුමට උත්සාහවත් නැති හා අනුන්ගේ උගත්කම නොඉවසන පුද්ගලයෝ අප සමාජයේ කොතෙක් සිටිත් ද? ඔවුන්ට කිසි දවසක සමාජයේ ගෞරවයට පත්විය නොහැකි යි. කුඩා කළ පටන් ගුරු දෙගුරු උපදෙස් පිළිපැදීම, පොත පත කියවීම, උගතුන්ගේ චරිත ආදර්ශයට ගැනීම ආදියෙන් ඔබත් උගත් අයෙකු වීමට උත්සාහ කරන්න.

## 4. ධන සම්පත් ඇතිවීම

මනුෂ්‍ය ජීවිතය සැපවත්කර ගැනීමට ධනය තිබිය යුතු ය. මිල මුදල්, ආහාර පාන, ඇඳුම් පැලඳුම්, ගෙවල් දොරවල්, වාහන, වතුපිටි ආදිය මෙලොව ජීවිතය සැපවත් කර ගැනීමට අතිශය හේතු වෙයි. එම ධනය උපයා ගැනීමට උත්සාහය ඉතා වැදගත් වේ. උත්සාහයෙන් තොරව කිසිදු ධනයක් උපයා ගත නොහැකිය. එනිසා දෑත දෙපයේ ශක්තියෙන් ශ්‍රමය යොදවා මහන්සි වී ධනය උපයා ගත යුතු ය. අනුන්ගේ ධනය දැක ඊර්ෂ්‍යා කිරීමෙන් තමන්ට ධනය ඇති නොවේ. එමෙන් ම අනුන් ඉපයූ ධනය යැදීම, සොරකම් කිරීම ආදියෙන් ද දියුණු විය නොහැකි ය. ස්වකීය උත්සාහයෙන් ධාර්මිකව ධනය

රැස්කොට තම සැපය පිණිස වියදම් කිරීමෙන් ධන සම්පත් තුළින් මෙලොව සැප සම්පත් සලසා ගත හැකි ය.

## 5. කීර්ති ප්‍රශංසා ලැබීම

අනුන්ගේ කීර්ති ප්‍රශංසාවට ලක්වීම ද මෙලොව ජීවිතයේ සැපයකි. අනුන්ට උදව් උපකාර කිරීම, යහපත් ගතිගුණ වලින් අනුන්ට වඩා උසස් වීම, විවිධ තරඟ වලින් ජය ලැබීම ආදියෙන් කීර්ති ප්‍රශංසා ලැබේ. ඇතැමුන් අනුන් කීර්ති ප්‍රශංසාවට පත්වීම නුරුස්සයි. තමන්ට එබඳු කීර්ති ප්‍රශංසා නොමැති වීමෙන් අනුන්ට ඊර්ෂ්‍යා ක්‍රෝධ කරයි. ඒ තුළින් තමා දූෂිත පුද්ගලයෙකු බවට පත්වෙයි. කීර්ති ප්‍රශංසා නොලබන්නා කීර්ති ප්‍රශංසා ලබා ගැනීමට උත්සාහ කළ යුතු ය. සෙසු අයගේ ඇගයීමට ලක්වන ක්‍රියා හඳුනාගෙන ඒ අනුව ක්‍රියා කළ යුතු ය. මෙලොව ජීවත් වන සෑම අයෙකු ම අනුන්ට උදව් උපකාර කළ යුතු අතර සුවිශේෂ දක්ෂතාවන් ද ඇතිකර ගත යුතු ය. එවිට තමා ද කීර්ති ප්‍රශංසා ලබන්නෙකු බවට පත්වෙයි.

## 6. සමාජ සබඳතා

මෙලොව ජීවත් වීමේදී හුදෙකලාව ජීවත් විය නොහැකි ය. අන්‍යයන්ගේ උදව් උපකාර අවශ්‍යය. අනුන් සමඟ සුහදත්වය ගොඩනඟා ගැනීම එතරම් පහසු කාර්යයක් නොවේ. අන්‍යයන් සමඟ ගොඩනගා ගත් සබඳතා පවත්වාගෙන යාම ද පහසු කාර්යයක් නොවේ. එනිසා සමාජ සබඳතා පවත්වාගෙන යාමේ දී තමා ප්‍රියශීලී පුද්ගලයෙකු බවට පත්විය යුතු ය. අනුන්ට උදව් උපකාර කරන පරිත්‍යාගශීලී කාරුණික අයෙකු විය යුතු ය. යහපත් දේ සිතන යහපත් වචන කතා කරන හා යහපත් ක්‍රියාවෙහි නියුතු වීම සමාජ සබඳතා පැවැත්වීමේදී

අතිශය වැදගත් වේ. ඇතැම්හු අනුන් සමාජ සබඳතා පවත්වමින් ජීවත්වනු දුටු විට ඊට ඊර්ෂ්‍යා කරති. බොරු සහ කේලාම් කියා භේද කරති. ඉන් ඔවුන් අතර ගැටුම් ඇති වේ. නමුත් එහි විපාක වශයෙන් අනුන් බිඳ වූ පුද්ගලයා අවසානයේ සමාජයේ නින්දාවට පත්වෙයි. එනිසා මිත්‍රශීලී පුද්ගලයන් භේද කිරීම අසත්පුරුෂ, දුෂ්ට හා වසල ක්‍රියාවකි. මිත්‍රශීලී සමාජයේ ජීවත්වන පුද්ගලයන් ආදර්ශයට ගෙන තමා ද මිත්‍රශීලී සමාජ සබඳතා පවත්වන අයෙකු බවට පත්විය යුතු ය.


## 7. සුගතියට යාම

මෙලොව සැපවත් ජීවිතයක් ගත කරන පුද්ගලයා මියගොස් සැපවත් ආත්මයක් අපේක්ෂා කරයි. ලෝභය, ද්වේශය, මෝහය යන අකුසල සිතිවිලි දුරුකොට පරිත්‍යාගය, කරුණාව, මෛත්‍රිය, නුවණැති බව යන කුසල චේතනා ඇතිව දාන, සීල, භාවනා දී කුසල ධර්ම සිදු කිරීම යහපත් ආත්ම භවයක් ලැබීමට හේතු වේ. කිසි විටෙකත් අනුන්ගේ පරලොව ආත්මය දුගතිගාමී වේවා යි ප්‍රාර්ථනා නොකළ යුතු ය. අනුන් පින් දහම් කරමින් ජීවත් වනු දුටුවිට එය ආදර්ශයට ගෙන තමා ද සුගතියට යාමට පින් දහම් හි යෙදිය යුතු ය.

ඉහත දහම් කරුණු ආදර්ශයට ගෙන ක්‍රියා කොට ඔබත් ඔබේ මෙලොව පරලොව දිවිය සැපවත් කර ගන්න.

# 22

# බුදු දහමේ මිනිස් වගකීම් හා යුතුකම්



මිනිස් සමාජයක යහපැවැත්ම සඳහා උපකාරී වන්නේ එම මිනිස් සමාජය අනුගමනය කරන ආචාර ධර්මයි. ලොව පුරා විවිධ රටවල ජනයා අනුගමනය

කරන ආගමික සිරිත් විරිත් තුළින් සමාජයේ යහ පැවැත්ම ඇතිවෙයි. ලොව පුරා දේවවාදී මෙන්ම අදේවවාදී ආගම් රැසක් ඇත. සෑම ආගමික නායකයෙකුම මිනිස් සමාජයේ යහපත උදා කිරීමේ අපේක්ෂාවෙන් තම ඉගැන්වීම් ඉදිරිපත් කොට තිබේ. සමාජයේ යහපැවැත්ම උදෙසා ආගමික නායකයින් ඉදිරිපත් කොට ඇති ඉගැන්වීම් අතර බුදුරජාණන් වහන්සේ දේශනා කොට ඇති සූත්‍ර ධර්ම පිළිබඳ වත්මන් ලෝකයේ උගත්තු විශේෂ අවධානය යොමු කරති. අන්‍යෝන්‍ය සුහදත්වය හා විශ්වාසය තහවුරු කිරීම සඳහාත්, මිනිස් සමාජයේ යුතුකම් හා අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහාත් බුදුරදුන් දේශනා කොට ඇති සිඟාලෝවාද සූත්‍රයේ සඳහන් කරුණු නූතන සමාජයට වෙසෙසින්ම වැදගත් වෙයි.

සමාජයක දියුණුව උදා කිරීමේ දී රාජ්‍ය පාලක පක්ෂය මෙන්ම මහ ජනයා සතර අගතියෙන් වෙන්විය යුතුය. භෝග විනාශ මුඛවලින් ඈත් විය යුතු ය. ඡන්දය, ද්වේශය, මෝහය යන සතර අගතිය මිනිසාගේ සියලු හැකියා මොටකර නොමිනිසුන් බවට පත් කරයි. එමෙන්ම සුරාපානය, අවේලාවේ ගමන් බිමන් යාම, ගී නැටුම් සංදර්ශනවලට ලොල් වීම, සූදුව, පාපමිත්‍ර ඇසුර, අලසකම යන භෝග විනාශ මුඛ මිනිසාගේ සියලු සම්පත් විනාශ කොට මිනිසාගේ පරිහානිය උදා කරයි.

සමාජයේ ආචාරශීලී මිනිසෙකු වීමට නම් මෛත්‍රිය, කරුණාව, මුදිතාව, උපේක්ෂාව යන සතර බ්‍රහ්ම විහරණ ගුණයෙන් ක්‍රියා කළ යුතු ය. තව ද සමාජයේ ප්‍රියශීලී පුද්ගලයෙකු වීමට දානය, ප්‍රිය වචනය, අර්ථ චර්යාව, සමානාත්මතාවය යන සතර සංග්‍රහ වස්තු අනුගමනය කරමින් සමාජයේ සෙසු අය සමඟ සුහදශීලීව කටයුතු

කිරීමට වග බලා ගත යුතු ය. රාජ්‍ය පාලක පක්ෂය ද මේ අනුව ක්‍රියා කිරීමෙන් ජනතාවගේ හිතකාමී පිරිසක් බවට පත් වෙයි.

ආචාරශීලී සමාජයක් බිහිවීමේ දී අන්‍යෝන්‍ය විශ්වාසයෙන් කටයුතු කළ යුතු සමාජ සංස්ථා හයක් දක්වෙයි. එනම් මව්පිය දූදරු, ගුරු ශිෂ්‍ය, ස්වාමි භාර්යා, හිත මිතුරු, ස්වාමි සේවක, ගිහි පැවිදි යනුයි. මව්පියන් නැගෙනහිර දිශාව ලෙසද, ගුරුවරුන් දකුණු දිශාව ලෙස ද, ස්වාමි භාර්යාවන් බස්නාහිර දිශාව ලෙස ද, මිතුරන් උතුරු දිශාව ලෙස ද, ස්වාමි සේවකයන් යට දිශාව ලෙස ද, පැවිදි උතුමන් උඩ දිශාව ලෙස ද සිඟාලෝවාද සූත්‍රයේ හඳුන්වා දී ඇත.

පවුල් සංස්ථාවේ මූලික අඩිතාලම නැගෙනහිර දිශාව හෙවත් මව්පිය දූ දරු සබඳතාවයි. මව්පියන් දූ දරුවන්ට කරන නිවැරදි මඟ පෙන්වීම දූ දරුවන්ගේ අනාගත දිවිය සාර්ථක වීම සඳහා බෙහෙවින් බලපායි. බුද්ධ දේශනාව අනුව මව්පියෝ තම දරුවන් තම දෑස් මෙන් සිතා කටයුතු කරති. ඒ අනුව කුඩා කළ පටන් ම පාපයෙන් මුදවා යහපත් ක්‍රියාවල යොදවති. පාසල් හා දහම් පාසල් යවා මැනවින් ශිල්ප ශාස්ත්‍ර උගන්වති. නිසි වයසට පත්වූ පසු ආවාහ විවාහ කටයුතු කර දී තම සම්පත් දායාද ලෙස සමසේ බෙදා දෙති. උතුම් මව්පියෝ තම යුතුකම් හා වගකීම් නිසිලෙස ඉටුකොට ඒ අනුව දරුවන්ගේ අනාගත රැකවරණය සලසා දෙති.

මව්පියන්ගේ මඟ පෙන්වීම අනුව නිවැරදි මඟෙහි ගමන් කරන දූ දරුවෝ කිසි විටෙකත් මව් පියන් අමතක නොකරති. ඔවුහු මව්පියන් වයසට ගිය පසු පෝෂණය කිරීම, ඔවුන්ගේ අවශ්‍යතා සොයා බලා ඉටුකර දීම

මෙන්ම මව්පියන් පවත්වාගෙන ආ සිරිත් විරිත් ද නොපිරිහෙලා ඉටු කිරීමට වගබලා ගනිති. මව්පියන් කෙරෙහි අපිරිමිත සෙනෙහසකින් යුතු දරුවෝ තමන්ට පවරා දුන් දායාද නැති නාස්ති නොකර ආරක්ෂා කර ගන්නා අතර මව්පියන් මිය ගිය පසු අවසන් කටයුතු ගෞරවයෙන් සිදු කොට පින් අනුමෝදන් කිරීමටද අමතක නොකරති.

දැහැමි සමාජයක පවත්නා සබඳතා අතර ගුරු සිසු සබඳතාවය ද ප්‍රධාන වේ. කුඩා කල මව්පිය සෙවණේ ඇති දැඩිවන පුද්ගලයා දැනුම, ආකල්ප හා කුසලතා ලබාගෙන සමාජයේ පෙරට යාමට ශක්තිය ලබනුයේ ගුරුවරුන්ගෙනි. ඔවුහු සිසුන්ගේ ජීවිත අර්ථවත් කිරීම සඳහා ඉමහත් වෙහෙසක් දරති. හොඳ නරක කියාදී සිත, කය, වචනය යන තිදොර හික්මවා මැනවින් අධ්‍යාපනය ලබාදීම, සමාජයේ උසස් බුද්ධිමතුන් හඳුන්වා දී ඔවුන් ගිය මගෙහි යාමට මඟ පෙන්වීම, ශිෂ්‍ය ජීවිතයේ ආරක්ෂාව සලසා අනාගතය සුරක්ෂිත කිරීමට ගුරුවරු ප්‍රශංසනීය වූ මෙහෙවරක නියුතු වෙති.

ගුරුවරුන් තමන් වෙනුවෙන් කරන මෙහෙය ඇගයීම යහපත් ගුණගරුක සිසුන්ගේ යුතුකමකි. ගුරුවරයෙකු දුටුවිට හුනස්නෙන් නැඟිට ආචාර කිරීම හා උපස්ථාන කිරීම හොඳ ශිෂ්‍යයෙකුගේ චරිත ලක්ෂණ වේ. ගුරුවරයා උගන්වන දෙය හොඳින් අසා සිට මතකයේ රඳවා ගැන්මට ශිෂ්‍යා උත්සාහ දරයි. ඉගෙන ගත් දෙයින් තම චරිතය සංවර්ධනය කර ගැනීමට සිසුවා වලබලා ගත යුතු ය. ගුරු ගෞරවය වර්ධනය වීමට ද එය ප්‍රබල හේතුවකි. තමන්ට ඉගැන්වූ ගුරුවරුන්ට ගරු සරු දැක්වීම යහපත් සිසුන්ගේ චරිත ලක්ෂණයකි.

තරුණ වියට පත් වූ පසු ආවාහ විවාහ දිවියට ඇතුළු වී ජීවිතය සාර්ථක කර ගැනීමට බුදු දහමේ දක්වා ඇති උපදෙස් අතිශය වැදගත් ය. සැමියා තම භාර්යාවට නිතරු ගරු සැලකිලි දැක්විය යුතු අතර, කිසි විටෙකත් සිත රිදවන දේ නොකළ යුතු ය. තම බිරියට අවමන් කිරීම විවාහ දිවිය අසාර්ථක වීමට හේතු වේ. වෙනත් කාන්තාවන් සමඟ අනියම් ඇසුර ද විවාහ දිවිය දෙදරා යාමට බලපාන ප්‍රබල සාධකයකි. නිවසේ සියලු වගකීම් තම භාර්යාවට ලබාදිය යුතුවාක් මෙන්ම ඇය රුචි කරන මාල, වළලු, මුදු, කරාබු ආදී ආභරණ හා ඇඳුම් පැළඳුම් ගෙනවිත් දී සතුටු කළ යුතු ය. ඒ තුළින් ඇයගේ ආදරය සැලකිල්ල සැමියා වෙත ලබා ගැනීමට හැකියාව ලැබෙයි.

සැමියා භාර්යාව කෙරෙහි දක්වන ආදරය කරුණාව සෙනෙහස අනුව ම භාර්යාව ද සැමියා කෙරෙහි ආදරය සෙනෙහස දක්වයි. නිවසේ වැඩ මනාව ඉටු කරන ඇය නිවස අලංකාර ලෙස තබා ගනියි. සැමියාට හා සැමියාගේ නෑ හිත මිතුරන්ට ද සංග්‍රහ සැලකිලි දැක්වීමට මැලි නොවෙති. තම එකම පැතුම මෙන්ම විශ්වාසවන්තයා සැමියා ලෙස සිතන යහපත් බිරිඳ කිසිවිටෙකත් අන් පුරුෂයන් හා අනියම් සබඳතා ගොඩනගා නොගනීයි. කඩිසර ලෙස නිවසේ වැඩ කටයුතු සොයා බලා කරන ඇය නිවසේ සම්පත් මනාව ආරක්ෂා කරමින් කළමනාකරණය කරයි.

දැහැමි සමාජයක සැකෙන් බියෙන් තොරව සතුටින් ජීවත්වීම සඳහා මිත්‍රත්වය අතිශයින් ම වැදගත්වෙයි. යහපත් මිතුදමක් ගොඩනගා ගැනීමට නම් අනුන්ට පරිත්‍යාගශීලී වීම, ඔවුන් සමඟ ප්‍රිය මනාප වචන කතා කිරීම, අනුන්ගේ දියුණුවට වැඩ කිරීම, සියලු දෙනා

සමානත්වයෙන් සැලකීම, මිතුරන් කිසිවිටෙකත් නොරැවටීම යන ගුණාංග පැවතිය යුතුය. එබඳු තැනැත්තාට යහපත් මිතුරන් ඇතිවෙයි. මිතුරන්ගේ උදව් උපකාර නොඅඩුව ලැබෙයි. හැමවිටම තමාගේ ආරක්ෂාව සලසන මිතුරන් තම වස්තුව මෙන්ම දරු මුනුපුරන් ද ආරක්ෂා කරයි. විපතක් වූ විට කිසි කලෙකත් අත්හැර නොයන ඔවුන් බියක් වූ විට බිය දුරුකොට සතුට සැනසීම ගෙන දෙයි. එනිසා යහපත් මිතුරන් ඇසුර ජීවිතයේ සතුට සැනසීම පිණිසම හේතුවෙයි.

දැහැමි යුක්ති ගරුක සමාජයක් බිහි වීම සඳහා ස්වාමි සේවක යුතුකම් හෙවත් ආයතන ප්‍රධානීන්ගේ හා වැඩ කරන ජනතාවාගේ යුතුකම් හා වගකීම් නිසිලෙස ඉටුවිය යුතුය. ස්වාමියා හෙවත් ආයතන ප්‍රධානියා තමා යටතේ වැඩ කරන කම්කරු ජනතාවගේ අයිතිවාසිකම් ලබා දීමට ක්‍රියා කිරීමෙන් සේවය අර්ථවත්ව ලබා ගැනීමට හැකිවෙයි. හැකියාවෙන් හා දක්ෂතා අනුව වැඩ පැවරිය යුතු අතරම එම සේවය අගයා කලට වේලාවට වැටුප් ලබාදීම හා ප්‍රශංසා කිරීම කළ යුතුම ය. රෝගී වූ විට අවශ්‍ය ප්‍රතිකාර ගැනීම සඳහා ද උපකාර කළ යුතුය. ආහාර පාන වර්ග සේවකයන්ට බෙදා හදා දී ආයතන ප්‍රධානියා ද භුක්ති විඳිය යුතුය. ගතේ සිතේ සවි ශක්තිය අනුව වැඩ ලබා ගැනීමටත් සේවකයන් නිතර සතුටින් තබාගැනීමටත් ස්වාමියා සමත් විය යුතු ය. එමෙන්ම විශ්‍රාම වයසේ දී අනාගත ජීවිතයේ රැකවරණය සලසා දී සේවයෙන් විශ්‍රාම යැවීමට ද ක්‍රියා කළ යුතු ය.

සේවා ස්ථානයක ආයතන ප්‍රධානියා යටතේ සේවය කරන පිරිස ද වැටුපට සරිලන උසස් කාර්යක්ෂම සේවයක් ලබාදිය යුතු ය. කල් ඇතිව වැඩ අරඹා නියමිත වේලාව

අවසන් වනතුරු හොඳ සේවයක් ලබාදීමට ක්‍රියා කළ යුතු ය. සේවා ආයතනයේ ඇති උපකරණ ප්‍රධානියාට නොදන්වා ගැනීම සොරකමකි. එබඳු ක්‍රියා කිසි විටෙකත් නොකළ යුතු අතර තමාට අවශ්‍ය දෙයක් ගත යුත්තේ ආයතන ප්‍රධානියාට දන්වා ඔහුගේ අවසරය ඇතිවයි. සේවා ආයතනයේ හොඳින් වැඩ කිරීමත් ආයතන ප්‍රධානියා සමඟ සුහදශීලී සබඳතා ගොඩ නඟා ගැනීමත් අවශ්‍ය වේ. ඔහුගේ නුගුණ කිසි විටෙකත් ප්‍රසිද්ධියේ ප්‍රකාශ නොකළ යුතු අතර ඔහුගේ යහගුණ ප්‍රකාශ කරන අයෙකු බවට පත්විය යුතු ය. එවිට ස්වාමි සේවක සබඳතාවය තහවුරු වී ප්‍රියශීලී පරිසරයක් ගොඩනැගෙයි.

දැහැමි සමාජයක් බිහිවීම සඳහා ගිහි පැවිදි සබඳතාවය අතිශයින්ම හේතුවෙයි. සිත, කය, වචනය සංවරව තබාගෙන සමාජයේ ක්‍රියා කිරීමේදී පැවිදි සමාජයෙන් ලැබෙන උපදෙස් ඉතා වැදගත් ය. එනිසා ගිහි සමාජය පැවිදි සමාජය වෙනුවෙන් ඉටුවිය යුතු යුතුකම් හා වගකීම් හඳුනාගෙන ක්‍රියා කිරීමෙන් ජීවිතයේ යහපත් ප්‍රතිඵල ළඟා කර ගත හැකි ය. භික්ෂූන් සමඟ මෙත් සිතින් වැඩ කිරීම, මෛත්‍රී සහගත වචන කතා කිරීම, භික්ෂූන් වහන්සේලා කෙරෙහි මෙත් සිතිවිලි ඇතිකරගෙන ක්‍රියා කිරීම දැහැමි ගිහි සමාජයක යුතුකම් වේ. එමෙන්ම භික්ෂූන් වහන්සේලා සහභාගී කරගෙන තම නිවෙස්වල ආගමික කටයුතු ඉටු කිරීම, භික්ෂූන් වහන්සේලාට දාන මාන ආදියෙන් සංග්‍රහ කිරීම ආදී යුතුකම් ද ගිහි සමාජයෙන් ඉටුවිය යුතු ය.

පැවිදි සමාජය නිරතුරුවම ගිහි ජනයාගේ අභිවෘද්ධිය වෙනුවෙන් ක්‍රියා කරනු ලබයි. මුළු මහත් ජීවිතයම සමාජ සේවයටත් ශාසනික පැවැත්ම උදෙසාත් කැප කොට

ඇති උන් වහන්සේලාගේ ක්‍රියා කලාපය ප්‍රශංසනාත්මක ය. ගිහි ජනයා පාපයෙන් වළක්වා කුසල ක්‍රියාවල යෙදවීම, ගිහි ජනයාගේ යහපත උදෙසා යහපත් සිතින් ආශිර්වාද කිරීම, ධර්මය මැනවින් පහදා දී නිවැරදි මගෙහි හා වත් පිළිවෙතෙහි යෙදවීම, මෙලොව, පරලොව හා නිවන් සුවය සඳහා මඟ හෙළිකර දීම ආදී ක්‍රියාවලම නියුතු වන උන් වහන්සේලා නිතරම සමාජයේ යහපත ම ප්‍රාර්ථනා කරති.

බුදුරදුන් සිඟාලෝවාද සූත්‍රයේදී දේශනා කොට ඇති සමාජයේ යහ පැවැත්ම සඳහා ඉවහල්වන ඉහත දහම් කරුණු වටහාගෙන ඒ අනුව ක්‍රියා කොට මෙලොව ජීවිතය අර්ථවත් කර ගැනීමටත් පරලොව සැනසීම උදාකර ගැනීමටත් අපි උත්සාහ කරමු.

# 23

# බුදු දහම හා සමාජ සදාචාරය



මේ සමය ලෝ වැසි බෞද්ධයන්ට අතිශයින් ම වැදගත් ය. ලෝක සත්වයාගේ සැනසීම උදෙසා පන්සාලිස් වසක් දේශනා කළ ධර්මය පිළිබඳ අපගේ

අවධානය වැඩි වැඩියෙන් යොමුකළ යුතු යුගයකි මේ. අද සමාජයේ බොහෝ දෙනෙකු කෙරෙන් බෞද්ධ ගති පැවතුම්, ආචාර ධර්ම ඈත්ව ගොසිනි. දිනෙන් දිනම සමාජයේ සිදුවන දරුණු අපරාධයන් පිළිබඳ අසන්නට දකින්නට ලැබෙයි. මීට හේතුව බුදුරදුන් එදා දේශනා කළ ධර්මය පිළිබඳ අවබෝධයක් නොමැතිකමයි. රාගය, ද්වේශය, මෝහය ආදී පව්ටු සිතිවිලි නිසා මිනිසා දුරාචාරී බවට පත්ව ඇත. රාජ්‍ය පාලකයින්ට මෙන්ම ජනතාවටත් සුවසේ දැහැමින් සොම්නසේ ජීවත් වීමට නිවැරදි මඟක් බුදු දහමින් විග්‍රහ කෙරෙයි.

රටක සමාජයක සාරධර්ම විනාශ වන්නේ එරට වැසියන් ධර්මයෙන් ඈත්වූ විටය. ධර්මය ගැන නොසිතන්නෝ තිරිසනුන් සේ වල්මත් වෙති. තම මනුෂ්‍යත්වයේ වටිනාකම් තේරුම් නොගෙන විවිධ දුෂ්චරිතවල යෙදෙති. බුදුරදුන් ලොව පහළ වන විට මිනිසා මිථ්‍යා දෘෂ්ඨියෙහි වෙලී විවිධ දුෂ්චරිත ක්‍රියාවල නියුතු වෙමින් සිටියේ ය. රාජ්‍ය පාලකයින් මෙන් ජනතාවටත්, දෙමව්පියන්ටත්, දූ දරුවන්ටත් ධර්මානුකූල ජීවිතයක් සඳහා ආචාර ධර්ම ප්‍රතිපත්තියක් බුදුරදුන් විසින් හඳුන්වා දෙන ලදි. තම මනුෂ්‍යත්වය ආරක්ෂා කර ගැනීමටත් අන්‍යෝන්‍ය ගෞරවය හා සුහදත්වය ගොඩනඟා ගැනීම සඳහාත් බුදුරදුන් හඳුන්වා දුන් ප්‍රතිපදා මාර්ගය පංචශීල ප්‍රතිපදාවයි.

පංච ශීලය ආරක්ෂා කරන තාක් මිනිසාගේත් සමාජයේත් ප්‍රගතිය ආරක්ෂා වෙයි. පංචසීල ප්‍රතිපදා අමතක කොට යමෙකු ක්‍රියා කරන්නේ නම් එහි විපාක ඔහුට පමණක් නොව මුළු මහත් සමාජයටම විඳීමට

සිදුවේ. එම නිසා වත්මන් සමාජයට අවශ්‍ය වී ඇත්තේ පංචසීල ප්‍රතිපදාවයි. එය ආරක්ෂා කර ගැනීමට පුද්ගලයා ස්වයං පෙලඹීමකට පත්විය යුතු අතර එය සමාජයේ ස්ථාපිත කරවනු සඳහා වගකිව යුත්තන්ගේ අවධානය ද වෙසෙසින් ම අවශ්‍ය ය.

## 1. සත්ත්ව හිංසාවෙන් වැළකීම

සෑම පුද්ගලයෙකුම දඬුවමට අකැමැති ය. මරණයට බිය වේ. ලෝකවාසී සමස්ත සමූහයාගේ ස්වභාවය එබඳු ය. සියලු දෙනා ජීවත් වීමට කැමති හෙයින් එම අයිතිය සුරැකීමට වගබලා ගත යුතු ය. මෙහි සත්ව යනුවෙන් අදහස් වන්නේ තිරිසන් සතුන් පමණක් නොවේ. මනුෂ්‍යයා ද සත්වයෙක් ලෙස හැඳින්වේ. පුද්ගලයාට ඇතිවන වෛරය, ක්‍රෝධය, පළිගැනීම, මෝහ ආදී සිතිවිලි නිසා අනුන්ට හිංසා පීඩා කිරීමට පෙලඹෙයි. මනුෂ්‍ය ඝාතනය දක්වා දුර දිග යෑමට පුද්ගල වෛර චේතනාව හේතුවෙයි. තිරිසන් සතුන් හා මිනිසුන් අතර වෙනසක් ඇත. එනම්, මිනිසාට ඇති බුද්ධිය හා සිතීමේ හැකියාවයි. ගිහි පැවිදි දෙපක්ෂයටම සත්ව හිංසාව බලවත් අකුසල කර්මයකි. සතුන්ට හිංසා පීඩා කරන්නෝ තිරිසන් ආත්මවල උපදින බව බුදු දහමේ ඉගැන්වෙයි. පණ ඇති ගසක කොළයක් කැඩීම පවා උපසපන් භික්ෂුවකට පාපයක් සිදු වීමට හේතුවක් බව දේශනා කිරීමෙන් පැහැදිලි වන්නේ බුදු දහමේ ඇති ජීවී හිතානුකම්පාවයි. වත්මන් සමාජයේ මිනී මැරුම්, පහරදීම්, හිංසා පීඩා කිරීම් දිනෙන් දිනම ඉහළ යන බව අසන්නට දකින්නට ලැබෙයි. පුද්ගලයා ප්‍රාණ ඝාතයෙන් වැළකීමේ ශික්ෂා පදය මැනවින් ආරක්ෂා කරන්නේ නම් මෙවන් සිද්ධීන් අසන්නට දකින්නට නොලැබෙයි.

තුන් දොර අතරින් ප්‍රාණ ඝාතය අයත්වන්නේ කයින් සිදුවන අකුසල්වලටයි. ප්‍රාණඝාත අකුසලයක් සිදු වීමට කරුණු පහක් සම්පූර්ණ විය යුතුය. එනම් පණ ඇති සත්වයෙකු වීම, සත්වයෙකු බව හඳුනා ගැනීම, මරණ චේතනාව, මැරීමේ උපක්‍රමය, මරණය සිදුවීම යනුයි. ප්‍රාණඝාත කරන්නා මරණින් පසු දුගතියේ ඉපදීම, ලෙඩ රෝග බහුල වීම, අංගවිකලවීම ආදී විපාකයන්ට ද මුහුණ දෙයි. සමාජයක් වැනසෙන ප්‍රබල පාප කර්මයක් වන ප්‍රාණ ඝාතය පිළිකුල් හා නින්දා සහගතය. එම නිසා මිනිසා ඇතුළු සමස්ත සත්ව වර්ගයාගේ ජීවිත ආරක්‍ෂා කර ගැනීමටත්, සැමට මෙත් වැඩීමටත් හුරු පුරුදු විය යුතුය.

## 2. සොරකමින් වැළකීම.

ලද දෙයින් සතුටු නොවන පුද්ගලයා සොරකම් කිරීමට පෙලඹෙයි. සමාජයක ජීවත් වීමේදී විවිධ සම්පත් අවශ්‍ය වේ. අසීමිත ආශාව ඇත්තා සම්පත් ගොඩගසා ගනියි. අනුන්ගේ සම්පත් නොඉවසයි. වත්මන් සමාජයේ වංචා, දූෂණ, මංකොල්ලකෑම් පිළිබඳ දසතින්ම අසන්නට දකින්නට ලැබෙයි. අධාර්මික ලෙස අනුන්ගේ වස්තුව සොරකම් කොට යමෙක් දියුණු වන්නට උත්සාහ කරන්නේ ද එය තාවකාලික ය. දිගු කාලීන විපත්වලට මුහුණ පෑමට සිදුවෙයි. මෙලොව දී අනුන්ගේ වස්තුව සොරකම් කරන්නෝ පරලොව දී සම්පත් නැති තැන්වල දිළිඳු ආත්මවල උපත ලබයි. නැතිබැරි කම්වලින් යුතු අසරණ ජීවිත ගත කිරීමට සිදුවෙයි. අනුන් රවටා හෝ විවිධ ක්‍රම මගින් අනුන්ගේ ධනය තමා වෙත එක් රැස් කර ගැනීමට උත්සාහ කරයි ද ඔහු සිදු කරගනුයේ මහත් පාපයකි. සොරකම් කිරීමේ අනෙක් පැත්ත පරිත්‍යාගයයි.

සොරකම් කරන්නා දුගතියෙහි ද අනුන්ට පරිත්‍යාග කරන්නා සුගතියෙහි ද උපත ලබයි. අනුන්ගේ සම්පත් ආරක්ෂාකර දීම උතුම් මනුෂ්‍ය ගුණ දහමකි. සොරකමින් තොර පුද්ගලයා සියලු දෙනාගේ ම ප්‍රියතාවයට පත්වෙයි. සමාජයේ විශ්වාස වන්තයෙකි. එම නිසා මනුෂ්‍ය ආත්මයේ උපන් සෑම අයෙකු ම අනුන්ගේ සම්පත් සොරකම් කිරීමෙන් වැළකී සිටිය යුතු ය.

## 3. වැරදි කම්සැපයෙන් වැළකීම

මෙලොව ජීවත්වන මිනිසා කම්සුව විඳීමට කැමතිය. පසිඳුරන් ට ගොදුරුවන අරමුණු කරා යාම පෘථග්ජන ස්වභාවයයි. නමුත් අධික රාගයෙන් යුතු වූ විට මිනිසා උමතු වෙයි. ඒ තුළින් කාම දුෂ්චරිතයන්ට යොමු වෙයි. මෙලොව ජීවත්වන සෑම ගැහැනියකට ම මෙන්ම පිරිමියෙකු විවාහ ජීවිතය අනුමතය. නමුත් බුද්ධියට නොව හැඟීම්වලට ඉඩදී පුරුෂයන් කාන්තාවන් පසු පසත් කාන්තාවන් පුරුෂයන් පසුපසත් කාමාතුර හැඟීම් සපුරා ගැනීමට යති. එය සමාජ අසම්මතයකි. බුදුසමය එය ප්‍රතික්ෂේප කරයි. විවාහ වීමට පෙර හා පසුව අනාචාරයේ හැසිරීම සෑම පුරුෂයෙකු මෙන්ම කාන්තාවක විසින් ද නොකළ යුතු බවද බුදු දහමේ සඳහන් වෙයි. ලිංගික ඇසුර විවාහ ජීවිතයේ තම සහකාරිය හෝ සහකරු සමඟ පමණක් පැවැත්වීමෙන් සමාජ සදාචාරය සුරැකෙයි.

නූතන සමාජයේ වැරදි කාම සේවනය නිසා ඒඩ්ස් වැනි සමාජ රෝගයන් ද, විවිධ ආරවුල් හා කලකෝලාහල ද හටගෙන ඇති අතර ඇතැමුන් මුළු මහත් ජීවිතය පවා අවාසනාවන්ත කරගෙන ඇත. බුදුරදුන් පරාභව සූත්‍රයේ

දී තම භාර්යාවගෙන් තෘප්තිමත් නොවී වෙසඟනන් හා පරඹුවන් වෙත යාම පරිහානියට හේතුවක් බව දේශනා කොට ඇත. එමෙන්ම වසල සූත්‍රයේ දී වසලයෙකු වීමට එය හේතුවක් බව දේශනා කොට ඇත. වැරදි කාම සේවනය ගෘහ ජීවිතය අවුල් වීමට මෙන්ම සමාජ සංස්ථාවේ ම පරිහානියට ද හේතුවකි. එම නිසා යහපත් නිරෝගී ශිෂ්ට සම්පන්න සමාජ සංස්ථාවක් බිහි කිරීම සඳහා වැරදි කාමසේවන යෙන් වැළකීමට සැම අයෙකුම වගබලා ගත යුතු ය.

## 4. බොරු කීමෙන් වැළකීම

සමාජයක් සැනසීම හෝ වැනසීම සඳහා ප්‍රබල අවිය වචනයයි. වචනය යහපත් ලෙස යෙදවීමෙන් සමාජ ප්‍රගතිය ද අයහපත් ලෙස වචන යෙදවීමෙන් සමාජ විනාශය ද උදාවෙයි. සත්‍ය වචනය අමෘතය බඳු ය. ජීවිතය නමැති ගසේ රසවත් ඵලය ලෙසද යහපත් වචනය හැඳින්වේ. යමෙකු අනුන් රැවටීමට හෝ අනුන් විනාශ කිරීමට බොරු කියයි ද එය ඔහුගේ විනාශය පිණිසම හේතු වෙයි. බොරු, කේලාම්, හිස් වචන, පරුෂ වචන තුළින් අඬදබර, අසමගිය, කලකෝලාහල ඇති වෙයි. ඒ තුළින් සිදු වන්නේ සදාචාර පරිහානියයි. බොරු කියන පුද්ගලයාට කළ නොහැකි පාපයක් නැත.

බොරු කියන පුද්ගලයා සැමට අවිශ්වාසවන්තයෙකි. ඔහු සමාජයේ අවමානයට ලක්වෙයි. විහිළුවට හෝ කුඩා බොරුවක් කියමින් බොරු කීමට පුරුදුවන පුද්ගලයා පසුව මහා බොරුකාරයෙකු බවට පත්වෙයි. සමාජයක් නිවැරදි මඟට යොමු කිරීමට නම් බොරු කීමෙන් වැළකී සත්‍ය වචනම කතා කළ යුතු ය. බුදු දහම අනුව වචන භාවිතයේ දී සත්‍ය වචනයක් වීම, සුදුසු අවස්ථාවක දී

කතා කිරීම, අසන්නන්ට ප්‍රිය උපදවීම, අනුන්ට ප්‍රයෝජනවත් වීම, මෙත් සහගත සිතින් කතා කිරීම යන කරුණු සැලකිල්ලට ගත යුතු ය. වාචසික සංවරය නිවන් දැකීමට මෙන්ම දෙලොව දියුණුවට ද මඟක් වන හෙයින් සත්‍ය වචන භාවිතයට සෑම අයෙකුම වගබලා ගත යුතු ය.

## 5. සුරාපානයෙන් වැළකීම

මත්වතුර සහ මත්ද්‍රව්‍ය පානයෙන් මිනිසාගේ සිත මෙන්ම ශරීරය ද විකෘති වෙයි. මත්වතුර සහ මත්ද්‍රව්‍ය යනු රසායනික උත්තේජයකි. ඒ තුළින් ඉන්ද්‍රිය පද්ධතියට දැඩි බලපෑම් ඇතිව රෝගී බවට පත් වෙයි. එම නිසා සුරාපානය බුදු දහම සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කරයි. පුද්ගලයා මෙලොව පරලොව දෙලොවම පරිහානියට පත් කරවන අපාය මුඛයක් ලෙස මෙය සිඟාලෝවාද සූත්‍රයේ දක්වා ඇත. වත්මන් සමාජයේ විවිධ කලකෝලාහලවලට සහ දරුණු රෝගවලට හේතුව ද සුරාපානය බව සොයාගෙන ඇත. තම ආත්ම ගෞරවය සහ නිරෝගී බව කෙලෙසා ගන්නා මිනිසුන් ජීවිතයේ ආයු ශක්තිය ද මේ තුළින් නැතිකර ගනී. සුරාපානය සියලු දුෂ්චරිතවලට හේතුවක් බව බුදු දහමේ සඳහන් වේ. පිරිහීමට මෙන්ම වසල පුද්ගලයෙකු වීමට ද සුරාපානය හේතු වේ. විවිධ වූ ආර්ථික දුෂ්කරතාවන් ට මුහුණ දෙන ඔවුහු සමාජයේ නින්දා අපහාස මැද ජීවත් වෙති.


සුරාපානය නිසා ස්ත්‍රී දූෂණ, මිනී මැරුම්, මංකොල්ලකෑම්, මං පැහැරීම් ආදී දුෂ්චරිත ද ශීඝ්‍රයෙන් වැඩිවෙමින් ඇත. "අනුවණ පුද්ගලයෝ හලාහල විෂ බඳු වූ සුරාපානය කොට උම්මත්තකයන් වෙති. ලජ්ජා

නැත්තෝ වෙති. දිළිඳු වෙති. නොයෙක් ජාතිවල දුටුවන් අප්‍රිය කරන විරූපීව උපදිති. එමෙන්ම අසරණව මිය ගොස් අපායගාමී වෙති." යනුවෙන් බෞද්ධ විග්‍රහයේ දක්වෙයි. රටක සමාජයක සංස්කෘතිය මෙන්ම පුද්ගල ජීවිත ද විනාශය කරා යොමුවන මත්පැන් දුම්වැටි සහමුලින් ම විනාශ කර දැමිය යුතු ය.

සමාජ සංස්ථාව සුමඟට යොමු කරවීම සඳහා බුදුරදුන් පනවා වදාළ පංචසීල ශික්ෂාවන් ආරක්ෂා කිරීමට සෑම අයෙකුම වඩාත් උනන්දු විය යුතු ය. දැහැමි පුද්ගලයෙකු වන්නේ පංචසීලය ආරක්ෂා කර ගැනීමෙනි. පුද්ගලයා මෙන්ම සමස්ත සමාජයම ශිෂ්ට සම්පන්න බවට පත් කිරීමට පංච සීලයේ අගය වටහා ගත යුතු අතර පාලක පාලිත දෙපක්ෂයම ඒ අනුව ක්‍රියා කළ යුතුය. ඒ තුළින් අප්‍රමාදය නිසා මහත් භවභෝග සම්පත් ලැබීම, කීර්ති ප්‍රශංසා ලැබීම, විශාරද පුද්ගලයෙකු ලෙස නොබියව සමාජයට මුහුණ දීමේ හැකියාව, සිහිමුළානොවී හොඳ සිහියෙන් මියයාම, මිය ගොස් සුගතියේ උපත ලැබීම යන ආනිශංස ද පුද්ගලයාට ලැබීමට හැකියාව ලැබෙයි.

# 24

# බුදු දහම හා හෙට දවස



බුදුරජාණන් වහන්සේ තෙවරක්ම ලංකාවට වැඩම කළ සේක. අනුබුදු මිහිඳු මා හිමියන් ද වැඩම කළ සේක. ඒ තුළින් ලංකාව ධර්මද්වීපයක් බවට පත්විය. ලක්වැසියෝ බුදු දහමට අනුව කටයුතු කරන්නට වූහ.

සියවස් ගණනක් මෙසේ බුදු දහමට අනුව ක්‍රියාකළ ලක්වැසියෝ මෑත යුගයේ වෙනත් මඟක ගමන් කරන බවක් පෙනෙන්නට ඇත. ඒ සියලු බෞද්ධයන්ම නොවේ. එක්තරා පිරිසකි. විවෘත ආර්ථික ප්‍රතිපත්ති සමඟ මෙරටට ඇතුළුව ඇති අන්‍යාගම් ව්‍යාප්ත කරන්නෝ දිළිඳු ග්‍රාමීය ප්‍රදේශවල ජනතාවට ආහාර පාන ප්‍රදානය කරමින් එම ආගමික සංකල්ප ජනතාව අතරට ගෙන යමින් සිටිති. තම ආර්ථික දිළිඳු භාවය හමුවේ ග්‍රාමීය ජනතාව බුදු දහම අත්හැර එම ආගම් වැලඳ ගැනීමේ තත්ත්වයක් පවතී. යම් මිනිසෙකු ආගමක් ඇදහිය යුත්තේ තම බුද්ධියට එකඟවය. එසේ නොවී විවිධ පරිත්‍යාග නිසා නොවේ. බුදුරදුන්ගේ ධර්මය ඇසූ විවිධ පිරිස් එදා තෙරුවන් සරණ ගියහ. එහිදී බුදුරදුන් ඔවුන්ට ආහාරපාන පිරිනැමුවේ නැත. ජනතාවගේ බුද්ධියට කතා කොට බුද්ධියේ නිම්වළළු පුළුල් කළහ. නැතිබැරි ජනතාවට ආහාර පාන ආදී දෙයින් උදව් උපකාර කිරීම යහපත් ක්‍රියාවකි. එය අප අගය කළ යුතුය. නමුත් ඒ සමඟ ආගමක් ව්‍යාප්ත කිරීම නිවට ක්‍රියාවකි.

ලාංකීය බෞද්ධයාගේ ජීවිතය සකස් වී ඇත්තේ ගිහි පැවිදි සබඳතාව තුළිනි. ගමේ පන්සල මිනිස් සිත් සනසන තෝතැන්නයි. බෝමළුව, චෛත්‍ය මළුව මිනිසාගේ නෙත් සිත් ප්‍රබෝධමත් කරවයි. සම්බුද්ධ ප්‍රතිමාව සිත් තුළට බුද්ධාලම්භන ප්‍රීතිය ගෙන දෙයි. ගැමියන් මුහුණ දෙන ගැටලුවලට විසඳුම් ලබා දීමට ගමේ පන්සලේ යතිවරු නිරතුරුව ක්‍රියා කළහ. ගමේ දරුවෝ එදත් අදත් පන්සලේ දහම් පාසල තුළින් ධර්මාවබෝධය ලබා ගනිති. ගැටලුවලින් ආකූල මිනිස් සමාජයේ එම ගැටලු විසඳීමට බුදු දහම වෙසෙසින්ම

උපකාරී වෙයි. බෝධි පූජාව, පිරිත් දේශනාව, ධර්ම දේශනාව, දානය, පාංශු කූලය ආදී ආගමික කටයුතු මගින් මිනිසාගේ මෙලොව පරලොව සැනසීම උදාකර ලීමට ගමේ පන්සල සිදු කරන මෙහෙය එදත් අදත් එලෙසම සිදුවෙයි. නමුත් බෞද්ධ ආගමික වත්පිළිවෙත් අද නවීකරණයට ලක් වී තිබීම කනගාටුදායක ය. මිනිසා තුළින් තෙරුවනට ඇති ශ්‍රද්ධාව පළුදු වීමට එය ප්‍රබල හේතුවක් වී ඇත. මේ පිළිබඳ ආගමික නායකයින්ගේ අවධානය යොමු විය යුතු ය. එසේ නොවුවහොත් සසුනේ පරිහානිය සහ බෞද්ධ සමාජයේ පරිහානිය මෑතක දී ම සිදුවනු ඇත.

බුදු දහමේ ව්‍යාප්තිය උදෙසා මාධ්‍යවලින් සුවිශේෂ මෙහෙයක් සිදුවෙයි. එදා බුදුරදුන් බුදු දහම ජනතාව අතරට ගෙනගියේ පා ගමනින් ගොස් මිනිසුන් හමුවී ධර්ම දේශනා පැවැත්වීමෙනි. එමෙන්ම තම ශ්‍රාවක පිරිස විවිධ ප්‍රදේශවලට වැඩම කොට දහම් දෙසීමෙනි. නමුත් නූතන යුගයේ ඊට වඩා ක්‍රම ශිල්ප උපයෝගී කරගත හැකි ය. විද්‍යුත් මාධ්‍ය හා මුද්‍රිත මාධ්‍ය රැසක් අද ලොව පුරා සහ ලංකාවේ පවතී. බොහෝ මාධ්‍ය මගින් සිදු කරනුයේ මිනිස් මනස සුමඟට යොමු කිරීම නොව මනස විකෘති කිරීමයි. ලංකාවේ මුද්‍රිත මාධ්‍ය අතරින් පුවත්පත් හා සඟරා කිහිපයක් හැරෙන්නට සෙසු මුද්‍රිත මාධ්‍ය සිදු කරනුයේ මිනිසුන්ගේ පහත් හැඟීම් ඉස්මතු කොට වැරදි මාර්ගවල ගමන් කරවීමයි. මේ පිළිබඳ වගකිව යුත්තන්ගේ අවධානය යොමු විය යුතු අතර දූෂිත පුවත්පත්, සඟරා ආදිය නීති මගින් තහනම් කළ යුතු ය. විද්‍යුත් මාධ්‍ය අතරින් කිහිපයක් හැරුණු විට සෙසු විද්‍යුත් මාධ්‍ය ආගමික හැදියාව විනාශවන ලෙසින්

ක්‍රියා කරන බව පෙනේ. ඇතැම් රූපවාහිනී නාලිකා සහ ගුවන් විදුලි සේවා ද වීඩියෝ පට, නාට්‍ය, චිත්‍රපට හා කැසට් පට ද අද බොහෝ සෙයින් සිදු කරනුයේ මිනිස් මනස විකෘති කිරීම නොවේ ද? ශ්‍රී ලාංකීය අනන්‍යතාව මෙසේ ඇතැම් මාධ්‍ය නිසා විනාශ වන්නේ නම් අනාගත පරපුරට අප දෙන දායාදය කුමක් ද?

අද ලෝකයේ බොහෝ රටවල ජනතාව බුදු දහම පිළිබඳ විශේෂ අවධානය යොමු කොට ඇත. ලෝකයේ රටවල් තිහකට අධික සංඛ්‍යාවක අද බුදුදහම ව්‍යාප්තව ඇත. ලක්වැසියන්ට වඩා විදේශකයෝ ශීඝ්‍ර ලෙස බුදු දහම වැලඳ ගැනීමට පෙලඹී ඇත. මහායාන, ථෙරවාද, තන්ත්‍රයාන, වජ්‍රයාන ලෙස සම්ප්‍රදාය කිහිපයක් ඔස්සේ ලෝකයේ බුදු දහම ව්‍යාප්ත වෙයි. ලාංකීය බෞද්ධයාත් විදෙස් බෞද්ධයාත් අතර පැහැදිලි වෙනසක් ඇත. එනම්, ලංකාවේ බෞද්ධයන්ට වඩා විදේශිකයෝ තෙරුවනට ඉමහත් ගරුසරු දක්වීමයි. ඇතැම් රටවල ජනතාව මුළු මහත් ජීවිතයම බුදු දහම බවට පත්කරගෙන ඇත. නිරතුරුව ඔවුන් තෙරුවනට කරන වැඳුම් පිදුම් නිසා ආර්ථික වශයෙන් ද ශක්තිමත් වී ඇත. පෙර ලෝ වැසියෝ ඔවුන්ගේ රටවල් සංවර්ධනය කර ගැනීමටත් තම ජීවිත නිවැරදිව හැඩගස්වා ගැනීමටත් ලංකාව ආදර්ශයට ගත් නමුදු නූතනයේ සිදුව ඇත්තේ ඔවුන්ගේ රටවල් අපට ආදර්ශයට ගෙන ක්‍රියා කිරීමයි. ලංකාවට වඩා ඔවුන් සංවර්ධනයෙන් ඉදිරියට ගොස් ඇත. මේ තත්ත්වය ලක්වැසියන් වන අප වටහා ගත යුතු ය. එසේ වටහා ගෙන ලක්වැසියා තුළ පවතින විවිධ අඩුපාඩු නිවැරදි කරගෙන ඉදිරියට යාමට සෑම අයෙකුම උත්සාහවන්ත විය යුතු ය. බුදු දහම ආදර්ශයට ගෙන සිත ශක්තිමත්


කරගත යුතු අතර ඒ ශක්තියෙන් මිනිස් සමාජය සහ රට ශක්තිමත් කිරීමට ක්‍රියා කළ යුතු ය.

ලංකාව තවමත් බෞද්ධ රටකි. නමුත් ඒ බෞද්ධ කමින් රට සංවර්ධනය කළ නොහැක්කේ විවෘත ආර්ථිකය නිසා මෙරටට ඇතුළත් වූ දූෂිත සංස්කෘතිය නිසයි. බුදු දහම මනුෂ්‍යත්වයට ප්‍රධානත්වය දී ඇති දහමකි. විවෘත අර්ථිකය මුදලට ප්‍රමුඛත්වය දී ඇත. මේ තත්ත්වය නිසා මිනිසා ට සිදුව ඇත්තේ මුදල් සෙවීමේ අරගලයක නියුතු වීමටයි. මිනිස් ඝාතන, සත්ව ඝාතන, සොරකම්, වංචා ඉහළ ගොස් ඇත්තේ මේ හේතුවෙනි. ගණිකා වෘත්තිය, අපචාර ක්‍රියා, මත්ද්‍රව්‍ය ජාවාරම්, මත්වතුර ආදිය අද රට පුරා ව්‍යාප්ත වී ඇත. මිනිසා මනුෂ්‍යත්වයෙන් ඈත් වී ඇත්තේ මේ නිසාය. මේ සමාජ පසු බිම වෙනස් කළ යුතුම ය. එසේ නොවී මනුෂ්‍යත්වය හෝ බෞද්ධකම ඉස්මතු කරගත නොහැකි ය. මුළු මහත් සමාජයම ජීවත්වීමේ තරඟයක නියුතු වෙමින් සිටී. රටේ පවතින දූෂණ වංචා නීති මගින් තහනම් කිරීමත් මත් ද්‍රව්‍ය, දුම්වැටි මෙරටට ගෙන්වීම නතර කිරීමත් කඩිනමින් කළ යුතු ය.

මෙරට බෞද්ධ හා මිනිස් සමාජයක් ගොඩ නැඟීම සඳහා අයුක්තියට, දූෂණයට හා නාස්තියට වැට බඳිමු. යහගුණ සිරිත් ජනතාවට පුරුදු කරමු. ධර්මයට අනුව ජීවත් වී මෙලොව සහ පරලොව සැනසෙමු.

# 25

# බුදු දහම හා ජීවිතාලෝකය



ලෝකවාසී සත්වයන් අතර වඩා ශ්‍රේෂ්ඨ සත්වයා වන්නේ මනුෂ්‍යයා ය. මිනිසාට තනිව ජීවත් වීමට

නොහැකි ය. සෙසු අයගේ උදව් උපකාර අවශ්‍ය ය. මව්පිය, දූ දරු, ගුරු සිසු, මිත්‍ර ආදී සබඳතා තුළින් මනුෂ්‍යත්වය ඔපවත් වේ. රටක් දියුණු කිරීමට හෝ රටක් වැනසීමට මිනිසාට හැකි ය. බුදු දහමින් ප්‍රබෝධමත් වූ මිනිස් සමාජයේ ප්‍රගතිය උදා කළ යුත්තේ මිනිසා ය. උසස් මනුෂ්‍යත්වයක් ගොඩනගා ගැනීමට අවශ්‍ය වන ආචාර ධර්ම අප හඳුනා ගත යුතු ය. ළමා වයස තුළදී පිළිපැදිය යුතු ආචාර ධර්ම නිසි ලෙස හඳුනා ගෙන ඒ අනුව කටයුතු කෙරේ නම් දැහැමි ළමා මනසක් ඇතිවෙයි. යහපත් තරුණ පරපුරක් බිහි වීමට ද එය මහා පිටුවහලකි.

තරුණ වයස යනු කායික හා මානසික ශක්තිය ඇති යුගයයි. එම යුගයේ දී දුෂ්චරිත ක්‍රියාවල නියුතු වන්නේ නම් මෙලොව ජීවිතය සැපවත් කරගත නොහැකි ය. සැඳෑ සමය ද පසුතැවිල්ලෙන් ගත කිරීමට සිදුවෙනු ඇත. එනිසා අප ජීවිතයේ විශිෂ්ට ඵල නෙළා ගැනීම සඳහා නව මං ඔස්සේ ගමන් කළ යුතු ය. අප සිතන ආකාරය නිවැරදි විය යුතු අතර ක්‍රියා ද නිවැරදි විය යුතු ය. වත්මන් සමාජය විවිධ ගැටලුවලට මුහුණ දී ඇත්තේ දහම් මඟ නිවැරදිව හඳුනා නොගැනීම නිසා ය.

අප උදෑසන අවදි වී මුව සෝදා පිවිතුරු මල් වට්ටියක් සකසා සැදැහැ සිතින් බුදුරජාණන් වහන්සේට පූජා කරනුයේ දහසක් ප්‍රාර්ථනා පෙරදැරි කරගෙනය. බුදුරදුන්ට පූජා කරන සුවඳ මල් සේ අපේ ජීවිතය ද සුවඳවත් කර ගතයුතු ය. ඒ සඳහා සුවඳ හමන සිතිවිලි අප සිත් තුළ ඇති කර ගත යුතු ය. බුදු සමිඳුන් ඉදිරියේ මෙන්ම බෝ මළුවේ හා සෑ මළුවේ දල්වෙන පහන්සිළු සේ අපේ ජීවිතය ද ආලෝකවත් කර ගැනීමට උතුම්

සම්බුදු දහමේ ආභාසය ලබාගත යුතු ය. අප දිවි මගේ ප්‍රඥා ප්‍රදීප දල්වාගෙන හමුවන සෑම අයෙකුගේම ජීවිත ද ඒ එළියෙන් ආලෝකමත් කිරීමට උත්සාහවත් විය යුතු ය.

සෑම මිනිසෙකුට ම තම ජීවිතය සුන්දර කරගත හැකි ය. බුදු කුටියේ දල්වා ඇති සුවඳ හඳුන්කූරුවලින් විහිදෙන සුවඳ දුමින් හාත්පස සුවඳවත් වන්නාසේ ම මිනිසා පවිත්‍ර සිතිවිලිවලින් යුතුව ක්‍රියා කරන විට ඔහුගෙන් අවට සමාජයට ද ගුණ සුවඳ ගලායයි. සමාජයට සුවඳ හමන ජීවිතයක් ගත කිරීමට මිනිසාට හැකි නම් ඔහු විශිෂ්ට මනුෂ්‍යයෙකි. බුදු දහම මනුෂ්‍ය ජීවිතය අවස්ථා කිහිපයකට බෙදා දක්වා ඇත.

**මන්දා කිඩ්ඩා ච නණ්ණාව**
**බලා පඤ්ඤාච හායනා**
**පබ්බාරෝ පචංකා ච**
**මෝහ මූහා සයනා දස**

යන ජීවිතයේ අවස්ථා පිළිබඳ අපගේ අවධානය වෙසෙසින් ම යොමු විය යුතු ය. "මන්දා" යනු මුල් අවුරුදු දහයයි. එම යුගය වෙසෙසින්ම මව්පිය තුරුලෙහි ඇති දැඩි විය යුතු ය. මව්පිය රැකවරණය ලැබිය යුතු අතර යහපත් පුරුදු ඇති කළ යුතු ය. ජීවිතයේ ශක්තිමත් අත්තිවාරම දැමිය යුත්තේ මේ යුගයේ දී ය. "කිඩ්ඩා" යනු අවුරුදු දහයේ සිට විස්ස දක්වා වූ ක්‍රීඩා දසකයයි. ක්‍රීඩා දශකය ක්‍රීඩාවට පමණක් යොමුවිය යුතු කාලය නොවේ. අධ්‍යාපන කටයුතු සාර්ථක කර ගැනීමසඳහා වෙසෙසින් ම උනන්දු විය යුතු ය. අධ්‍යාපන කටයුතුවලට උනන්දු නොවීම අනාගතය අඳුරු වීමට ද හේතු වේ. වයස

අවුරුදු විස්ස සිට තිහ දක්වා යුගය උසස් අධ්‍යාපනය හරහා සමාජයට පිවිසෙන කාලයයි. අධ්‍යාපනය තුළින් රැකියාවක් ලබාගෙන විවාහ ජීවිතයටත් ඒ තුළින් තම දිවි පෙවෙත රක්ෂා කර ගැනීමට උනන්දු විය යුතු ය.

පුද්ගල ජීවිතයක වයස අවුරුදු තිහ සිට හතලිහ දක්වා යුගය බල දශකය ලෙස හැඳින්වෙයි. බුද්ධිය මෙහෙයවා කටයුතු කළ යුතු යුගයකි. ආවේගශීලී බවින් තොරව විමසුම් නුවණින් කටයුතු කළ යුතු සේම සෙසු අයට ආදර්ශවත් ලෙස තම චරිතය ගොඩනගා ගත යුතුය. වයස අවුරුදු හතලිහ සිට පනහ දක්වා යුගය ප්‍රඥා දශකය නමින් හඳුන්වයි. පිරුණු අත්දැකීම් රැසකින් යුතු වූ මේ යුගය පරිණත බුද්ධියෙන් යුතුව ක්‍රියා කළ යුතු ය. සමාජය තුළ ජීවත්වන සෙසු අයට යහපත් ආදර්ශ ලබා දීමට මෙය හොඳම යුගය ලෙස දැක්විය හැකි ය.

ජීවිතයක අවුරුදු පණහ සිට හැට දක්වා යුගය ද විශේෂ යුගයකි. ජීවිතයේ එක්තරා සන්ධිස්ථානයකි. රැකීරක්ෂාවලින් විශ්‍රාම ගෙන නිදහස් නිවහල් ලෙස ජීවත්වීමට මිනිසා යොමු විය යුතු ය. ශරීරයේ විවිධ ආබාධ ඉස්මතු වන්නේ මේ යුගයේ දී ය. ඒ නිසා නව සැලසුම් ආරම්භ කිරීමට සුදුසු කාලය නොවේ. එනිසා නුවණින් විමසා බලා ක්‍රියා කළ යුතු යුගයකි. හැට සිට හැත්තෑව දක්වා යුගය විවිධ කායික රෝගාබාධයන්ට ගොදුරුවන සමයකි. ශරීර ශක්තිය දුර්වලවීමට පටන් ගනී. ආගම දහමට වඩාත්ම ලැදියාවෙන් ක්‍රියා කළ යුතු ය. හැත්තෑව සිට අසූව දක්වා ජීවත්වීමේ දී එම දුර්වලතා තවත් වර්ධනය වෙයි. තම ශරීරයේ පෝෂණය ද අපහසු


වෙයි. ජීවිතයේ යථාර්ථය තව දුරටත් මේ යුගයේ අවබෝධ වනු ඇත. අවුරුදු අසූව සිට අනූව දක්වා ජීවත්වන්නෝ තව දුරටත් වඩාත් කායික හා මානසික අපහසුතා විඳිති. මෝහ මූලික දශකය ලෙස මේ යුගය හඳුන්වයි. අමතක වීම හා සිහිමුලාවීම මෙම යුගයේ ලක්ෂණය වන අතර ළදරුවන් සේ කටයුතු කරයි. දූ දරුවන්ගේ උදව් උපකාර ඇතිව කායික පීඩා මැද ජීවත් වීමට සිදුවෙයි. අනූව සිට සියය දක්වා කාල සීමාව සයන දශකය ලෙස නම් කර ඇත. නැගිටීමට පවා නොහැකි ලෙස කායික පීඩාවන් ඇතිවෙයි. විවිධ රෝගවලට ගොදුරු වෙයි. ජීවිතයේ අවසානය ද මේ සමඟම සිදුවෙයි.

මේ අනුව පුද්ගලයෙකුගේ ජීවිතය කවර ලෙසකින් ගත කිරීමට සිදුවන්නේ ද යන වග මනාව පැහැදිලි වෙයි. බුදුරදුන් දේශනා කළ උතුම් ධර්මයට අනුව අපගේ ජීවිතය සාර්ථක කර ගන්නේ නම්, ජීවිතයේ කවර අභියෝගයකට වුව ද සාර්ථකව මුහුණ දිය හැකි ය. කායික හා මානසික ශක්තියේ ඇති සමයේ දී අප කුසල ධර්මයන්ට යොමු විය යුතු ය. කායික ශක්තිය දුර්වල වූ පසු තමා කළ කුසල් පිළිබඳව සිතමින් සතුටු විය හැක්කේ එවිටයි. බුදුරදුන් දෙසූ ලෙසින් අනිත්‍ය - දුක්ඛ - අනාත්ම යන ත්‍රි ලක්ෂණය වටහාගෙන තම ජීවිතයේ හමුවන බාධාවලට මුහුණ දීමට අප ශක්තිමත්ව සිටිය යුතු ය.

මිනිසාගේ දියුණුව හා පරිහානිය රැඳී පවත්නේ ඔහුගේ සිතුම් පැතුම් අනුවයි. දියුණු කළ හැකි සිතක් ඇති මිනිසා ධනාත්මක ආකල්පයෙන් යුතුව ක්‍රියා කරන්නේ නම් මෙලොව ශ්‍රේෂ්ඨත්වයට පත්විය හැකි ය. මනුෂ්‍ය ගුණ ධර්ම තම හදවතේ දරාගෙන පිවිතුරු

හැඟුමින් කටයුතු කරන්නේ නම් සමාජයේ ප්‍රියශීලී පුද්ගලයෙකු බවට පත්වෙයි. එමනිසා දැහැමි ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය උපදෙස් බුදු දහමෙහි මැනවින් විග්‍රහ කෙරෙන අතර ඒ අනුව බෝමළුවේ අඳුර නසමින් දැල්වෙන පහන් වැටක් සේ අපේ ජීවිත ද ආලෝකවත් කරගෙන සමාජයට ආලෝකයක් වීමට උත්සාහ දරමු.

# නූතන සමාජයට බෞද්ධ සංකල්ප



## පූජ්‍ය විතාරන්දෙණියේ වජිරවංස හිමි

හම්බන්තොට සිංහගිරි විහාරයේ විහාරාධිපති, සූරියවැව ජාතික පාසලේ ආචාර්ය, ශාස්ත්‍රපති පූජ්‍ය විතාරන්දෙණියේ වජිරවංස හිමියන්ගේ නවතම කෘතිය නූතන සමාජයට බෞද්ධ සංකල්ප නම් වූ මෙම කෘතියයි. සුසුමක අසිරිය නම් වූ කාව්‍ය හා ගී පද සංග්‍රහයෙන් ග්‍රන්ථකරණයට පිවිසි උන්වහන්සේ 'දම්රස කතා' 'බුද්ධ ශ්‍රාවක චරිත' 'දිවිමග සනසන අමා දහම' 'රුහුණේ ධර්ම දේශනා' ආදී කෘති රැසක් මේ වන විට එළි දක්වා ඇත.

දිවයිනේ ග්‍රාමීය ප්‍රදේශ මෙන්ම නාගරික ප්‍රදේශ පිළිබඳ පුළුල් අත්දැකීමකින් යුතු වජිරවංස හිමියෝ තායිලන්තය, සිංගප්පූරුව, ඉන්දියාව, නේපාලය, බුරුමය, මැලේසියාව ආදි විදෙස් රටවල සංචාරය කරමින් ශාස්ත්‍රීය පර්යේෂණවල ද නියුතු වී ඇත.

කැලණිය විශ්වවිද්‍යාලය, රුහුණු විශ්වවිද්‍යාලය, සාරිපුත්ත ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය, මහරගම ජාතික අධ්‍යාපන ආයතනය වැනි මෙරටේ උසස් අධ්‍යාපන ආයතනවලින් උපාධි හා ඩිප්ලෝමා පාඨමාලා හදාරා ඇති උන්වහන්සේ කාව්‍ය හා ගද්‍ය නිර්මාණවලින් සමස්ත ලංකා ජයග්‍රහණ රැසක් ද හිමිකරගෙන සිටිති. දිවයින, දිනමිණ, ලංකාදීප, ලක්බිම, බුදුසරණ, සිළුමිණ, මව්බිම ආදී ජාතික පුවත්පත්හි ලේඛකයෙක් මෙන්ම විවිධ නිර්මාණ ඉදිරිපත් කරන යතිවරයෙකු ලෙස ද හැඳින්විය හැකිය.

භාෂාව මැනවින් හැසිරවීමේ කුසලතාවත්, ගැඹුරු ධර්ම ශාස්ත්‍රීය දැනුමත්, නොපසුබට උත්සාහයත්, කැපවීමත් උන්වහන්සේ ලේඛන දිවිය සරු කර ගැනීමට බලවේග බවට පත්කරගෙන ඇත. බෞද්ධ දර්ශනික සංකල්ප අතිශය සරල සුගම ශෛලියකින් ඉදිරිපත් කර ඇති අතර බෞද්ධ දර්ශනය පිළිබඳ විවිධ දිශානති කෙරෙහි අවධානය යොමු කරමින් මිනිසා මුහුණ දෙන ගැටලු රැසකට බුදු දහම ලබාදෙන විසඳුම් නිර්මාණශීලීව කර්තෘ හිමියන් විසින් මෙහි විග්‍රහ කොට ඇත.

**ආචාර්ය කමල් වලේබොඩ**
අධ්‍යයන අංශාධිපති
ජනසන්නිවේදන අධ්‍යයන අංශය
කොළඹ විශ්වවිද්‍යාලය

"Wherever the Buddha's teachings have flourished,
either in cities or countrysides,
people would gain inconceivable benefits.
The land and people would be enveloped in peace.
The sun and moon will shine clear and bright.
Wind and rain would appear accordingly,
and there will be no disasters.
Nations would be prosperous
and there would be no use for soldiers or weapons.
People would abide by morality and accord with laws.
They would be courteous and humble,
and everyone would be content without injustices.
There would be no thefts or violence.
The strong would not dominate the weak
and everyone would get their fair share."

**※ THE BUDDHA SPEAKS OF
THE INFINITE LIFE SUTRA OF
ADORNMENT, PURITY, EQUALITY
AND ENLIGHTENMENT OF**
*THE MAHAYANA SCHOOL ※*

With bad advisors forever left behind,
From paths of evil he departs for eternity,
Soon to see the Buddha of Limitless Light
And perfect Samantabhadra's Supreme Vows.

The supreme and endless blessings
of Samantabhadra's deeds,
I now universally transfer.
May every living being, drowning and adrift,
Soon return to the Pure Land of
Limitless Light!

~The Vows of Samantabhadra~

I vow that when my life approaches its end,
All obstructions will be swept away;
I will see Amitabha Buddha,
And be born in His Western Pure Land of
Ultimate Bliss and Peace.

When reborn in the Western Pure Land,
I will perfect and completely fulfill
Without exception these Great Vows,
To delight and benefit all beings.

~The Vows of Samantabhadra
Avatamsaka Sutra~

# DEDICATION OF MERIT

May the merit and virtue
accrued from this work
adorn Amitabha Buddha's Pure Land,
repay the four great kindnesses above,
and relieve the suffering of
those on the three paths below.
May those who see or hear of these efforts
generate Bodhi-mind,
spend their lives devoted to the Buddha Dharma,
and finally be reborn together in
the Land of Ultimate Bliss.
Homage to Amita Buddha!

## NAMO AMITABHA

## 南無阿彌陀佛

【斯里蘭卡文：現代社會的佛教思想】

**財團法人佛陀教育基金會　印贈**

台北市杭州南路一段五十五號十一樓

Printed and donated for free distribution by

**The Corporate Body of the Buddha Educational Foundation**

11F., 55 Hang Chow South Road Sec 1, Taipei, Taiwan, R.O.C.
Tel: 886-2-23951198 , Fax: 886-2-23913415
Email: overseas@budaedu.org
Website:http://www.budaedu.org
Mobile Web: m.budaedu.org

**This book is strictly for free distribution, it is not to be sold.**

**නොමිලයේ බෙදාදීම පිණිසයි.**

Printed in Taiwan
2,000 copies; February 2016
SR066-13872